සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න**

1. ආර්ථික සම්පත් ප්‍රධාන කොටස් දෙකකට පහසුවෙන් ම වර්ගීකරණය කළ හැකි වනුයේ
   (1) ප්‍රාග්ධන සම්පත් සහ ස්වාභාවික සම්පත් වශයෙනි.
   (2) භූමිය සහ ප්‍රාග්ධනය වශයෙනි.
   (3) ස්වාභාවික සම්පත් සහ මානව සම්පත් වශයෙනි.
   (4) දේපළ සම්පත් සහ මානව සම්පත් වශයෙනි.
   (5) ශ්‍රමය සහ ව්‍යවසායකත්වය වශයෙනි.

2. ආර්ථික විද්‍යාවේ විග්‍රහ කරන ආකාරයට අවශ්‍යතා සහ වුවමනා අතර මූලික වෙනස කවරක් ද?
   (1) අවශ්‍යතා දිවි රැකගැනීමට අත්‍යවශ්‍ය වන අතර වුවමනා වූ කලි හුදු කැමති දේවල් පමණි.
   (2) වුවමනා දිවි රැකගැනීමට අත්‍යවශ්‍ය වන අතර අවශ්‍යතා වූ කලි හුදු කැමති දේවල් පමණි.
   (3) ආර්ථික විද්‍යාව තුළ අවශ්‍යතා සහ වුවමනා සමානාර්ථයෙන් සැලකේ.
   (4) වුවමනා සීමිත සම්පත්වලින් තෘප්තිමත් කරගත හැකි අතර අවශ්‍යතා සීමිත සම්පත්වලින් තෘප්තිමත් කරගත හැකි නොවේ.
   (5) අවශ්‍යතා කාලයත් සමග වෙනස් වන අතර වුවමනා කාලයත් සමග වෙනස් නො වේ.

3. X සහ Y භාණ්ඩ දෙක පමණක් නිෂ්පාදනය කරන එක්තරා රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙහි ලක්ෂ්‍ය තුනක් පහත දැක්වේ.

| නිෂ්පාදන හැකියාවන් | X භාණ්ඩය | Y භාණ්ඩය |
|---|---|---|
| A | 3 | 0 |
| B | 2 | 3 |
| C | 0 | 9 |

   මෙම නිෂ්පාදන හැකියා දත්තවලට අනුව නිගමනය කළ හැකි වනුයේ,
   (1) මෙම රටෙහි සම්පත් සමජාතීය බව ය.
   (2) X භාණ්ඩයේ ඒකක 3ක් සහ Y භාණ්ඩයේ ඒකක 9ක් සහිත සංයෝජනය අත්කර ගත හැකි බව ය.
   (3) X භාණ්ඩයේ ඒකක 3ක් සහ Y භාණ්ඩයේ ඒකක 9ක් සහිත සංයෝජනය අත්කර ගැනීම සඳහා සියලු ම සම්පත් යොදා ගැනීම අවශ්‍ය නො වන බව ය.
   (4) Y භාණ්ඩයෙන් නිෂ්පාදනය කෙරෙන ඒකක ප්‍රමාණය වැඩි කරන විට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය වැඩි වන බව ය.
   (5) Y භාණ්ඩයෙන් නිෂ්පාදනය කෙරෙන ඒකක ප්‍රමාණය වැඩි කරන විට X භාණ්ඩය නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය අඩු වන බව ය.

4. ප්‍රාග්ධනයේ රාජ්‍ය හිමිකාරිත්වය සහ සම්පත් බෙදා වෙන්කිරීම සඳහා වෙළෙඳපොළ මත රඳා පැවැත්ම යන ලක්ෂණ සහිත ආර්ථික පද්ධතිය කවරක් වේ ද?
   (1) ධනේශ්වර ක්‍රමය
   (2) සමාජවාදය
   (3) සමාජ වෙළෙඳපොළ ආර්ථිකය
   (4) සමාජවාදී වෙළෙඳපොළ ආර්ථිකය
   (5) විධාන ආර්ථිකය

[දෙවැනි පිටුව බලන්න]

https://t.me/WM_Groups

5. පහත සඳහන් දෑ අතුරින් ඉල්ලුම් නිර්ණායකයක් නොවන්නේ කවරක් ද?
(1) ආදේශක භාණ්ඩයක මිල
(2) ලබන මාසයේ දී අදාළ භාණ්ඩයේ අපේක්ෂිත මිල
(3) අනුපූරක භාණ්ඩයක මිල
(4) අදාළ භාණ්ඩය නිෂ්පාදනය කිරීම සඳහා යොදා ගැනෙන යෙදවුමක මිල
(5) පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම


6. තරඟකාරී වෙළෙඳපොළක දොඩම් සඳහා ඇති ඉල්ලුම් සහ සැපයුම් වක්‍රවලට අදාළ සමීකරණ පිළිවෙළින් පහත දැක්වේ.

$$Q_D = 600 - 5P \qquad Q_S = -240 + 3P$$

මෙම වෙළෙඳපොළෙහි දොඩම් ගෙඩියක මිල රු. 100ක් ලෙස නියම කරනු ලැබුවහොත්
(1) ඒකක 40ක අධි ඉල්ලුමක් හටගනී.
(2) ඒකක 40ක අධි සැපයුමක් හටගනී.
(3) ඒකක 350ක අධි ඉල්ලුමක් හටගනී.
(4) ඒකක 350ක අධි සැපයුමක් හටගනී.
(5) සමතුලිත මිල සහ ප්‍රමාණය නො වෙනස් ව පවතී.

7. ඉල්ලුමත් සැපයුමත් දෙක ම එකවර වැඩිවුවහොත් එවිට
(1) සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.
(2) සමතුලිත මිල පහළ වැටෙන නමුදු සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.
(3) සමතුලිත මිල ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන. එහෙත් සමතුලිත ප්‍රමාණය ඉහළ යනු ඇත.
(4) සමතුලිත මිල ඉහළ යන නමුදු සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.
(5) සමතුලිත මිල පහළ වැටෙන අතර සමතුලිත ප්‍රමාණය ඉහළ යාමට හෝ පහළ යාමට හෝ පිළිවන.

8. දී ඇති රූපසටහනෙහි සැපයුම් වක්‍ර දෙක එකිනෙකට සමාන්තර වේ. රු. 30 සහ රු. 40 අතර මිල පරාසයේ දී




(1) $S_1$ වක්‍රය $S_2$ වක්‍රයට වඩා මිල නම්‍ය වේ.
(2) $S_2$ වක්‍රය $S_1$ වක්‍රයට වඩා මිල නම්‍ය වේ.
(3) $S_1$ සහ $S_2$ වක්‍ර සමාන මිල නම්‍යතාවකින් යුක්ත වේ.
(4) $S_1$ වක්‍රයේ මිල නම්‍යතා අගයන් ධන අගයන් වන නමුදු 1ට වඩා අඩු ය.
(5) $S_2$ වක්‍රයේ මිල නම්‍යතා අගයන් ධන අගයන් වන නමුදු 1ට වඩා වැඩි ය.

9. නිෂ්පාදන ආයතනයකට තම අයභාරය ඉහළ නංවා ගැනීමට වුවමනා නම් සහ එම ආයතනය තම නිෂ්පාදිතය සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව −0.82කට සමාන බව දන්නේ නම්, ආයතනය
(1) මිල අඩු කළ යුතුය; මන්නිසාදයත් ඉල්ලුම නම්‍ය බැවිනි.
(2) මිල අඩු කළ යුතුය; මන්නිසාදයත් ඉල්ලුම ඒකීය නම්‍ය බැවිනි.
(3) මිල අඩු කළ යුතුය; මන්නිසාදයත් ඉල්ලුම අනම්‍ය බැවිනි.
(4) මිල ඉහළ දැමිය යුතුය; මන්නිසාදයත් ඉල්ලුම අනම්‍ය බැවිනි.
(5) මිල ඉහළ දැමිය යුතුය; මන්නිසාදයත් ඉල්ලුම නම්‍ය බැවිනි.

10. තරඟකාරී වෙළෙඳපොළක ආර්ථික අතිරික්තය උපරිම වනුයේ
(1) සැපයුම් කරනු ලබන ප්‍රමාණය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට සමාන වන විට දී ය.
(2) සැපයුම් කරනු ලබන ප්‍රමාණය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ඉක්මවා යන විට දී ය.
(3) ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය සැපයුම් කරනු ලබන ප්‍රමාණය ඉක්මවා යන විට දී ය.
(4) සමතුලිත මිලට පහළින් මිල නියම කරනු ලබන විට දී ය.
(5) සමතුලිත මිලට ඉහළින් මිල නියම කරනු ලබන විට දී ය.

11. X භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් මිල අනම්‍යතාවෙන් සහ ආදායම් අනම්‍යතාවෙන් යුක්ත වේ. එසේ ම X භාණ්ඩය Y භාණ්ඩයට ආදේශක භාණ්ඩයක් ද වේ. පහත දැක්වෙන වගුවෙහි X භාණ්ඩය හඳුනාගන්න.

| | ඉල්ලුමේ මිල නම්‍යතාව | ඉල්ලුමේ ආදායම් නම්‍යතාව | Y භාණ්ඩය සමග හරස් නම්‍යතාව |
|---|---|---|---|
| (1) | − 0.8 | 0.25 | 1.4 |
| (2) | − 0.8 | 1.25 | 0.4 |
| (3) | − 0.9 | 0.25 | − 1.4 |
| (4) | − 0.8 | 1.25 | − 0.4 |
| (5) | − 0.6 | 0.45 | − 1.4 |

12. කිසියම් රටක් සරල අවම වැටුප් නීතියක් සම්මත කරන්නේ නම් එහි ප්‍රතිඵල වශයෙන් සේවා නියුක්තියෙහි සහ සේවා වියුක්තියෙහි විශාල වැඩිවීමක් ඇතිවන්නේ
(1) ශ්‍රම ඉල්ලුම සාපේක්ෂ ව නම්‍ය වේ නම් ය.
(2) ශ්‍රම ඉල්ලුම ඒකීය නම්‍ය වේ නම් ය.
(3) ශ්‍රම ඉල්ලුම සාපේක්ෂ ව අනම්‍ය වේ නම් ය.
(4) ශ්‍රම ඉල්ලුම පූර්ණ නම්‍ය වේ නම් ය.
(5) ශ්‍රම සැපයුම සාපේක්ෂ ව නම්‍ය වේ නම් ය.

13. සීනි සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය $Q_D = 140 - 2P$ ද වෙළෙඳපොළ සැපයුම් වක්‍රය $Q_S = -10 + P$ ද වේ යැයි උපකල්පනය කරන්න. කිලෝවක් සඳහා රු. 52ක අවම මිලක් සහතික කෙරෙන ආධාරක මිල වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කරනු ලැබේ යැයි සලකන්න. මෙම වැඩසටහන සඳහා රජයට වැයවන පිරිවැය කොපමණ ද? (භාණ්ඩ ප්‍රමාණය ඒකක මිලියනවලිනි.)
(1) රු. මිලියන 312
(2) රු. මිලියන 126
(3) රු. මිලියන 84
(4) රු. මිලියන 80
(5) රු. මිලියන 6

14. අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක මිල අඩු කිරීම සඳහා එම භාණ්ඩයට ඒකක සහනාධාරයක් ලබා දීමට රජය තීරණය කොට තිබේ. එහි ප්‍රතිඵල වශයෙන් භාණ්ඩයේ මිල විශාල ලෙස පහළ වැටෙනුයේ
(1) සැපයුමේ මිල නම්‍යතාව නම්‍ය වන විට දී ය.
(2) සැපයුමේ මිල නම්‍යතාව අනම්‍ය වන විට දී ය.
(3) ඉල්ලුමේ මිල නම්‍යතාව නම්‍ය වන විට දී ය.
(4) ඉල්ලුමේ මිල නම්‍යතාව අනම්‍ය වන විට දී ය.
(5) සැපයුමේ මිල නම්‍යතාව ඒකීය නම්‍ය වන විට දී ය.

15. කෙටි කාලයේ දී පූර්ණ තරඟකාරී ආයතනයක් ආන්තික පිරිවැයට වඩා ආන්තික ආදායම විශාල වූ තත්ත්වයක නිෂ්පාදනය කරයි යැයි සිතමු. කෙටි කාලයේ දී ලාභ උපරිම කරගැනීම සඳහා මෙම ආයතනය කළ යුත්තේ කුමක් ද?
(1) නිෂ්පාදනය කරමින් සිටින භාණ්ඩ ප්‍රමාණය වැඩි කිරීම
(2) නිෂ්පාදනය කරමින් සිටින භාණ්ඩ ප්‍රමාණය අඩු කිරීම
(3) ආන්තික පිරිවැය පහළ හෙළා ගැනීම
(4) කර්මාන්තය අත්හැර දමා යාම
(5) නිෂ්පාදනය පහළ හෙළීම, එවිට MC > MR වේ.

16. තරඟකාරී වෙළෙඳපොළක කටයුතු කරන ලාභ උපරිම කරන ආයතනයක් කෙටි කාලීන පාඩු අවම කරගැනීම සඳහා අවශ්‍යයෙන් ම නිෂ්පාදනය වසා දමනුයේ පහත සඳහන් කවර තත්ත්වයක් යටතේ දී ද?
(1) මුළු ආදායම මුළු පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(2) ආන්තික පිරිවැය සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වූ විට දී ය.
(3) ආන්තික පිරිවැය ආන්තික ආදායමට වඩා අඩු වූ විට දී ය.
(4) සාමාන්‍ය ආදායම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(5) සාමාන්‍ය ආදායම සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු වූ විට දී ය.

17. තරඟකාරී වෙළෙඳපොළක නිෂ්පාදන ආයතනයක් අපේක්ෂා කරනු ලබන විවිධ නිමැවුම් මට්ටම් සඳහා අදාළ මුළු පිරිවැය සහ ලාභ පහත වගුවේ පෙන්නුම් කරයි.

| නිමැවුම (ඒකක) | මුළු පිරිවැය (රු.) | ලාභ (රු.) |
|---|---|---|
| 20 | 600 | 600 |
| 30 | 800 | 700 |
| 40 | 1000 | 800 |

මෙම තොරතුරුවලට අනුව ආයතනය තම අලෙවිය
(1) ඒකක 20 සිට 30ට වැඩි කරන විට මිල රු. 50කින් අඩු වේ.
(2) ඒකක 20 සිට 30ට වැඩි කරන විට මිල රු. 60කින් අඩු වේ.
(3) ඒකක 30 සිට 40ට වැඩි කරන විට මිල රු. 40කින් අඩු වේ.
(4) ඒකක 30 සිට 40ට වැඩි කරන විට මිල රු. 5කින් අඩු වේ.
(5) ඒකක 20 සිට 40ට වැඩි කරන විට මිල රු. 10කින් අඩු වේ.

**18.** කෙටි කාලීන පිරිවැය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශයක් **සාවද්‍ය** වේ ද?

(1) සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍ර U හැඩයක් ගනී.
(2) සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර පරතරය ආන්තික පිරිවැය වේ.
(3) නිමැවුම වැඩිවෙත් ම සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර පරතරය පටු වේ.
(4) ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යය ඡේදනය කරයි.
(5) ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යය ඡේදනය කරයි.

**19.** දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම සඳහා විවෘත ආර්ථික ආදර්ශයකදී (open economy model) එකතු කරනුයේ

(1) අවසාන පරිභෝජන වියදම, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සහ ශුද්ධ අපනයනයි.
(2) පෞද්ගලික පරිභෝජන වියදම, රජයේ පරිභෝජන වියදම සහ භාණ්ඩ හා සේවා අපනයනයි.
(3) අවසාන පරිභෝජන වියදම, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සහ ශුද්ධ අපනයනයි.
(4) අවසාන පරිභෝජන වියදම, දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, පරිලේඛන (inventories) වෙනස්වීම සහ භාණ්ඩ හා සේවා අපනයනයි.
(5) පෞද්ගලික පරිභෝජන වියදම, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සහ ශුද්ධ අපනයනයි.

**20.** දළ ජාතික ඉතුරුම් ගණනය කළ හැකි වනුයේ වැයකළ හැකි දළ ජාතික ආදායමින් පහත සඳහන් කවරක් අඩු කිරීමෙන් ද?

(1) බදු
(2) අවසාන පරිභෝජන වියදම
(3) ශුද්ධ අපනයන
(4) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය
(5) සංක්‍රාම ගෙවීම්

**21.** පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේ ද?

(1) සූදු කෙළීමෙන් ලැබෙන ඉපැයීම් ජාතික ගිණුම්කරණයේ නිෂ්පාදන ඉම තුළට ඇතුළත් වේ.
(2) කල්පවත්නා ප්‍රාග්ධන භාණ්ඩ පරිභෝජනය ප්‍රාථමික ආදායම් සංරචකයක් නොවේ.
(3) පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙවත්තෙහි එළවලු වගාකිරීම දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී ඇතුළත් කර ගනී.
(4) රජය විසින් නොමිලේ අධ්‍යාපන සේවා ලබාදීම දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී සැලකිල්ලට නොගනී.
(5) මිශ්‍ර ආදායම් සියලු ම ආයතනික ඒකක විසින් උපයනු ලැබේ.

**22.** කිසියම් රටක පසුගිය වර්ෂයෙහි මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 12 000ක් වූ බවත්, මෙම වර්ෂයෙහි නාමික දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 16 500ක් බවත්, මෙම වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය 150ක් බවත් සලකන්න. මෙම රටේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය කොපමණ ද?

(1) 37.5% (2) 9.5% (3) – 6.4% (4) – 8.3% (5) – 27.3%

**23.** කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් සාර්ව ආර්ථික දත්ත ඔබ වෙත ලබා දී ඇත.

ඉතුරුම් (S) = රු. බිලියන 500
අයවැය හිඟය (BD) = රු. බිලියන 100
ශුද්ධ අපනයනය (NX) = රු. බිලියන –50

මෙම තොරතුරුවලට අනුව මෙම ආර්ථිකයෙහි ආයෝජන මට්ටම (I) කුමක් විය යුතු ද?

(1) රු. බිලියන 650
(2) රු. බිලියන 550
(3) රු. බිලියන 450
(4) රු. බිලියන 400
(5) රු. බිලියන 350

**24.** ආන්තික පරිභෝජන නැඹියාව 0.9ක් ව පවතින ආර්ථිකයක් සැලකිල්ලට ගන්න. ආණ්ඩුවේ සංක්‍රාම රු. බිලියන 500කින් වැඩි කරනු ලැබුවහොත් මෙම ආර්ථිකයේ මුළු නිමැවුම කොපමණ ප්‍රමාණයකින් වැඩි වේ ද?

(1) රු. බිලියන 450
(2) රු. බිලියන 500
(3) රු. බිලියන 3 500
(4) රු. බිලියන 4 500
(5) රු. බිලියන 5 000

[පස්වැනි පිටුව බලන්න

25. සැලසීම් කාර්යාංශය මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 10 000ක් ද, පූර්ණ සේවා නියුක්ති මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු. බිලියන 8 000ක් ද වේ නම්, ආර්ථිකය මෙම තත්ත්වය තුළ ස්ථාවර කිරීමට ඇස්තම් සඳහා පහත සඳහන් සුදුසු ප්‍රතිපත්ති සංයෝජනයක් කවරේ ද?

(1) බදු අඩු කිරීමක් සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමක්
(2) බදු අඩු කිරීමක් සහ පොලී අනුපාතික පහළ දැමීමක්
(3) බදු අඩු කිරීමක් සහ විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් හි දී රජයේ සුරැකුම්පත් අලෙවි කිරීමක්
(4) රජයේ මිල දී ගැනීම් ඉහළ යාමක් සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීමක්
(5) බදු අඩු කිරීමක් සහ රජයේ මිල දී ගැනීම් අඩු කිරීමක්

26. ඔබ, ඔබේ ජංගම ගිණුමෙන් මුදල් ඉවතට ගෙන, එම මුදල ඔබේ ඉතුරුම් ගිණුමේ තැන්පත් කළහොත්, $M_1$ සහ $M_2$ යන මුදල සමස්තයන් කෙරෙහි එය බලපාන්නේ කෙසේ ද?

(1) $M_1$ වැඩි වන අතර $M_2$ අඩු වේ.
(2) $M_2$ වැඩි වන අතර $M_1$ අඩු වේ.
(3) $M_1$ සහ $M_2$ යන දෙකට ම එය බලපෑමක් නැත.
(4) $M_1$ සහ $M_2$ යන දෙක ම අඩු වේ.
(5) $M_1$ සහ $M_2$ යන දෙක ම වැඩි වේ.

27. මුදල් ප්‍රමාණවාදී න්‍යායයේ උපකල්පනවලට අනුව මුදල් සැපයුම 10%කින් වැඩි වේ නම්

(1) නාමික දළ දේශීය නිෂ්පාදිතය 10%කින් ඉහළ යන අතර මූර්ත දළ දේශීය නිෂ්පාදිතය නොවෙනස් ව පවතී.
(2) නාමික දළ දේශීය නිෂ්පාදිතය සහ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 10%කින් ඉහළ යනු ඇත.
(3) නාමික දළ දේශීය නිෂ්පාදිතය නොවෙනස් ව පවතින නමුදු මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 10%කින් ඉහළ යනු ඇත.
(4) නාමික දළ දේශීය නිෂ්පාදිතය නොවෙනස් ව පවතින නමුදු මිල මට්ටම 10%කින් ඉහළ යනු ඇත.
(5) නාමික දළ දේශීය නිෂ්පාදිතය හෝ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය හෝ වෙනස් නොවේ.

28. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සඳහා පහත සඳහන් කවරක් හේතු වේ ද?

(1) සෘජු බදු වැඩි කිරීම
(2) වක්‍ර බදු වැඩි කිරීම
(3) ලෝක වෙළෙඳපොළෙහි ඛනිජ තෙල් මිල සීඝ්‍ර ලෙස ඉහළ යාම
(4) රජය භාණ්ඩ හා සේවා මිල දී ගැනීම් අඩු කිරීම
(5) මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිල දී ගැනීම

29. අවශ්‍ය කරන සංචිත අනුපාතය පවත්වාගෙන යන වාණිජ බැංකුවක ඇති තම ජංගම ගිණුමෙහි තිබිගත් පුද්ගලයෙක් රු. 5 000ක් තැන්පත් කරනු ලැබේ නම්, එහි ක්ෂණික ප්‍රතිඵලය වන්නේ

(1) මුදල් සැපයුම රු. 5 000කින් අඩු වීමයි.
(2) මුදල් සැපයුම රු. 5 000කින් වැඩි වීමයි.
(3) මුදල් සැපයුමෙහි වෙනසක් නොවන නමුදු දැන් බැංකුව සතුව අධිසංචිත පවත්නා බැවින් අනාගතයේ දී මුදල් සැපයුම ප්‍රසාරණය වීමට හැකිවීමයි.
(4) මුදල් සැපයුම රු. 5 000කින් ප්‍රසාරණය වන නමුදු දැන් බැංකුව සතුව අධි සංචිත පවත්නා බැවින් අනාගතයේ දී මුදල් සැපයුම තවදුරටත් ප්‍රසාරණය වීමට හැකිවීමයි.
(5) මෙම පුද්ගලයා විසින් සංසරණයෙන් ඉවත් කරනු ලැබූ මුදල් ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් අධි සංචිත අඩු වීමයි.

30. විනිමය අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ සමාහාර ඉල්ලුම යන සාධක සම්බන්ධයෙන් ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ගෙනදෙනු ලබන්නේ පහත සඳහන් කවරක් ද?

| | විනිමය අනුපාතිකය | ප්‍රතිපත්ති පොලී අනුපාතිකය | සමාහාර ඉල්ලුම |
|---|---|---|---|
| (1) | අඩු වේ | වැඩි වේ | අඩු වේ |
| (2) | වැඩි වේ | අඩු වේ | අඩු වේ |
| (3) | වැඩි වේ | වැඩි වේ | අඩු වේ |
| (4) | අඩු වේ | අඩු වේ | වැඩි වේ |
| (5) | වැඩි වේ | වැඩි වේ | වැඩි වේ |

31. ශුද්ධ පොදු භාණ්ඩයක් **නොවනුයේ** පහත සඳහන් කවරක් ද?

(1) ලෝක උරුම ස්ථාන
(2) ප්‍රදීපාගාරය
(3) සයිබර් ආරක්ෂාව
(4) ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව
(5) ජාතික ආරක්ෂාව

[හයවැනි පිටුව බලන්න

**32.** පහත දැක්වෙන විකල්ප අතුරින් කවරක් ගුණ සාධන භාණ්ඩ, පොදු භාණ්ඩවලින් වෙන්කොට දක්වන්නේ ද?

| | ගුණ සාධන භාණ්ඩ | පොදු භාණ්ඩ |
|---|---|---|
| (1) | පරිභෝජනය නිසා සෙස්සන්ට ලැබෙන ප්‍රමාණය අඩු වේ | පරිභෝජනය නිසා සෙස්සන්ට ලැබෙන ප්‍රමාණය අඩු නොවේ |
| (2) | වෙළෙඳපොළ මිලට සපයනු ලැබේ | පිරිවැය ආවරණය කෙරෙන මිලක් යටතේ සපයනු ලැබේ |
| (3) | සැපයුම සීමා සහිත වේ | අසීමිත සැපයුමක් දක්නට ලැබේ |
| (4) | ධන බාහිරතා ජනනය කරයි | සෘණ බාහිරතා ජනනය කරයි |
| (5) | ආණ්ඩුව විසින් සපයනු ලැබේ | පෞද්ගලික සමාගම් විසින් සපයනු ලැබේ |

**33.** වෙළෙඳපොළ අසමත්වීම හටගනුයේ

(1) ඇතැම් ආයතනවලට ඔවුන්ගේ නිෂ්පාදිත සඳහා වෙළෙඳපොළක් සොයාගැනීමට නොහැකි වූ විට දී ය.
(2) වෙළෙඳපොළ කාර්යක්ෂම ව සම්පත් බෙදා වෙන් නොකරන විට දී ය.
(3) වෙළෙඳපොළ ගුණ සාධන භාණ්ඩ නොසපයන විට දී ය.
(4) ඉල්ලුම, සැපයුම ඉක්මවා යමින් මිල ගණන් ඉහළ යාමට තුඩු දෙන විට දී ය.
(5) භාණ්ඩ හා සේවා මත රජය මිල පාලන යොදන විට දී ය.

**34.** බදුකරණයේ සිරස් සාධාරණත්වය යන්නෙන් අදහස් කරනුයේ

(1) සමාන ගෙවීම් හැකියාවකින් යුත් අය සමාන බදු බරක් දැරිය යුතු බව ය.
(2) රාජ්‍ය සේවාවන්ගෙන් ප්‍රතිලාභ වැඩියෙන් හිමිකරගන්නා අය ඉහළ බදු බරක් දැරිය යුතු බව ය.
(3) ගෙවීමේ හැකියාව වැඩි පුද්ගලයන් වැඩි බදු බරක් දැරිය යුතු බව ය.
(4) සමාන ගෙවීම් හැකියාවක් ඇති අය අසමාන බදු බරක් දැරිය යුතු බව ය.
(5) ආදායම් උපයන සියල්ලෝ ම තම ආදායමින් සමාන ප්‍රතිශතයක් බදු වශයෙන් ගෙවිය යුතු බව ය.

**35.** රජයේ දළ මූල්‍යන අවශ්‍යතා (Gross Financing Needs) ගණනය කරනුයේ කෙසේ ද?

(1) දළ මූල්‍යන අවශ්‍යතා = රජයේ මුළු අයභාරය සහ දීමනා – පොලී ගෙවීම් ඇතුළත් නොවූ පුනරාවර්තන වියදම – ප්‍රාග්ධන වියදම
(2) දළ මූල්‍යන අවශ්‍යතා = රජයේ මුළු අයභාරය සහ දීමනා – රජයේ මුළු වියදම + ණය ආපසු ගෙවීම
(3) දළ මූල්‍යන අවශ්‍යතා = රජයේ මුළු අයභාරය සහ දීමනා – (පුනරාවර්තන වියදම + ප්‍රාග්ධන වියදම + පොලී ගෙවීම)
(4) දළ මූල්‍යන අවශ්‍යතා = රජයේ මුළු අයභාරය සහ දීමනා – (රජයේ මුළු වියදම – ශුද්ධ ණයදීම)
(5) දළ මූල්‍යන අවශ්‍යතා = රජයේ මුළු අයභාරය සහ දීමනා – (පුනරාවර්තන වියදම – ණය ආපසු ගෙවීම)

**36.** ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ප්‍රපාතනය යනු

(1) බහුජාතික සමාගම් විසින් යොදා ගන්නා මිල විශේෂණ ස්වරූපයකි.
(2) දේශීය වෙළෙඳපොළ මිලට වඩා අඩු මිලකට විදේශ වෙළෙඳපොළෙහි භාණ්ඩ අලෙවි කිරීමේ ස්වරූපයකි.
(3) ආනයන කෝටාවකින් අවසර දී ඇති ප්‍රමාණයට වඩා වැඩියෙන් භාණ්ඩ අලෙවි කිරීමකි.
(4) රටෙහි වෙළෙඳ ශේෂය නිවැරදි කිරීම සඳහා යොදා ගැනෙන උපාය මාර්ගයකි.
(5) යම් රටකින් ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමකි.

**37.** ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගැනුම්කරු

(1) ඇමෙරිකා එක්සත් ජනපදය වේ. (2) යුරෝපා සංගමය වේ. (3) එක්සත් රාජධානිය වේ.
(4) චීනය වේ. (5) ඉන්දියාව වේ.

**38.** කුරුඳු සහ ලුණු නිෂ්පාදනයේ දී ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ශ්‍රම ඒකකයකට ලැබෙන නිමැවුම් ප්‍රමාණ පහත වගුවේ දැක්වේ.

| භාණ්ඩය | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
|---|---|---|
| කුරුඳු | 10 | 20 |
| ලුණු | 30 | 100 |

අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් සිදුවීම සඳහා ශ්‍රී ලංකාව, ඉන්දියාව සමග වෙළෙඳාම් කිරීමට කැමති වන්නේ කවර හුවමාරු අනුපාතිකයක් යටතේ දී ද?

(1) කුරුඳු ඒකකයක් සඳහා ලුණු ඒකක 2කට වඩා අඩු ප්‍රමාණයක්
(2) කුරුඳු ඒකකයක් සඳහා ලුණු ඒකක 3කට වඩා අඩු ප්‍රමාණයක්
(3) කුරුඳු ඒකකයක් සඳහා ලුණු ඒකක 5කට වඩා වැඩි ප්‍රමාණයක්
(4) කුරුඳු ඒකකයක් සඳහා ලුණු ඒකක 3ත් 5ත් අතර ප්‍රමාණයක්
(5) කුරුඳු ඒකකයක් සඳහා ලුණු ඒකක 2ත් 4ත් අතර ප්‍රමාණයක්

[හත්වැනි පිටුව බලන්න.

39. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයක් පවතින විට, එයට හේතුවක් ලෙස සැලකිය හැක්කේ පහත කුමක් ද?
(1) විදේශ රටවල උද්ධමන අනුපාතය අඩුවීම
(2) ප්‍රාථමික භාණ්ඩවලින් ලැබෙන අඩු ලෙස අපනයන ආදායම
(3) විදේශ සෘජුආයෝජනයන්ගේ වැඩිවීම
(4) විදේශීය සංචාරකයන්ගෙන් ලැබෙන ආදායම
(5) කළඹ ආයෝජන සඳහා ඉහළ පොලිය

40. ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ සෘජු ආයෝජනයන්ගේ වර්ධනයට බලපාන ප්‍රධානතම ප්‍රශ්නය වනුයේ
(1) ප්‍රතිපත්ති ස්ථාවරයයි.
(2) මිල ස්ථායීතාවයි.
(3) උසස් දේශපාලනයයි.
(4) දක්ෂ ශ්‍රමිකයයි.
(5) සිත්ගන්නාසුලු පරිසරයයි.

41. රටක මුදලෙහි බාහිර අගය ඉහළ යාමක් (appreciation) නිසා ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ අතිරික්තය වැඩිවීමට හේතු විය හැකි වනුයේ,
(1) අපනයන සහ ආනයන සඳහා ඇති ඉල්ලුම් නම්‍යතා සංගුණක එකතුව එක මට වඩා අගය 1ට වඩා අඩු නම් ය.
(2) වෙළෙඳ අනුපාතය වඩා වාසිදායක වීම සහ අපනයන ඉල්ලුම වඩාත් මිල නම්‍ය වීම නිසා ය.
(3) එම රට සාර්ථක සංචාර අපනයනය කරන්නේ නම් සහ අඩු මුදල් ආනයනය කරන්නේ නම් ය.
(4) අපනයන සහ ආනයන දෙකම ඇති ඉල්ලුම නම්‍ය වීම නිසා ය.
(5) ආනයන පරිමාව සමඟ සසඳන විට අපනයන පරිමාව විශාල වීම නිසා ය.

42. කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමට සහ මූල්‍ය ගිණුමට අදාළ දත්ත කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| ගනුදෙනුව | වටිනාකම (රු. බිලියන) | ගනුදෙනුව | වටිනාකම (රු. බිලියන) |
|---|---|---|---|
| මූල්‍ය ව්‍යුත්පන්න | 25 | භාණ්ඩ හා සේවා ගිණුම් ශේෂය | −160 |
| ශුද්ධ ප්‍රාථමික ආදායම | −40 | ශුද්ධ ද්විතීයික ආදායම | 20 |
| සෘජු ආයෝජන | 60 | කළඹ ආයෝජන | 50 |
| සංචිත වත්කම් | 15 | ප්‍රාග්ධන ගිණුම් ශේෂය | ? |

මෙම ආර්ථිකයේ ප්‍රාග්ධන ගිණුම් ශේෂය කොපමණ ද?
(1) රු. බිලියන 30ක අතිරික්තයකි.
(2) රු. බිලියන 30ක හිඟයකි.
(3) රු. බිලියන 150ක හිඟයකි.
(4) රු. බිලියන 150ක අතිරික්තයකි.
(5) රු. බිලියන 180ක හිඟයකි.

43. මෙරට රජයක් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඉලක්කයක් ලෙස තිරසාර ආර්ථික වර්ධනය තෝරා ගනී. තිරසාර ආර්ථික වර්ධනය යන්නෙන් අදහස් කෙරෙනුයේ කුමක් ද?
(1) ආර්ථිකයේ වත්මන් නිෂ්පාදන විභවතාව හැකිතාක් වේගයෙන් ඉහළ නැංවීම
(2) අඩු පිරිවැයක් ඇති සම්පත් පමණක් භාවිත කරමින් ආර්ථිකයේ වත්මන් නිෂ්පාදන විභවතාව වැඩි කර ගැනීම
(3) අනාගත නිෂ්පාදන විභවතාව අඩු නොකොට ආර්ථිකයේ වත්මන් නිෂ්පාදන විභවතාව වැඩි කර ගැනීම
(4) ආර්ථිකයේ අනාගත නිෂ්පාදන විභවතාව හැකිතාක් වේගයෙන් ඉහළ නැංවීම
(5) ආර්ථිකය ස්වභාවික සම්පත් මත යැපීම අවම කිරීම සඳහා වත්මන් නිෂ්පාදන විභවතාව වැඩි කර ගැනීම

44. විවිධ රටවල සංවර්ධන මට්ටම තක්සේරු කිරීම සහ සංසන්දනය කිරීම සඳහා මානව සංවර්ධන දර්ශකය (HDI) ප්‍රකාශයට පත් කරන ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?
(1) ලෝක බැංකුව
(2) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
(3) ආසියානු සංවර්ධන බැංකුව
(4) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(5) ලෝක වෙළෙඳ සංවිධානය

45. අඩු ආදායම් සහිත රටවල් සඳහා ලෝක බැංකුව දැනට යොදා ගන්නා ජාත්‍යන්තර දරිද්‍රතා රේඛාව ඇමරිකානු ඩොලර්
(1) 1.00කි. (2) 1.75කි. (3) 2.15කි. (4) 3.65කි. (5) 6.85කි.

[අටවැනි පිටුව බලන්න.

46. කල්පිත ආර්ථිකයක ශ්‍රම බළකායට අදාළ දත්ත කිහිපයක් පහත වගුව පෙන්නුම් කරයි.

| වර්ෂය | ශ්‍රම බළකාය (මිලියන) | සේවා වියුක්ත ජනගහනය (මිලියන) | වැඩ කරන වයසේ ජනගහනය (මිලියන) |
|---|---|---|---|
| 1 වර්ෂය | 15 | 3 | 25 |
| 2 වර්ෂය | 20 | 4 | 30 |

ඉහත දත්තවලට අනුව මෙම රටෙහි 1වන වර්ෂයේ සිට 2වන වර්ෂය දක්වා සේවා වියුක්ත අනුපාතිකයේ හා ශ්‍රම බළකා සහභාගිත්ව අනුපාතිකයේ සිදුවන ඇති වෙනස්කම් වඩාත් හොඳින් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරක් මඟින් ද?

| | සේවා වියුක්ත අනුපාතිකය | ශ්‍රම බළකා සහභාගිත්ව අනුපාතිකය |
|---|---|---|
| (1) | අඩුවිය | වැඩිවිය |
| (2) | වැඩිවිය | නොවෙනස්ව පැවතුණි |
| (3) | නොවෙනස්ව පැවතුණි | වැඩිවිය |
| (4) | වැඩිවිය | වැඩිවිය |
| (5) | නොවෙනස්ව පැවතුණි | අඩුවිය |

47. කල්පිත ආර්ථිකයක ගිනි සංගුණකය 0.35 සිට 0.42 දක්වා වෙනස් වූයේ යැයි සලකන්න. මෙම වෙනස ඇති කිරීමට බොහෝදුරට හේතු වන්නට ඇත්තේ පහත සඳහන් කවරක වැඩිවීමක් ද?
(1) අත්‍යවශ්‍ය පරිභෝජන භාණ්ඩ මත පනවනු ලබන එකතු කළ අගය මත බද්ද
(2) ආදායම් බදු ගෙවන්නන් සඳහා බදුවලින් නිදහස් ආදායම් සීමාව
(3) සේවා වියුක්තිකයන්ට ලබාදෙන සංක්‍රාම ගෙවීම්
(4) පුහුණු කිරීම් සඳහා ව්‍යාපාරික අංශයේ වැය කිරීම
(5) සමාජ ආරක්ෂණ ජාල මත රජය කරනු ලබන වියදම්

48. තිරසාර සංවර්ධනයෙහි මූලික අරමුණ වඩාත් හොඳින් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවරක් ද?
(1) ග්‍රාමීය සහ වතු අංශවල විරැකියාව අඩු කිරීම
(2) දරිද්‍රතාව සහ ආදායම් විෂමතාව අඩු කිරීම
(3) නාගරික අංශයේ කුඩා ව්‍යාපාරිකයන් දිරිමත් කිරීම
(4) අඩු ආදායම් සහිත පවුල්වල ළමයින්ගේ උසස් අධ්‍යාපනය සඳහා ආධාර කිරීම
(5) ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීම

49. පැරිස් සමාජය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා මූලික වශයෙන් සලකා බලනුයේ
(1) වාණිජ බැංකු ඇතුළු පෞද්ගලික ණය හිමියන් විසින් දෙනු ලබන මධ්‍ය කාලීන සහ දිගු කාලීන රාජ්‍ය ණයයි.
(2) සංවර්ධනය වන රටවල් විසින් සංවර්ධිත රටවලින් ලබාගත් මධ්‍ය කාලීන සහ දිගු කාලීන රාජ්‍ය ණයයි.
(3) ස්වෛරී ණයහිමියෙකුට සාමාජික රටක් විසින් නිකුත් කරන ලද මධ්‍ය කාලීන සහ දිගු කාලීන රාජ්‍ය ණයයි.
(4) කෙටි කාලීන ව කල්පිරෙන රාජ්‍ය ණයයි.
(5) බහුපාර්ශ්වික ණය දෙනු ලබන ආයතනවලට ගෙවිය යුතු රාජ්‍ය ණයයි.

50. ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක කෙරෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම පිළිබඳ එකඟතා වැඩපිළිවෙළ යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය තුන වනුයේ කවරක් ද?
(1) ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ලංකා සතොස සහ ශ්‍රී ලංකා ටෙලිකොම්
(2) ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකන් ගුවන් සේවය
(3) නිවාස සංවර්ධන අධිකාරිය, සීමාසහිත මිල්කෝ (පුද්.) සමාගම, ලංකා ධීවර සංස්ථාව
(4) සීමාසහිත ලංකා ෆොස්ෆේට් සමාගම, ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය
(5) ලංකා විදුලි බල මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

**21 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

※ **'අ'** උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, **'ආ'** උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) ආර්ථිකයක සම්පත් බෙදා වෙන්කිරීම සම්බන්ධ ගැටලු මතුවන්නේ ඇයි? (ලකුණු 03යි)

(ii) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් යනුවෙන් අදහස් කරනුයේ කවරක් ද? එවැනි සම්පත්වලට උදාහරණයක් දක්වන්න. (ලකුණු 03යි)

(iii) නිෂ්පාදන ක්‍රියාවලීන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ශ්‍රමික විභාජනය දායක වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(iv) විධාන ආර්ථිකයක ප්‍රධාන දුර්වලතා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) "ආර්ථිකයක් තම නිෂ්පාදන හැකියා වක්‍රය මත සිටින ස්ථානය පිළිබඳව වර්තමානයේ කරනු ලබන තේරීම ආර්ථික වෘද්ධිය නිර්ණය වන ප්‍රධාන සාධකයක් වේ." රූප සටහන් උපයෝගී කරගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

2. (i) සාමාන්‍ය භාණ්ඩයක්, බාල භාණ්ඩයක් සහ ගිෆන් භාණ්ඩයක් අතර වෙනස දක්වන්න. (ලකුණු 03යි)

(ii) වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 03යි)

(iii) සැපයුම් වක්‍රයක් ධන බෑවුමක් සහිත වීමට බලපාන හේතු **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04යි)

(iv) රේඛීය ඉල්ලුම් වක්‍රයක් ඉහළ මිල පරාසයන්හි දී වඩාත් මිල නම්‍ය වන්නේත්, පහළ මිල පරාසයන්හි දී වඩාත් මිල අනම්‍ය වන්නේත් ඇයි? (ලකුණු 04යි)

(v) (අ) මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ඒවා ඉල්ලුම් නීතියට සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

3. (i) භාණ්ඩයක් මත පනවනු ලබන ඒකක බද්දක් නිසා වෙළෙඳපොළ මිලත් මිල දී ගනු ලබන ප්‍රමාණයත් යන දෙකම නොවෙනස් ව පැවතිය හැක්කේ කවර තත්ත්වයන් යටතේ දී ද? ඔබේ පිළිතුර රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න පැහැදිලි කරන්න.

(අ) පාරිභෝගික අතිරික්තය ප්‍රස්තාරික ව පෙන්නුම් කරනුයේ ඉල්ලුම් වක්‍රයට පහළින් සහ සැපයුම් වක්‍රයට ඉහළින් ඇති ප්‍රදේශයෙනි.

(ආ) සැපයුමේ අඩුවීමක් නිසා වෙළෙඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් පාරිභෝගික අතිරික්තය වැඩි වේ.

(ඉ) ඉල්ලුම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩයක වෙළෙඳපොළ මිල පහළ වැටේ නම් අමතර නිෂ්පාදක අතිරික්තයක් බිහි වේ.

(02 × 3 = ලකුණු 06යි)

[දෙවැනි පිටුව බලන්න

https://t.me/WM_Groups

(iii) වී සඳහා වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රය $Q_D = 120 - 0.5P$ වන අතර, වී සඳහා වෙළෙඳපොළ සැපයුම් වක්‍රය $Q_S = -30 + P$ ලෙස උපකල්පනය කරන්න. (ප්‍රමාණ ඒකක මිලියනවලින්)

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය කවරක් ද? (ලකුණු 02යි)

(ආ) කිලෝග්‍රෑමයකට රු. 120ක අවම මිලක් නියම කරමින් 'මිල ආධාරක වැඩසටහනක්' හඳුන්වාදීමට රජය තීරණය කොට තිබේ යැයි සලකන්න. මෙම වෙළෙඳපොළෙහි අධි සැපයුම කොපමණ ද? (ලකුණු 02යි)

(ඉ) මෙම වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද? (ලකුණු 02යි)

(ඊ) මිල ආධාරක වැඩසටහන නිසා අහිමිවන ශුභ සාධනයේ (dead-weight loss) ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04යි)

4. (i) ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය අතර වෙනස කවරක් ද? (ලකුණු 04යි)

(ii) කතිපයාධිකාරී වෙළෙඳපොළක ප්‍රධාන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක නිෂ්පාදන ආයතනයක් මිල ගනුවකු වන්නේත් තම නිෂ්පාදිත සඳහා අයකරනු ලබන මිල තමාට ම තෝරාගත නොහැකි වන්නේත් ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) කැරට් සඳහා පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක් ඇතැයි උපකල්පනය කරන්න. වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයක් රු. 200ක් වේ. සරත් කැරට් ගොවියකු වන අතර ඔහු සතියක දී කිලෝග්‍රෑම් 50ක් අලෙවි කරයි. ඔහුගේ ආන්තික පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 150ක් වේ.

(අ) සතියක දී සරත්ගේ මුළු අයභාරය සහ ආන්තික අයභාරය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) සරත් ලාභ උපරිම කරන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ඉ) කැරට් වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයක් රු. 100ක් දක්වා පහළ බසින අතර, සරත් සතියක දී අලෙවිකරන ප්‍රමාණය කිලෝග්‍රෑම් 30ක් දක්වා අඩු කරයි. ඔහුගේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 80ක් දක්වා පහළ බසින අතර ආන්තික පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 100ක් දක්වා පහළ බසී. ඔහුගේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 40ක් දක්වා ඉහළ නගී. ඔහු ලාභ උපරිම කරන්නේ ද? ඔහු ආර්ථික ලාභ උපයන්නේ ද? නැතහොත් පාඩු ලබන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

5. (i) පහත සඳහන් සිදුවීම් දළ දේශීය නිෂ්පාදිතයට බලපාන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

(අ) වහා ක්‍රියාත්මක වන පරිදි තම වැටුප් අඩු කිරීමට පක්ෂව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරති.

(ආ) නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ අපේක්ෂාවෙන් ආයෝජකයෙක් ඉඩමක් මිල දී ගනී.

(ඉ) විශ්‍රාමික සේවකයෙක් තම විශ්‍රාමික දීමනාවේ රු. 2 500ක වැඩිවීමක් හිමිකර ගනී.

(ඊ) ආයතන ඔවුන්ගේ පරිලේඛන (inventories) වැඩිකර ගනී. (ලකුණු 04යි)

(ii) දළ දේශීය ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කරගනු ලබන ප්‍රාථමික ආදායමේ ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04යි)

(iii) රජය රු. බිලියන 100කින් සංක්‍රාම ගෙවීම් වැඩි කරන බවත් ඒ හා සමාන ප්‍රමාණයකින් ස්වායත්ත බදු ඉහළ නංවන බවත් සලකන්න. මෙම වෙනස නිසා ආර්ථිකය මත ඇති වන ශුද්ධ බලපෑම කුමක් ද? පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iv) කිසියම් කල්පිත ආර්ථිකයක් සඳහා පහත දැක්වෙන සාර්ව ආර්ථික ආදර්ශය උපකල්පනය කරන්න.

| | | |
|---|---|---|
| පරිභෝජනය (C) | = | 420 + 0.8YD |
| සංක්‍රාම ගෙවීම් (Tr.) | = | 200 |
| ස්වායත්ත බදු (T) | = | 250 |
| ආයෝජනය (I) | = | 160 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) | = | 100 |
| ශුද්ධ අපනයන (NX) | = | – 40 |

*(සියලුම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි)*

(අ) මෙම ආර්ථිකය සඳහා සමතුලිත ජාතික ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 04යි)

(ආ) වැයකළහැකි ජාතික ආදායම සහ සමාහාර ඉතුරුම් ගණනය කරන්න. (ලකුණු 02යි)

(ඉ) සමතුලිත ජාතික ආදායම රු. බිලියන 4 000ක් කරා ළඟා වීමට ආයෝජන වියදම් කොතරම් ප්‍රමාණයකින් වෙනස් කළ යුතු වේ ද? (ලකුණු 04යි)

[තුන්වැනි පිටුව බලන්න

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

6. (i) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය සහ පාරිභෝගික මිල දර්ශකය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) උද්ධමනයේ පිරිවැය කවරේ ද? (ලකුණු 04යි)

(iii) (අ) 'අධිබල මුදල්' යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(ආ) ආර්ථිකයක අධිබල මුදල් තොගය තීරණය කරන සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| **වගකීම්** | | **වත්කම්** | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 2 000 | සංචිත | 500 |
| ප්‍රාග්ධනය | 1 300 | ණය | 1 600 |
| | | ගොඩනැගිලි | 1 200 |
| **එකතුව** | **3 300** | **එකතුව** | **3 300** |

*(සියලුම සංඛ්‍යා රුපියල් මිලියනවලින්)*

අවශ්‍ය කරන සංචිත අනුපාතය 10%ක් වේ නම්, මෙම බැංකුවේ අධි සංචිත කොපමණ ද? (ලකුණු 02යි)

(v) සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුවට යොදා ගත හැකි ප්‍රධාන උපකරණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

7. (i) සම්පත් බෙදා වෙන්කිරීම කෙරෙහි බාහිර ප්‍රතිලාභ සහ බාහිර පිරිවැය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) (අ) ශුභ සාධන භාණ්ඩ සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න. (ලකුණු 02යි)

(ආ) ආණ්ඩුවේ මැදිහත්වීමක් නොමැති තැන්හි දී ශුභ සාධන භාණ්ඩ බොහෝ විට ඌන පරිභෝජනයකට පාත්‍ර වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) 'අධි බදු බර' යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය පහළ වැටීමේ ප්‍රවණතාව ආපස්සට හැරවීම සඳහා රජය විසින් මෑතක දී ගනු ලැබූ ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) රටක රාජ්‍ය ණය තිරසාරභාවය තීරණය කිරීමෙහි ලා ප්‍රාථමික ගිණුමේ ශේෂය වඩාත් වැදගත් වන්නේ ඇයි? (ලකුණු 06යි)

8. (i) විදේශ වෙළෙඳාම් ක්ෂේත්‍රය තුළ 'නිරපේක්ෂ වාසිය' සහ 'සාපේක්ෂ වාසිය' යන සංකල්ප අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ආරක්ෂණවාදයට පක්ෂව සහ විපක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04යි)

(iii) විනිමය අනුපාතිකයේ වෙනස්වීම් රටක වෙළෙඳ ශේෂය කෙරෙහි බලපාන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

(iv) රටක භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වැඩි දියුණුවීමක වැදගත්කම කවරේ ද? (ලකුණු 03යි)

(v) මෑත වර්ෂවල දී ඇමෙරිකානු ඩොලරයට එරෙහි ව ශ්‍රී ලංකා රුපියල ප්‍රබල ලෙස ක්ෂය වීමට තුඩුදුන් සාධක **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05යි)

9. (i) බහුමාන-දරිද්‍රතා දර්ශකය දරිද්‍රතාවයේ පැතිකඩ තුනක් මත පදනම් වේ. මෙම පැතිකඩ **තුන** කවරේ ද? (ලකුණු 03යි)

(ii) ලෝක බැංකුව එක්සත් ජනපද ඩොලරයෙන් මැනෙන ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම පදනම් කර ගනිමින් රටවල් කාණ්ඩ හතරකට වර්ගීකරණය කරයි. එම කාණ්ඩ **හතර** කවරේ ද? (ලකුණු 04යි)

(iii) ආර්ථික වර්ධන ක්‍රියාවලියේ දී තාක්ෂණික ප්‍රගතියේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 04යි)

(iv) ව්‍යුහාත්මක සේවා වියුක්තිය සහ චක්‍රීය සේවා වියුක්තිය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රධාන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05යි)

[හතරවැනි පිටුව බලන්න

WWW.PastPapers.WiKi

Download O/L, A/L, and Scholarship Past Papers for all subjects

**10.** (i) (අ) 'ආහාර සුරක්ෂිතතාව' යන සංකල්පයෙන් අදහස් වනුයේ කුමක් ද? (ලකුණු 02යි)

(ආ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතභාවයට බලපා ඇති සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) මෑත කාලයේ ශ්‍රී ලංකාවෙන් තරුණ තරුණියන් සහ මධ්‍යම පාන්තික වෘත්තිකයන් විදේශ වෙත සංක්‍රමණය වීමේ ආර්ථික බලපෑම කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) 'චක්‍රිය ආර්ථිකය' පිළිබඳ සංකල්පය තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට සහ පාරිසරික බලපෑම් අඩු කිරීමට දායකවන්නේ කෙසේ ද? (ලකුණු 05යි)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වර්තමානයේ ඇතිකර ගෙන ඇති එකඟතාවන් යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් රාජ්‍ය ණයෙහි තිරසාරබව සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට පවරා ඇති ප්‍රධාන ප්‍රමාණාත්මක ඉලක්ක මොනවා ද? (ලකුණු 06යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Download O/L, A/L, and Scholarship Past Papers for all subjects

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **21**

විෂයය / பாடம்: **ආර්ථික විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 3 | 31. | 5 | 41. | 1 |
| 02. | 1 | 12. | 3 | 22. | 4 | 32. | 1 | 42. | 1 |
| 03. | 1 | 13. | 2 | 23. | 3 | 33. | 2 | 43. | 3 |
| 04. | 4 | 14. | 4 | 24. | 4 | 34. | 3 | 44. | 2 |
| 05. | 4 | 15. | 1 | 25. | 2 | 35. | 2 | 45. | 3 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 2 | 46. | 3 |
| 07. | 3 | 17. | 4 | 27. | 1 | 37. | 1 | 47. | 2 |
| 08. | 1 | 18. | 2 | 28. | 5 | 38. | 4 | 48. | 2 |
| 09. | 4 | 19. | 1 | 29. | 3 | 39. | 4 | 49. | 3 |
| 10. | 1 | 20. | 2 | 30. | 4 | 40. | 2 | 50. | 2 |

○ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණ බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 01 x 50 = 50

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
AL/2023(2024)/21/S-II
සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

**21 S II**

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**
※ 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
※ ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

**01 වන ප්‍රශ්නය**

**'අ' උප කොටස**

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

1. (i) ආර්ථිකයක සම්පත් බෙදා වෙන්කිරීම සම්බන්ධ ගැටලු මතුවන්නේ ඇයි? (ලකුණු 03යි)
 (ii) ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත් යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? එවැනි සම්පත්වලට උදාහරණයක් දක්වන්න. (ලකුණු 03යි)
 (iii) නිෂ්පාදන ක්‍රියාවලීන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ශ්‍රමික විභාජනය දායක වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)
 (iv) විධාන ආර්ථිකයක ප්‍රධාන දුර්වලතා හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)
 (v) "ආර්ථිකයක් තම නිෂ්පාදන හැකියා වක්‍රය මත සිටින ස්ථානය පිළිබඳව වර්තමානයේ කරනු ලබන තේරීම ආර්ථික වෘද්ධිය නිර්ණය වන ප්‍රධාන සාධකයක් වේ." රූප සටහන් උපයෝගී කරගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

01. (i) - ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීම හා සම්බන්ධ ගැටලු වනුයේ තේරීම පිළිබඳ ප්‍රශ්න හෝ මිනිස් වුවමනා උපරිම ප්‍රමාණයක් සපුරා ගැනීම සඳහා සීමාසහිත සම්පත් පූර්ණ වශයෙන් සහ කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම පිළිබඳ ප්‍රශ්න හෝ වේ. ආර්ථිකයක සම්පත් බෙදා වෙන්කිරීම හා සම්බන්ධ මෙබඳු ප්‍රශ්න මූලික වශයෙන් පැන නගිනුයේ හිඟකම නිසා ය.

(ලකුණු 01යි)

- වෙනස්වන අභිරුචි සහ වරණයන් ද වර්ධනය වන අවශ්‍යතාවන්ද නිසා භාණ්ඩ හා සේවා සඳහා මිනිසුන් තුළ ඇති ආශාවන් සැබැවින්ම අසීමිත ය. විවිධාකාර වූ සහ ප්‍රසාරණය වන්නා වූ මෙම ඉල්ලුම සපුරාලීම සඳහා ආර්ථිකයේ සම්පත් මත නිරන්තර පීඩනයක් ඇති කෙරේ. අසීමිත වුවමනා හා අවශ්‍යතාවන්ට සාපේක්ෂව සමාජය සතු භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන සම්පත්වල සැපයුම සීමාසහිත ය. හිඟකම පිළිබඳ මෙම නෛසර්ගික ප්‍රශ්නය නිසා ආර්ථිකයක සම්පත් බෙදා වෙන් කිරීමේ දී තේරීම් කිරීමටත්, එහිදී කැපකිරීම් කිරීමටත් අවශ්‍යයෙන් ම සිදු වේ.

(ලකුණු 01යි)

- හිඟකම පිළිබඳ ප්‍රධාන කරුණට අමතර ව ආර්ථිකයක සම්පත් බෙදාවෙන්කිරීමේ දී ගැටලු පැන නැගීමට හේතුවන කරුණු රැසක් පවතී. ඒවා පහත දැක්වේ.

- සම්පත් සඳහා විකල්ප භාවිත තිබීම : සම්පත්වල හිඟකම පමණක් නොව ඒවාට විකල්ප භාවිත තිබීම ද සම්පත් බෙදා වෙන් කිරීමේ දී ගැටලු ඇති කරයි. විකල්ප භාවිත ඇති විට තේරීම් කිරීමට සිදුවේ. තේරීමේ ප්‍රශ්නය ආර්ථික ගැටලුවලට මඟපාදයි.

- සම්පත්වල විවිධත්වය : ගුණාත්මක භාවය, ස්ථානගත වීම සහ විවිධ වුවමනා සඳහා ඒවායේ යෝග්‍යතාව යන කරුණු අතින් සම්පත් විවිධත්වයක් පෙන්නුම් කරයි. මෙම විවිධත්වය නිසා විවිධ වුවමනා හා අවශ්‍යතා සපුරා ගැනීමට යාමේ දී සම්පත් කාර්යක්ෂම ව බෙදා වෙන්කර ගැනීම ගැටලුකාරී වේ.

- තොරතුරු අසමමිතික වීම : බොහෝ අවස්ථාවල ආර්ථිකයේ සම්පත්වල සැපයුම සහ ඒවායේ යෝග්‍යතාව පිළිබඳ නිවැරදි තොරතුරු පුද්ගලයන්ට හෝ ආයතනවලට හෝ නොමැත. එවැනි තත්ති දී නිවැරදි තොරතුරු නොමැතිව සම්පත් බෙදා වෙන්කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණ අකාර්යක්ෂම වනු ඇත.

- වෙළෙඳපොළ අපූර්ණතා : ඒකාධිකාරය, කතිපයාධිකාරය, බාහිරතා සහ පොදු භාණ්ඩ පැවැතීම වැනි කරුණු වෙළෙඳපොළ අපූර්ණතා පිළිබිඹුකරන අතර එවැනි පරිසරයක් තුළ සම්පත් බෙදා වෙන් කිරීම සම්බන්ධ ගනු ලබන තීරණ සමාජයීය ප්‍රශස්ත මට්ටමින් ඈත් විය හැකිය.

- සාධාරණත්වය සැලකිල්ලට ගැනීම : සම්පත් බෙදා වෙන් කිරීමේ දී සමාජයේ පවත්නා ආදායම් ව්‍යාප්ති රටාව සහ සමාජ සාධාරණත්වය සැලකිල්ලට ගැනීමට සිදුවේ. සම්පත් බෙදා වෙන්කිරීමේ දී බොහෝ ආර්ථික පද්ධතිවලට සමානත්වය හා සාධාරණත්වය පිළිබඳ ගැටලුවලට මුහුණ පෑමට සිදුවනු ඇත.

- සංස්කෘතික හා ආයතනික සාධක : සමාජ ප්‍රතිමාන (Social norms), සංස්කෘතික වටිනාකම්, ආයතනික රාමුව වැනි සාධක සම්පත් බෙදා වෙන්කිරීමේ දී තීරණාත්මක බලපෑමක් කරයි. ඒවා ධනාත්මක ලෙස හෝ සෘණාත්මක ලෙස හෝ බලපෑම් ඇති කළ හැකි ය.

- දේශපාලනික හා වෙනත් අභිලාශයන් : දේශපාලනික අවශ්‍යතා මත හෝ වෙනත් පීඩන කණ්ඩායම්වල (Pressure Groups) බලපෑම මත සම්පත් බෙදා වෙන්කිරීම් ප්‍රමුඛතා වෙනස් විය හැකි ය. එවැනි වෙනස්කම් ආර්ථික වශයෙන් අකාර්යක්ෂමතා ඇති කරයි.

(ඕනෑම කරුණු එකකට ලකුණු 01යි, මුළු ලකුණු 03යි)

(ii) - ස්වාභාවික ක්‍රියාවලීන් හෝ මිනිස් මැදිහත්වීම හෝ ඔස්සේ කාලයත් සමඟ ස්වාභාවිකව ම ප්‍රතිපූර්ණය වන හෝ පුනර්ජනනය වන හෝ ස්වාභාවික සම්පත් ප්‍රතිස්ථාපනය කළ හැකි සම්පත් යනුවෙන් අදහස් කෙරේ. (ලකුණු 01යි)

- භාවිතයට ගැනීම නිසා සදාකාලික ක්ෂයවීමකට පාත්‍ර නොවන බැවින් මෙම සම්පත් තිරසාර/ධරණීය සම්පත් ලෙස සැලැකේ. (ලකුණු 01යි)

- උදාහරණ :
  - සූර්යබල ශක්තිය
  - සුළං බල ශක්තිය
  - ජෛව ඉන්ධන
  - භූ තාප ශක්තිය (Geothermal Energy)
  - වනාන්තර (ලී දඬු, දැව)
  - සාගරයේ මත්ස්‍ය සම්පත
  - උදම් බල ශක්තිය

- ජෛව ස්කන්ධ බල ශක්තිය (Bio-mass energy)
- ශාක පදනම් කරගත් කෙඳි (Plant-based Fibre)

(එක් උදාහරණයකට ලකුණු 01යි)
(මුළු ලකුණු 03 යි)

(iii) - ශ්‍රමික විභාජනය ප්‍රධාන යාන්ත්‍රණයන් කීපයක් ඔස්සේ නිෂ්පාදන ක්‍රියාවලින්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දායක වේ.

- විශේෂ ප්‍රාගුණ්‍යනය : ශ්‍රමිකයන් කිසියම් නිශ්චිත කාර්යයක් හෝ ක්‍රියාවලියක් හෝ පිළිබඳ විශේෂ ප්‍රාගුණ්‍යනය කරන විට කාලයත් සමග එම කාර්යය කිරීමේ, නිපුණතා සහ කාර්යක්ෂමතාව වර්ධනය වේ. තම කාර්යය වඩාත් ඉක්මනින් හා නිවැරදිව සම්පූර්ණ කිරීමට විශේෂ ප්‍රාගුණ්‍යනය මගින් අවස්ථාව සැළසේ.

- කුසලතා අනුකරණය අඩුකර ගැනීම (Reduction in skill replication) : ශ්‍රමික විභාජනයක දී සැම සේවකයෙකුට ම පුළුල් පරාසයක කුසලතා ප්‍රගුණ කිරීම අවශ්‍ය කරනවා වෙනුවට ඔවුනට පටු පරාසයක කුසලතා සමූහයක් පමණක් ලබාදීම කෙරෙහි අවධානය යොමු කළ හැකි ය. ශ්‍රම බලකාය හරහා කුසලතා අනුකරණය කිරීමට අවශ්‍ය කරන කාලය සහ මහන්සිය මේ මගින් අඩු කර ගත හැකි වේ.

- කාර්යක්ෂමතාව : ශ්‍රමිකයන් විශේෂ ප්‍රාගුණ්‍යනය කරන විට ඔවුනට නිතර නිතර විවිධ කාර්යයන් අතර මාරුවීමට සිදු නොවේ. ක්‍රියාකාරකම් අතර මාරුවීම් සඳහා ගතවන කාලය අවම කොට වඩාත් සුමට වූ කාර්ය ප්‍රවාහයකට ඉඩ සැළසේ.

- පරිමාණානුකූල පිරිමැසුම් : විශේෂ ප්‍රාගුණ්‍යනය බොහෝ විට මහා පරිමාණ නිෂ්පාදනයට මග පාදයි. එමගින් පරිමාණානුකූල පිරිමැසුම් ඇති වේ. නිෂ්පාදන පරිමාව වැඩි වන විට ඒකකයක් සඳහා වැය වන පිරිවැය අඩු වන අතර නිෂ්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම වේ.

- නවෝත්පාදන සහ තාක්ෂණය : ශ්‍රමිකයන් විශේෂිත වූ කාර්යයන්හි විශේෂ ප්‍රාගුණ්‍යනය කරන විට එම කාර්යයන් විධිමත්ව කිරීමට සහ වැඩි දියුණු කිරීමට ක්‍රම සොයා ගත හැකි ය. මෙය නවෝත්පාදනයන් සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරන නව තාක්ෂණයන් සහ ශිල්ප ක්‍රම බිහිවීමට මග පාදයි.

- ප්‍රමිතිකරණය (Standardisation) : ශ්‍රමික විභාජනය ප්‍රමිතිගත ක්‍රියාවලියකට මග පාදයි. එම නිසා නිෂ්පාදනයේ විචලතාවන් අඩුකර ගත හැකි වේ. මේ සංගතභාවය කරනකොට නිෂ්පාදිතයන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු වන අතර දෝෂ අඩු වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඔනෑම කරුණු හතරකට ලකුණු 04යි)

(iv) - සානුබල නොමැතිකම : විධාන ආර්ථිකයන්හි පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට වෙළෙඳපොළ ආර්ථිකයන්හි දැකිය හැකි ආකාරය ශක්තිමත් මූල්‍ය දිරිගැන්වීම් දැකිය නොහැකි ය. නිෂ්පාදන තීරණ බොහෝ විට රජය විසින් නියම කරනු ලබන බැවින් නවෝත්පාදනය, කාර්යක්ෂමතාව, වෙහෙස මහන්සි වී වැඩ කිරීම යන කරුණු සඳහා අඩු පෙළැඹවීමක් දැකිය හැකි ය.

- **සම්පත් වැරදි ලෙස බෙදා වෙන් කිරීම :** මධ්‍යගත සැලසුම්කරුවනට කාර්යක්ෂම ව සහ පාරිභෝගික වරණයන්ට ගැලපෙන අයුරින් සම්පත් වෙන් කිරීමේ හැකියාවක් නොමැත. මෙමගින් අනවශ්‍ය භාණ්ඩවල අතිරික්තයන් සහ අවශ්‍ය භාණ්ඩවල හිඟයන් ඇති විය හැක. සම්පත් වැරදි ලෙස බෙදා වෙන් කිරීම ආර්ථික අකාර්යක්ෂමතාවට සහ නාස්තියට හේතු වනු ඇත.

- **නිලධාරිවාදී අකාර්යක්ෂමතාව :** විධාන ආර්ථිකයන්හි තීරණ ගැනීම සඳහා විශාල නිලධාරි පංතියක් සිටින අතර ඒ යටතේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය මන්දගාමී, වෙහෙසකාරී සහ දූෂිත එකක් විය හැකි ය. මෙම අකාර්යක්ෂමතාව ආර්ථික වර්ධනයට බාධාවක් වන අතර වෙනස් වන තත්ත්වයන්ට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම ද වළක්වාලයි.

- **පාරිභෝගිකයනට තේරීමක් නොමැති වීම :** විධාන ආර්ථිකයන්හි භාණ්ඩ හා සේවා තෝරා ගැනීමේ දී පාරිභෝගිකයනට ඇත්තේ ඉතා සීමිත තේරීමකි. රජය විසින් නිෂ්පාදනය පාලනය කරන බැවින් වෙළෙඳපොළේ විවිධත්වය සහ නවෝත්පාදනයන් නොමැති කම පාරිභෝගිකයාගේ අතෘප්තියට හේතුවේ.

- **වෙනස්වන තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ දුර්වලතාව :** විධාන ආර්ථිකයකට වෙනස් වන ආර්ථික තත්ත්වයන්ට සහ තාක්ෂණික ප්‍රවර්ධනයන්ට අනුවර්තනය වීමට දැඩි අරගලයක් කිරීමට සිදුවේ. මධ්‍යගත සැලසුම්කරණයේ ඇති දෘඪ ස්වභාවය නිසා අළුත් දේ වලට සහ ප්‍රවණතාවනට ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම ඉතා අභියෝගාත්මකය. අළුත් අවස්ථාවනට හෝ අර්බුදකාරී තත්ත්වයනට හෝ කඩිනමින් ප්‍රතිචාර දැක්වීමට නොහැකි වීම ආර්ථික සංවර්ධනයට බාධාවකි.


- මිල පාලනයන් නිසා කලුකඩ බිහිවීම.
- රාජ්‍ය ඒකාධිකාරය
- ආර්ථික වෘද්ධිය මන්දගාමී වීම.

**(එක් දුර්වලතාවකට ලකුණු 01 බැගින් ඕනෑම දුර්වලතා හතරකට ලකුණු 04යි)**

(v)- ආර්ථිකයක් තම නිෂ්පාදන හැකියා වක්‍රය මත වර්තමානයේ දී තෝරාගනු ලබන ස්ථානය එම ආර්ථිකයට අනාගතයේ දී හිමිවන නිෂ්පාදන හැකියා වක්‍රයේ ස්ථානගත වීම තීරණය වීමෙහි ලා දැඩි බලපෑමක් කරයි. උදාහරණයක් වශයෙන් කිසියම් ආර්ථිකයකට පරිභෝජන භාණ්ඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ යන භාණ්ඩ දෙවර්ගයම නිෂ්පාදනය කිරීමේ හැකියාව ඇතැයි සලකන්න. ප්‍රාග්ධන භාණ්ඩ හා පරිභෝජන භාණ්ඩ ඇතුළත් විවිධ සංයෝග පෙන්නුම් කරන නිෂ්පාදන හැකියා වක්‍රයෙහි ඕනෑම ලක්ෂ්‍යයක් තෝරා ගැනීමට එම ආර්ථිකයට පිළිවන. වර්තමාන නිෂ්පාදනය සඳහා පරිභෝජන භාණ්ඩ විශාල ප්‍රමාණයක් සහ ප්‍රාග්ධන භාණ්ඩ කුඩා ප්‍රමාණයක් ඇතුළත් නිෂ්පාදන සංයෝගයක් තෝරාගනු ලැබුවහොත් එම ආර්ථිකයට වර්තමානයේ ඉතා ඉහළ ජීවන මට්ටමක් හිමිකර ගත හැකි වේ. එහෙත් අනාගතයේ දී එම ආර්ථිකයට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ හැකියාව බෙහෙවින් දුර්වල වනු ඇත. මක්නිසාද යත් ප්‍රාග්ධන භාණ්ඩ ආර්ථික වෘද්ධියේ ප්‍රධාන මූලාශ්‍රයක් වන බැවිනි. එම ආර්ථිකය ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයට වර්තමානයේ වෙන් කරනු ලබන සම්පත් ප්‍රමාණය ඉතා මඳ බැවින් ඉතා අඩු ආර්ථික වෘද්ධියක් පෙන්නුම් කරමින් අනාගත නිෂ්පාදන හැකියා වක්‍රය පිටතට විතැන් වනුයේ ඉතා මඳ වශයෙනි.

**(ලකුණු 01යි)**


- මෙම තත්ත්වය පහත රූපසටහනෙහි මැනවින් පෙන්නුම් කෙරේ. එම ආර්ථිකය වර්තමාන නිෂ්පාදනය සඳහා තෝරා ගනුයේ A - B නිෂ්පාදන හැකියා වක්‍රය මත P ලක්ෂ්‍යයයි. එය පෙන්නුම් කරනුයේ විශාල පරිභෝජන භාණ්ඩ තොගයක් සහ කුඩා ප්‍රාග්ධන භාණ්ඩ තොගයකි. එහි ප්‍රතිඵල වශයෙන් එම ආර්ථිකයට අනාගතයේ දී උරුම වනුයේ අඩු ආර්ථික වෘද්ධියක් පෙන්නුම් කරමින් මද වශයෙන් පිටතට විතැන් වූ C - D නිෂ්පාදන හැකියා වක්‍රයයි.




(නිවැරදි රූපසටහනට ලකුණු 02යි)

- අනිත් අතට වර්තමානයේ සම්පත් විශාල වශයෙන් ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය සඳහා වෙන් කරනු ලබන ආර්ථිකයකට අනාගතයේ දී ප්‍රාග්ධන භාණ්ඩ සහ පරිභෝජන භාණ්ඩ දෙවර්ගයම විශාල වශයෙන් ලබාගත හැකි වන සේ විශාල ආර්ථික වෘද්ධියක් ඇති කරමින් නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන් වේ. මෙයට හේතුව වනුයේ පරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය සමත් වනුයේ වර්තමාන වුවමනා සපුරා ලීමට පමණි. එහෙත් ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය කරනු ලැබුවහොත් අනාගතයේ දී විශාල භාණ්ඩ ප්‍රමාණයක් පරිභෝජනය කිරීමට හැකි වන සේ ආර්ථික වෘද්ධිය වේගවත් වේ. මේ අනුව ආර්ථික වෘද්ධිය තීරණය කෙරෙන වැදගත් සාධකයක් වනුයේ අනාගත පරිභෝජනය වෙනුවෙන් වර්තමාන පරිභෝජනය කැප කිරීමට ඇති හැකියාව ය. (ලකුණු 01යි)

- මෙම තත්ත්වය පහත රූපසටහනෙහි පෙන්නුම් කෙරේ. ආර්ථිකය වර්තමාන නිෂ්පාදනය සඳහා A - B නිෂ්පාදන හැකියා වක්‍රය මත P ලක්ෂ්‍යය තෝරාගනී. P ලක්ෂ්‍යය පිළිබිඹු කරනුයේ විශාල ප්‍රාග්ධන භාණ්ඩ තොගයක් සහ කුඩා පරිභෝජන භාණ්ඩ තොගයකි. වර්තමානයේ කරනු ලබන මෙම තේරීම නිසා එම ආර්ථිකයට අනාගතයේ දී හිමිවනුයේ ඉතා විශාල වශයෙන් පිටතට විතැන් වූ වේගවත් ආර්ථික වෘද්ධියක් පෙන්නුම් කරන C - D නිෂ්පාදන හැකියා වක්‍රයයි.




(නිවැරදි රූපසටහනට ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

**02 වන ප්‍රශ්නය**

2. (i) සාමාන්‍ය භාණ්ඩයක්, බාල භාණ්ඩයක් සහ ගිෆන් භාණ්ඩයක් අතර වෙනස දක්වන්න. (ලකුණු 03යි)
(ii) වෙළෙඳපොළ ආර්ථිකයක මිලෙහි කාර්යයන් සඳහන් කරන්න. (ලකුණු 03යි)
(iii) සැපයුම් වක්‍රයක් ධන බෑවුමක් සහිත වීමට බලපාන හේතු දෙකක් සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04යි)
(iv) රේඛීය ඉල්ලුම් වක්‍රයක් ඉහළ මිල පරාසයන්හි දී වඩාත් මිල නම්‍ය වන්නේත්, පහළ මිල පරාසයන්හි දී වඩාත් මිල අනම්‍ය වන්නේත් ඇයි? (ලකුණු 04යි)
(v) (අ) මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)
(ආ) ඒවා ඉල්ලුම් නීතියට සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 04යි)

02. (i) - සාමාන්‍ය භාණ්ඩ : පාරිභෝගිකයාගේ ආදායම වැඩි වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමානය වැඩි වන සහ පාරිභෝගික ආදායම අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ද අඩුවන ස්වරූපයේ භාණ්ඩයක් සාමාන්‍ය භාණ්ඩයක් ලෙස හැඳින්වේ. (ලකුණු 01යි)

- බාල භාණ්ඩ : පාරිභෝගිකයාගේ ආදායම වැඩි වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු වන සහ පාරිභෝගික ආදායම අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන ස්වරූපයේ භාණ්ඩයක් බාල භාණ්ඩයක් ලෙස හැඳින්වේ. (ලකුණු 01යි)

- ගිෆන් භාණ්ඩ : ගිෆන් භාණ්ඩයක් වූ කලී සුවිශේෂී බාල භාණ්ඩයකි. අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී එවැනි භාණ්ඩයක මිල වැඩි වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ද වැඩි වන අතර මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය ද අඩු වේ. (ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)

(ii) - සළාක කිරීමේ කාර්යය : හිඟ සම්පත් සළාක කිරීම සඳහා මිල උපකාරී වේ. (ලකුණු 01යි)

- සංඥා සැපයීමේ කාර්යය : වෙළෙඳපොළෙහි ඇති භාණ්ඩ හා සේවාවල සාපේක්ෂ හිඟකම හෝ සුලබතාව පිළිබඳ තොරතුරු මිල ගණන් මගින් ඇඟැවේ. (ලකුණු 01යි)

- සානුබල සැපයීමේ කාර්යය : මිල ගණන් නිෂ්පාදකයන්ට සහ පාරිභෝගිකයන්ට සානුබල සපයයි. යම් භාණ්ඩයක මිල ගණන් ඉහළ යන විට එය පාරිභෝගිකයන්ට වැඩි වැඩියෙන් අවශ්‍ය භාණ්ඩයක් බව නිෂ්පාදකයන්ට සංඥා කෙරේ. එයට අනුකූලව නිෂ්පාදනය වැඩි කිරීමට ඔව්හු ක්‍රියා කරති.
- අනික් අතට මිල ගණන් ඉහළ යන විට අඩු මිල විකල්ප කරා යොමු වීමට හෝ එවැනි භාණ්ඩ පරිභෝජනය අඩු කිරීමට හෝ පරිභෝජකයන් පොළඹවනු ලැබේ. (ලකුණු 01යි)

(මුළු ලකුණු 03යි)

(iii) - නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ඉහළ යාම:
නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ඒකක ප්‍රමාණය වැඩිවෙත්ම නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ද වැඩි වේ. නිමැවුම ප්‍රසාරණය කරන විට ආන්තික පිරිවැය ඉහළ යාමට බලපාන ප්‍රධාන හේතු දෙකක් ඇත. ඒවා නම්,

- වැඩි වන ආවස්ථික පිරිවැය නීතිය : වැඩිවන ආවස්ථික පිරිවැය නීතියෙන් ප්‍රකාශ කෙරෙනුයේ කිසියම් භාණ්ඩයක නිමැවුම් ප්‍රමාණය වැඩි කරත්ම අතිරේක භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය ඉහළයාමේ ප්‍රවණතාවක් ඇති බව ය. මෙයට හේතුව සම්පත් සමාජාතිය නොවීම ය. කිසියම් භාණ්ඩයක් නිපදවීමට යෝග්‍ය සම්පත් තවත් භාණ්ඩයක් නිපදවීම සඳහා ඒ තරම් යෝග්‍ය නොවිය හැකි වීම ය. (ලකුණු 01යි)

- හීනවන ආන්තික ඵලදාව : කෙටි කාලයේ දී නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අනිකුත් යෙදවුම් ස්ථාවරව තබා ගනිමින් විචල්‍ය යෙදවුම් වැඩි කරන විට විචල්‍ය යෙදවුම් ආන්තික ඵලදාව ක්‍රමයෙන් පහළ වැටීමට නැඹුරු වේ. හීනවන ආන්තික ඵලදාව ආන්තික පිරිවැය ඉහළ නංවයි. මේ අනුව අතිරේක භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රම ක්‍රමයෙන් වැඩි යෙදවුම් ප්‍රමාණයක් භාවිත කිරීමට සිදුවේ. මෙනිසා වැඩිපුර භාණ්ඩ ඒකකයක් සැපයීමට නිෂ්පාදකයා කැමැති වනුයේ ඒ සඳහා ක්‍රමයෙන් වැඩි වන මිලක් ලැබෙනවා නම් ය. (ලකුණු 01යි)

- නිෂ්පාදන ආයතනවල ලාභ චේතනාව : වෙළෙඳපොළේ මිල ගණන් මත ව්‍යාපාරික ලාභ තීරණය වේ. භාණ්ඩයේ මිල වැඩි වන තරමට නිෂ්පාදකයාගේ දිරිගැන්වීම වැඩි වේ. භාණ්ඩයක හෝ සේවාවක හෝ මිල ඉහළ නගින විට එම භාණ්ඩයේ හෝ සේවාවෙහි හෝ සැපයුම වැඩි කිරීම නිෂ්පාදකයාට වඩාත් ලාභ දායක වේ. (ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

(iv) - ඉල්ලුමේ මිල නම්‍යතාව ගණනය කිරීමේ සූත්‍රය යොදා ගනිමින් මෙය පැහැදිලි කළ හැකිය.

- මිල නම්‍යතා සූත්‍රය : $\frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$ (ලකුණු 01යි)

- මෙහි ΔQ/ΔP යනු රේඛීය ඉල්ලුම් වක්‍රයක බෑවුමේ අගයයි. නැතහොත් බෑවුමේ පරස්පරයේ අගයයි. එම අගය ඉල්ලුම් වක්‍රය මත සෑම ලක්ෂ්‍යයකදී ම ස්ථාවරව පවතී.

- එහෙත් P/Q අනුපාතයේ අගය ඉල්ලුම් වක්‍රය මත සෑම ලක්ෂ්‍යයක් පාසාම වෙනස් වනු ඇත.

- මේ අනුව ඉල්ලුම් වක්‍රයේ ඉහළ මිල පරාසයන්හි දී P/Q අගය පහළ මිල පරාසයන්හිදී ට වඩා ඉහළ අගයක් ගනී. මක්නිසාදයත් ඉහළ මිලයන්හි දී P සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගැනීමත් Q සාපේක්ෂ වශයෙන් කුඩා අගයක් ගැනීමත් නිසා ය.

(ලකුණු 01යි)

- අනික් අතට ඉල්ලුම් වක්‍රයේ පහළ මිල පරාසයන්හි දී P/Q අනුපාතයේ අගය ඉහළ මිල පරාසයන්හිදීට වඩා අඩු අගයක් ගනී. මක්නිසාදයත් P සාපේක්ෂ වශයෙන් අඩු අගයක් ගැනීමත් Q සාපේක්ෂ වශයෙන් වැඩි අගයක් ගැනීමත් නිසා ය.

(ලකුණු 01යි)

- ඉහළ හා පහළ මිල පරාසයන් දෙකේදීම ΔQ/ΔP අගය හෙවත් බෑවුමේ අගය නොවෙනස් ව පවතින නමුත් P/Q අනුපාතයේ අගය ඉහළ මිල පරාසයන්හි දී පහළ මිල පරාසයන්හිදීට වඩා වැඩි අගයක් ගන්නා බැවින් මිල ඉල්ලුම් නම්‍යතා අගය ඉහළ මිල පරාසයන්හිදී ඉහළ අගයක් ගනී.

(ලකුණු 01යි)

විකල්ප පිළිතුර :

(මුළු ලකුණු 04යි)


- ඉල්ලුම් වක්‍රය මත විවිධ ලක්ෂ්‍යයන්හි දී මිල ඉල්ලුම් නම්‍යතාව ජ්‍යාමිතික ක්‍රමයක් ඔස්සේ ද ගණනය කළ හැකි ය. එහිදී ඉල්ලුම් වක්‍රය මත කිසියම් ලක්ෂ්‍යයක සිට ඉල්ලුම් වක්‍රය තිරස් අක්ෂය සමඟ සම්මුඛ වන ස්ථානය දක්වා ඇති ප්‍රස්තාරික දුර ප්‍රමාණය අදාළ ලක්ෂයේ සිට

ඉල්ලුම් වක්‍රය සිරස් අක්ෂය සමග සම්මුඛ වන ස්ථානය දක්වා ඇති ප්‍රස්තාරික දුර ප්‍රමාණයෙන් බෙදූ විට, මිල ඉල්ලුම් නම්‍යතාව ගණනය කළ හැකි ය.

(ලකුණු 02යි)

- මිල ඉල්ලුම් නම්‍යතාව = $\frac{\text{අදාළ ලක්ෂ්‍යයේ සිට පහළට ඇති දුර}}{\text{අදාළ ලක්ෂ්‍යයේ සිට ඉහළට ඇති දුර}}$

- මෙම ජ්‍යාමිතික ක්‍රමය පහත රූප සටහනෙහි දක්වේ.




-N ලක්ෂ්‍යයේ දී මිල නම්‍යතාව = $\frac{\text{N - K දුර ප්‍රමාණය}}{\text{N - P දුර ප්‍රමාණය}}$

(නිවැරදි රූපසටහනට ලකුණු 02යි)

- ඉල්ලුම් වක්‍රයේ ඉහළ මිල පරාසයන්හි දී මිල නම්‍යතාව පහළ මිලයන්හිදීට වඩා වැඩි අගයක් ගන්නා බව මේ මගින් මැනවින් තහවුරු වේ.

(මුළු ලකුණු 04යි)

(v) (අ) ආදායම් ප්‍රතිවිපාකය : ආදායම් ප්‍රතිවිපාකය යනු අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී භාණ්ඩයක මිල වෙනස්වීම නිසා හටගන්නා මූර්ත ආදායම (ක්‍රය ශක්තිය) වෙනස්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩයක හෝ සේවාවක හෝ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස් වීම ය.

- අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී භාණ්ඩයක මිල අඩු වූ විට, පාරිභෝගිකයන්ගේ මූර්ත ආදායම වැඩි වේ. මන්නිසාද යත් පෙරදී මිලදී ගත් භාණ්ඩ ප්‍රමාණයම දූන් ඊට වඩා අඩු මුදල් ප්‍රමාණයකට ලබාගත හැකි බැවිනි. මෙනිසා පාරිභෝගිකයන් දූන් එම භාණ්ඩයම පෙරට වඩා වැඩි ප්‍රමාණයක් සහ වෙනත් භාණ්ඩ මිල දී ගැනීම සඳහා තම ආදායම වැය කිරීමට පෙළඹෙනු ඇත.

(ලකුණු 01යි)

- ආදේශන ප්‍රතිවිපාකය : අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී භාණ්ඩයක මිල වෙනස් වුවහොත් හටගන්නා සාපේක්ෂ මිල වෙනසෙහි ප්‍රතිඵල වශයෙන් අදාළ භාණ්ඩය මිල දී ගන්නා ප්‍රමාණය වෙනස් වීම ආදේශන ප්‍රතිවිපාකය ලෙස හැඳින්වේ.

- අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල අඩු වූ විට මිල වෙනස් නොවූ අනිකුත් භාණ්ඩවලට සාපේක්ෂ ව මෙම භාණ්ඩය ලාභ භාණ්ඩයක් බවට පත් වේ.

ආදේශ කිරීමට පාරිභෝගිකයෝ පෙළඹෙති.

- එසේම අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල වැඩි වුවහොත් මිල වෙනස් නොවූ සෙසු භාණ්ඩවලට සාපේක්ෂව මෙම භාණ්ඩය මිල අධික භාණ්ඩයක් බවට පත්වේ. පාරිභෝගිකයෝ සාපේක්ෂව මිල අධික මෙම භාණ්ඩය මිල දී ගැනීම අඩුකොට එම භාණ්ඩයේ ආදේශක වැඩි වශයෙන් මිලට ගැනීමට පෙළඹෙති.

(ලකුණු 01යි)

(ආ)- ඉල්ලුම් නීතියෙන් ප්‍රකාශ වන්නේ අනිකුත් කරුණු නො වෙනස්ව තිබිය දී කිසියම් භාණ්ඩයක මිල ඉහළ ගියහොත් එම භාණ්ඩය ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩු කරන බවත් එම භාණ්ඩයේ මිල පහළ වැටුනොත් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි කරන බවත් ය. එනම් මිල හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධයක් ඇති බව ය.

(ලකුණු 02යි)

- මෙම ඉල්ලුම් නීතිය ආදායම් හා ආදේශන ප්‍රතිවිපාකයන්හි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස පෙන්වා දිය හැකි ය. අනිකුත් කරුණු නොවෙනස් ව තිබිය දී භාණ්ඩයේ මිල අඩු වන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වැඩි වන්නේ මූර්ත ආදායම ඉහළ යාමෙන් හටගන්නා ආදායම් ප්‍රතිවිපාකය හා සාපේක්ෂ ව එම භාණ්ඩය ලාභ භාණ්ඩයක් වීම ඔස්සේ හට ගන්නා ආදේශන ප්‍රතිවිපාකය යන දෙකෙහි එකතුව මත ය.

(ලකුණු 01යි)

- එලෙසම මිල ඉහළ යන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයත් අඩු වන්නේ ද මෙම ප්‍රතිවිපාක දෙක නිසා ය. මිල ඉහළ ගිය විට මූර්ත ආදායම අඩු වීම හටගන්නා ආදායම් ප්‍රතිවිපාකය සහ සාපේක්ෂව මිල අධික වීම හට ගන්නා ආදේශන ප්‍රතිවිපාකය යන දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස ය.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 06යි)

**03 වන ප්‍රශ්නය**

3. (i) භාණ්ඩයක් මත පනවනු ලබන ඒකක බද්දක් නිසා වෙළෙඳපොළ මිලත් මිල දී ගනු ලබන ප්‍රමාණයත් යන දෙකම නොවෙනස් ව පැවතිය හැක්කේ කවර තත්ත්වයන් යටතේ දී ද? ඔබේ පිළිතුර රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න පැහැදිලි කරන්න.

(අ) පාරිභෝගික අතිරික්තය ප්‍රස්තාරික ව පෙන්නුම් කරනුයේ ඉල්ලුම් වක්‍රයට පහළින් සහ සැපයුම් වක්‍රයට ඉහළින් ඇති ප්‍රදේශයෙනි.

(ආ) සැපයුමේ අඩුවීමක් නිසා වෙළෙඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් පාරිභෝගික අතිරික්තය වැඩි වේ.

(ඉ) ඉල්ලුම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාණ්ඩයක වෙළෙඳපොළ මිල පහළ වැටේ නම් අමතර නිෂ්පාදක අතිරික්තයක් බිහි වේ. (02 × 3 = ලකුණු 06යි)

(iii) X සඳහා වෙළෙඳපොළ ඉල්ලුම වක්‍රය $Q_D = 120 - 0.5P$ වන අතර, X සඳහා වෙළෙඳපොළ සැපයුම් වක්‍රය $Q_S = -30 + P$ ලෙස උපකල්පනය කරන්න. (ප්‍රමාණ ඒකක මිලියනවලිනි)

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය කවරක් ද? (ලකුණු 02යි)


(ආ) කිලෝග්‍රෑමයකට රු. 120ක අවම මිලක් නියම කරමින් 'මිල ආධාරක වැඩසටහනක්' හඳුන්වාදීමට රජය තීරණය කොට තිබේ යැයි සලකන්න. මෙම වෙළෙඳපොළෙහි අධි සැපයුම කොපමණ ද? (ලකුණු 02යි)

(ඉ) මෙම වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද? (ලකුණු 02යි)

(ඊ) මිල ආධාරක වැඩසටහන නිසා අභිමිවන ශුන්‍ය සායනයේ (dead-weight loss) ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 04යි)

03. (i) - භාණ්ඩයක් මත ඒකක බද්දක් පැනවූ පසුව වෙළෙඳපොළ මිල සහ මිල දී ගත් ප්‍රමාණය යන දෙකම වෙළෙඳපොළේ පවත්නා යම් සුවිශේෂී ලක්ෂණ නිසා නොවෙනස් ව තිබිය හැකි ය. එනම් සැපයුම සම්පූර්ණයෙන්ම අනම්‍ය වූ විට, සම්පූර්ණ බද්ද විකුණුම්කරු විසින් ම දරනු ලැබේ. වෙළෙඳපොළ මිල ත් මිලදී ගත් ප්‍රමාණය ත් එහිදී නොවෙනස් ව පවතිනු ඇත. බද්දේ ප්‍රතිඵලය වන්නේ විකුණුම්කරුවාට ලැබෙන මිල අඩු වීම ය. **(ලකුණු 02යි)**

- පහත රූපසටහනෙහි දක්වෙන්නේ පූර්ණ අනම්‍ය සැපයුම් වක්‍රයක් (S) සහ සාමාන්‍ය ස්වරූපයේ පහළට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයකි (D). බද්දක් නොමැති තත්ත්වය යටතේ භාණ්ඩයේ මිල රු. 50ක් වන අතර එම මිලේ දී භාණ්ඩ ඒකක 100ක් මිලදී ගනී. දැන් භාණ්ඩය මත ඒකකයට රු. 10ක් වූ ඒකක බද්දක් පැනවූවා යයි සලකන්න. සැපයුම පූර්ණ අනම්‍ය බැවින් බද්දට පසුව ද සැපයුම් වක්‍රයේ කිසිදු වෙනසක් හට නොගනී. භාණ්ඩයේ වෙළෙඳපොළ මිලෙහි කිසිදු වෙනසක් සිදු නොවේ. එහෙත් විකුණුම්කරුවාට ලැබෙන මිල රු. 40ක් වේ. සම්පූර්ණ බද්ද විකුණුම්කරුවා විසින් දරනු ලැබේ.




**(නිවැරදි රූපසටහන සහිත පැහැදිලි කිරීමට ලකුණු 02යි)**

**(මුළු ලකුණු 04යි)**

(ii) (අ) අසත්‍යය : පාරිභෝගික අතිරික්තය ප්‍රස්තාරික ව පෙන්නුම් කරනුයේ ඉල්ලුම් වක්‍රයට පහළින් සහ වෙළෙඳපොළ මිලට ඉහළින් ඇති ප්‍රදේශය වශයෙනි. එමගින් දක්වෙනුයේ ඉල්ලුම් වක්‍රයෙන් පෙන්නුම් කරන පරිදි භාණ්ඩයේ විවිධ ප්‍රමාණ සඳහා පාරිභෝගිකයන් ගෙවීමට කැමැති මිලත් ඒ භාණ්ඩ ප්‍රමාණ සඳහා ඔවුනට ගෙවීමට සිදුවන සැබෑ වෙළෙඳපොළ මිලත් අතර වෙනස ය. එබැවින් එය ඉල්ලුම් වක්‍රයට පහළින් සහ සැපයුම් වක්‍රයට ඉහළින් ඇති ප්‍රදේශය විය යුතු ය. ප්‍රදේශය නොව ඉල්ලුම් වක්‍රයට පහළින් සහ වෙළෙඳපොළ මිලට ඉහළින් ඇති ප්‍රදේශය විය යුතු ය.

(ලකුණු 02යි)

(ආ) - අසත්‍යය : සැපයුම අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳපොළ මිල ඉහළ යාම නිසා පාරිභෝගික අතිරික්තය වැඩි විය නොහැකි ය. පාරිභෝගික අතිරික්තය ප්‍රස්තාරිකව පෙන්නුම් කරනුයේ සමතුලිත ඉල්ලුම් ප්‍රමාණය තෙක් වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයත් වෙළෙඳපොළ මිලත් අතර ඇති ත්‍රිකෝණාකාර ප්‍රදේශයයි. සැපයුම අඩුවීම නිසා මිල ඉහළ යන විට ඉල්ලුමේ කරනු ලබන ප්‍රමාණය පහත වැටේ. මෙය පාරිභෝගික අතිරික්තයේ අඩුවීමක් ඇති කරයි.

(ලකුණු 02යි)

(ඉ)- අසත්‍යය : ඉල්ලුම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳපොළ මිල පහත වැටේ නම් අතිරේක නිෂ්පාදක අතිරික්තයක් උත්පාදනය කළ නොහැක. නිෂ්පාදක අතිරික්තය ප්‍රස්තාරිකව පෙන්නුම් කරනුයේ සමතුලිත සැපයුම් ප්‍රමාණය තෙක් වෙළෙඳපොළ සැපයුම් වක්‍රයත් වෙළෙඳපොළ මිලත් අතර ත්‍රිකෝණාකාර ප්‍රදේශයයි. ඉල්ලුම අඩු වූ විට නිෂ්පාදකයන් අඩු මිලට පෙර ප්‍රමාණයම සැපයීමට අකමැති බැවින් මිල පහත වැටේ. මෙම තත්ත්වය යටතේ නිෂ්පාදක අතිරික්තය අඩු වනු ඇත.

(ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

(iii) (අ)

- $Q_D = Q_S$
- $120 - 0.5P = -30 + P$
- $0.5P + P = 120 + 30$
- $1.5P = 150$
- $P = 150 \div 1.5 = 100$
- සමතුලිත මිල රු. 100

(ලකුණු 01යි)

- සමතුලිත ප්‍රමාණය
- $Q_D = 120 - 0.5P$
- $Q_D = 120 - 0.5(100)$
- $Q_D = 120 - 50 = 70$
- සමතුලිත ප්‍රමාණය = ඒකක මිලියන 70

(ලකුණු 01යි)

(ආ) රු. 120ක අවම මිලක් නියම කළ විට අධි සැපයුම :

- අවම මිල යටතේ සපයනු ලබන ප්‍රමාණය $= -30 + P = (120)$
  $= 120 - 30 = 90$
- අවම මිල යටතේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය $= 120 - 0.5(120)$
  $= 120 - 60 = 60$

(ලකුණු 01යි)

- අධි සැපයුම = අවම මිල යටතේ සැපයුම් කරනු ලබන ප්‍රමාණය - අවම මිල යටතේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය (ලකුණු 01යි)

  = 90 - 60 = ඒකක මිලියන 30

(ඉ) වැඩසටහන සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය :


- රජයේ පිරිවැය = අධි සැපයුම් ප්‍රමාණය × අවම මිල
  = 30 × 120 = 3600
  = රු.මිලියන 3600 (ලකුණු 02යි)

(ඊ) මිල ආධාරක වැඩසටහන නිසා අහිමිවූ ශුභසාධනයේ ප්‍රමාණය:

- අවම මිල නිසා සම්පත් භාවිතය අකාර්යක්ෂම වීම නිසා හට ගන්නා පිරිවැය අහිමිවන ශුභසාධනය වේ.
- ප්‍රස්තාරිකව අහිමි වූ ශුභසාධනය මිනිය හැක්කේ අකාර්යක්ෂම නිමැවුම් ප්‍රමාණයට අදාළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අතර ඇති ත්‍රිකෝණාකාර ප්‍රදේශයේ ක්ෂේත්‍රඵලය ගණනය කිරීමෙනි.
- අකාර්යක්ෂම නිමැවුම් ප්‍රමාණය = අවම මිල යටතේ සපයනු ලබන ප්‍රමාණය (=90)
  - ප්‍රශස්ත සැපයුම් ප්‍රමාණය (සමතුලිත ප්‍රමාණය) (=70)
  90 - 70 = ඒකක මිලියන 20 (ලකුණු 01යි)

- අහිමි වූ ශුභසාධනය = 1/2 (අකාර්යක්ෂම නිමැවුම් ප්‍රමාණය (90 - 70) x (අකාර්යක්ෂම අවසාන නිමැවුම් ඒකකයේ ආන්තික පිරිවැය (B-K = 120) - අවසාන නිමැවුම් ඒකකය ආන්තික අය භාරය (C-K = 60) (ලකුණු 02යි)

- අහිමි වූ ශුභසාධනය = 1/2 (20 × (120 - 60)
  = 1/2 (20 × 60) = 600
  = රු.මිලියන 600 (ලකුණු 01යි)




(පිළිතුර සඳහා ප්‍රස්තාරය ඇඳ දැක්වීම අවශ්‍ය නොවේ.)

(මුළු ලකුණු 04යි)

**04 වන ප්‍රශ්නය**

4. (i) ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය අතර වෙනස කවරක් ද? (ලකුණු 04යි)
(ii) කතිපයාධිකාරී වෙළෙඳපොළක ප්‍රධාන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)
(iii) පූර්ණ තරගකාරී වෙළෙඳපොළක නිෂ්පාදන ආයතනයක් මිල ගනුවෙකු වන්නේ නම් නිෂ්පාදිත සඳහා අයකරනු ලබන මිල තමා ම තෝරාගත නොහැකි වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) කැරට් සඳහා පූර්ණ තරගකාරී වෙළෙඳපොළක් ඇතැයි උපකල්පනය කරන්න. වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයක් රු. 200ක් වේ. සරත් කැරට් ගොවියකු වන අතර එය සතියක දී කිලෝග්‍රෑම් 50ක් අලෙවි කරයි. ඔහුගේ ආන්තික පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 150ක් වේ.
(අ) සතියක දී සරත්ගේ මුළු අයභාරය සහ ආන්තික අයභාරය ගණනය කරන්න. (ලකුණු 02යි)
(ආ) සරත් ලාභ උපරිම කරන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)
(ඉ) කැරට් වෙළෙඳපොළ මිල කිලෝග්‍රෑමයකට රු. 100ක් දක්වා පහළ බසින අතර, සරත් සතියක දී අලෙවිකරන ප්‍රමාණය කිලෝග්‍රෑම් 30ක් දක්වා අඩු කරයි. ඔහුගේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 80ක් දක්වා පහළ බසින අතර ආන්තික පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 100ක් දක්වා පහළ බසී. ඔහුගේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 40ක් දක්වා ඉහළ යයි. ඔහු ලාභ උපරිම කරන්නේ ද? ඔහු ආර්ථික ලාභ උපයන්නේ ද? නැතහොත් පාඩු ලබන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

04.(i) - ගිණුම්කරණ ලාභය යනු ආයතනයේ මුළු අයභාරයෙන් ප්‍රත්‍යක්ෂ පිරිවැය (Explicit cost) හෙවත් සෘජු පිරිවැය අඩු කළ විට ශේෂ වන ප්‍රමාණයයි. එය සමාගමක මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන ලාභය නියෝජනය කරන අතර සම්මත ගිණුම්කරණ මූලධර්ම මත පදනම් වේ. **(ලකුණු 02යි)**

- ආර්ථික ලාභය යනු ප්‍රත්‍යක්ෂ පිරිවැය සහ ආරෝපිත පිරිවැය (Implicit cost) හෙවත් ව්‍යංග පිරිවැය යන දෙකම සලකා බලන පුළුල් මිනුමක් වේ. මෙම පිරිවැය දෙකොටසම එක්ව ගත් විට එය ආර්ථික පිරිවැය නැතහොත් ආවස්ථික පිරිවැය ලෙස නම් කෙරේ. මේ අනුව ආර්ථික ලාභය යනු ආයතනයේ මුළු අයභාරයෙන් ආවස්ථික පිරිවැය අඩු කළ විට ලැබෙන ශේෂයයි. **(ලකුණු 02යි)**

**(මුළු ලකුණු 04යි)**

(ii)- කතිපයාධිකාරී වෙළෙඳපොළක ලක්ෂණ :
- නිෂ්පාදන ආයතන සංඛ්‍යාව අතළොස්සක් වන නමුදු එක් එක් ආයතනයේ ප්‍රමාණය ඉතා විශාල වීම.
- සමජාතීය හෝ ප්‍රභේදිත භාණ්ඩ පැවැතීම.
- ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාව
- ප්‍රවේශයට බාධා පැවතීම
- මිල දෘඪතාව (price rigidity)
- නොමිල තරගය (non-price competition)
- කුමන්ත්‍රණකාරී ලෙස එකතු වී ක්‍රියාකිරීමේ හැකියාව (Collusion possibility)
- ව්‍යවර්තිත ඉල්ලුම් වක්‍රයක් පැවැතිය හැකි වීම.

**(ඕනෑම ලක්ෂණයකට ලකුණු 01 බැගින් ලක්ෂණ හතරකට ලකුණු 04යි)**

(iii) - පූර්ණ තරගකාරී වෙළෙඳපොළක නිෂ්පාදන ආයතනයක් මිල ගනුවෙකු ලෙස සලකනු ලබන්නේ එයට වෙළෙඳපොළ මිල කෙරෙහි බලපෑමක් කළ නොහැකි නිසා සහ තම භාණ්ඩය අලෙවි කිරීමට තමන් කැමති මිලක් තෝරා ගැනීමට ආයතනයට හැකියාවක් නොමැති බැවිනි. මෙම ලක්ෂණය පූර්ණ තරගකාරී වෙළෙඳපොළක මූලික අංගයක් වන අතර එය පදනම් වනුයේ වෙළෙඳපොළ පිළිබඳ උපකල්පන කිපයක් මත ය. **(ලකුණු 02යි)**

- එම උපකල්පන වනුයේ (i) ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම (ii) සමජාතීය භාණ්ඩයක් පැවැතීම. (iii) පූර්ණ තොරතුරු තිබීම සහ (iv) අබාධ ප්‍රවේශය සහ පිටවීමයි. මෙම තත්ත්වයන් යටතේ ආයතන තනි තනිව ගත්විට ඔවුනට වෙළෙඳපොළ මිල කෙරෙහි කිසිදු බලපෑමක් කිරීමට හැකියාවක් නැත. එහි ප්‍රතිඵල වශයෙන් ආයතන කරනුයේ පවත්නා වෙළෙඳපොළ මිල එලෙසම බාරගෙන එම මිලට අනුව ලාභ උපරිම කිරීමට තම නිමැවුම් ප්‍රමාණය ගළපා ගැනීම ය. (ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

(iv) (අ)- මුළු අයභාරය (TR) = භාණ්ඩයේ මිල (P) x අලෙවි කළ භාණ්ඩ ප්‍රමාණය (Q)

- ආන්තික අයභාරය (MR) = මුළු අයභාරයේ වෙනස් වීම (ΔTR) ÷ අලෙවි කළ ප්‍රමාණයේ වෙනස් වීම (ΔQ)
- මිල (P) = රු. 200        අලෙවි කළ ප්‍රමාණය (Q) = 50kg
- මුළු අයභාරය (TR) = 200 x 50 = රු. 10,000 (ලකුණු 01යි)

- ආන්තික අයභාරය (MR) = සරත් සතියකට කිලෝග්‍රෑම් 50ක් කිලෝග්‍රෑමයක් රු. 200ක ස්ථාවර මිලකට අලෙවිකරන බැවින් අලෙවිකරන සෑම අතිරේක ඒකකයකට ලැබෙනුයේ රු. 200කි. එබැවින් ඔහුගේ ආන්තික අයභාරය (MR) රු. 200කි. (ලකුණු 01යි)

(ආ)- තරගකාරී වෙළෙඳපොළක ලාභ උපරිමනයට අවශ්‍ය කොන්දේසිය වනුයේ ආන්තික අයභාරය (MR) ආන්තික පිරිවැය (MC) ට සමාන වන නිමැවුම් ප්‍රමාණයක් අලෙවි කිරීම ය.

- මෙම අවස්ථාවේ දී සරත්ගේ ආන්තික පිරිවැය කිලෝග්‍රෑමයකට රු. 150ක් වන අතර ආන්තික අයභාරය රු. 200කි. MR > MC බැවින් ඔහු ලාභ උපරිම නොකරයි. (ලකුණු 01යි)

- ආන්තික අයභාරයට සමාන වන ලෙස ආන්තික පිරිවැය ඉහළ නංවා ගත හැක්කේ නිෂ්පාදනය ප්‍රසාරණය කළහොත් ය. නිෂ්පාදනය වැඩි කරන විට MC ක්‍රමයෙන් ඉහළ යනු ඇත. (ලකුණු 01යි)

(ඉ)- කැරට් කිලෝග්‍රෑමයක මිල රු. 100ක් දක්වා පහත වැටී ඇති විට කිලෝග්‍රෑම් 30ක් නිෂ්පාදනය කිරීමේ ආන්තික පිරිවැය ද රු. 100ක් වේ. MR = MC බැවින් මෙහිදී සරත් ලාභ උපරිම කරයි. (ලකුණු 01යි)

- ආර්ථික ලාභය හෝ අලාභය :
- ආර්ථික ලාභය = මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC)
- මුළු අයභාරය (TR) = 100 × 30 = 3000
- මුළු පිරිවැය (TC) = සාමාන්‍ය මුළු පිරිවැය (ATC) x Q
- සාමාන්‍ය මුළු පිරිවැය (ATC) = සාමාන්‍ය විචල්‍ය පිරිවැය (ATC) + සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)
- සාමාන්‍ය මුළු පිරිවැය (ATC) = 80 + 40 = 120
- මුළු පිරිවැය TC = 120 × 30 = රු. 3600 (ලකුණු 01යි)

- ආර්ථික ලාභය = මුළු අයභාරය (TR) - මුළු පිරිවැය (TC)
  = 3000 - 3600 = - රු. 600 ~~(ලකුණු 01යි)~~ 2
- සරත් ආර්ථික ලාභයක් ඉපැයීමට අසමත් වේ. ඔහු අලාභ ලබයි. මුළු අලාභය රු. 600කි. (එක කිලෝග්‍රෑමයකට රු. 20 ක අලාභයක් හට ගනී.) ~~(ලකුණු 01යි)~~

(මුළු ලකුණු 08යි)

**05 වන ප්‍රශ්නය**

5. (i) පහත සඳහන් සිදුවීම දළ දේශීය නිෂ්පාදිතයට බලපාන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.
   (අ) එහා ක්‍රියාත්මක වන පරිදි තම වැටුප් අඩු කිරීමට පක්ෂව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරති.
   (ආ) නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ අපේක්ෂාවෙන් ආයෝජකයෙක් ඉඩමක් මිල දී ගනී. (ලකුණු 04යි)
   (ඉ) විශ්‍රාමික සේවකයෙක් තම විශ්‍රාමික දීමනාවේ රු. 2 500ක වැඩිවීමක් හිමිකර ගනී.
   (ඊ) ආයතන තමන්ගේ පරිලේඛන (inventories) වැඩිකර ගනී. (ලකුණු 04යි)
(ii) දළ දේශීය ආදායම ගණනය කිරීමේ දී ඇතුළත් කරගනු ලබන ප්‍රාථමික ආදායමේ ප්‍රධාන අංශ කවරේ ද? (ලකුණු 02යි)
(iii) රජය රු. බිලියන 100කින් සංක්‍රාම ගෙවීම් වැඩි කරන බවත් ඒ හා සමාන ප්‍රමාණයකින් ස්වායත්ත බදු ඉහළ නංවන බවත් සලකන්න. මෙම වෙනස නිසා ආර්ථිකය මත ඇති වන ශුද්ධ බලපෑම කුමක් ද? පිළිතුර පැහැදිලි කරන්න.
(iv) කිසියම් කල්පිත ආර්ථිකයක් සඳහා පහත දැක්වෙන පාර්ශ්ව ආර්ථික ආදර්ශය උපකල්පනය කරන්න.

| | | |
|---|---|---|
| පරිභෝජනය (C) | = | $420 + 0.8Y_D$ |
| සංක්‍රාම ගෙවීම් (Tr.) | = | 200 |
| ස්වායත්ත බදු (T) | = | 250 |
| ආයෝජනය (I) | = | 160 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) | = | 100 |
| ශුද්ධ අපනයන (NX) | = | −40 |

*(සියලුම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි)* (ලකුණු 04යි)
   (අ) මෙම ආර්ථිකය සඳහා සමතුලිත ජාතික ආදායම මට්ටම කොපමණ ද? (ලකුණු 02යි)
   (ආ) වැයකළහැකි ජාතික ආදායම සහ සමාහාර ඉතුරුම් ගණනය කරන්න.
   (ඉ) සමතුලිත ජාතික ආදායම රු. බිලියන 4 000ක් කරා ළඟා වීමට ආයෝජන වියදම් කොතරම් ප්‍රමාණයකින් වෙනස් කළ යුතු වේ ද? (ලකුණු 04යි)

05.(i) (අ) - දළ දේශීය නිෂ්පාදිතය පහළ වැටේ. දළ දේශීය නිෂ්පාදිතය යනු යම් නිශ්චිත කාලයක් තුළ රටේ දේශසීමාව තුළ නිෂ්පාදනය කරන ලද අවසාන භාණ්ඩ හා සේවාවල මුළු වටිනාකම ය. වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වැටුප් වියදම ආණ්ඩුවේ පරිභෝජන වියදමේ සංරචකයක් ලෙස සැළකේ. එබැවින් වැටුප් අඩු වන විට රජයේ පරිභෝජන වියදම ද අඩු වන බැවින් දළ දේශීය නිෂ්පාදිතයේ අගය අඩුවීමට එය හේතු වේ.

(ලකුණු 01යි)

(ආ)- ආයෝජකයකු විසින් බිම් කැබැල්ලක් මිලට ගැනීම සඳහා කරනු ලබන වියදම දළ දේශීය නිෂ්පාදිතයට බලපෑමක් නොකරයි. දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වන්නේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල වටිනාකම හෝ ඒවා මත කරනු ලබන වියදමයි. ඉඩම මිලදී ගැනීම හුදු මූල්‍යමය ගනුදෙනුවක් පමණක් මිස නිෂ්පාදන ක්‍රියාකාරකමක් පිළිබිඹු නොකරයි.

(ලකුණු 01යි)

(ඉ)- විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාමික දීමනාව රු. 2500කින් ඉහළ යාම දළ දේශීය නිෂ්පාදිතයට බලපෑමක් නොකරයි. එය රජයේ සංක්‍රාම වියදමකි. සංක්‍රාම වියදම් ඵලදායී ආර්ථික ක්‍රියාකාරකමක් නිරූපණය නොකරන බැවින් දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් නොවේ.

(ලකුණු 01යි)

(ඊ)- ආයතන තම පරිලේඛන වැඩි කර ගැනීම දළ දේශීය නිෂ්පාදිතයට සෘජුවම බලපායි. ආයතනවල පරිලේඛන වැඩි වීම පෙන්නුම් කරනුයේ ආයතන වර්තමානයේ අලෙවි කරනු ලැබූ ප්‍රමාණයට වඩා වැඩියෙන් භාණ්ඩ නිෂ්පාදනය කර ඇති බව ය. එය ඵලදායී ආර්ථික

කටයුත්තක් වන අතර එම අගය දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයේ සංරචකයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී සැලකිල්ලට ගැනේ. (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ii) - දළ දේශීය ආදායම යනු යම් නිශ්චිත කාලයක් තුළ රටක දේශ සීමා තුළ ජනනය කරන ලද මුළු ආදායමේ මිනුමකි. විවිධ ප්‍රාථමික ආදායම් මූලාශ්‍ර ඊට ඇතුළත් වන අතර එහි ප්‍රධාන සංරචක පහත දක්වෙන ලෙස වර්ග කළ හැකි ය.

- වැටුප් සහ වේතන
- ලාභ
- පොලිය සහ ආයෝජන ආදායම්
- බදු කුලී

(එක් අයිතමයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04යි)

විකල්ප පිළිතුරු (1) :

- ප්‍රාථමික ආදායම් යනු නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වීම නිසා හෝ නිෂ්පාදනයට යොදා ගැනෙන වත්කම්වල හිමිකාරිත්වය නිසා හෝ ආයතනික ඒකක උපයා ගනු ලබන ආදායම් වේ. ප්‍රාථමික ආදායම් ප්‍රධාන සංරචක මෙසේ දක්විය හැකි ය.

- සේවක ආදායම් : නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ශ්‍රම දායකත්වය ලබා දීම වෙනුවෙන් ලැබෙන ආදායම් (ලකුණු 01යි)

- දේපළ ආදායම් : මූල්‍ය හෝ ස්වාභාවික සම්පත් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ණයට හෝ කුලියට ලබා දීම වෙනුවෙන් ලැබෙන ආදායම් වේ. පොලිය, බදු කුලී හා ලාභ මීට ඇතුළත් වේ. (ලකුණු 02යි)

- නිෂ්පාදනය සහ ආනයන මත සහනාධාර අඩු කළ බදු : මෙය නිෂ්පාදන ක්‍රියාවලියට දායක වීම වෙනුවෙන් රජය උපයා ගන්නා ආදායමයි. (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

විකල්ප පිළිතුරු (2) :

- සේවක ගෙවීම්
- දළ මෙහෙයුම් අතිරික්තය
- දළ මිශ්‍ර ආදායම්
- නිෂ්පාදනය හා ආනයන මත සහනාධාර අඩු කළ බදු

(එක් කරුණකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 04යි)

(iii) - රජය බිලියන 100කින් සංක්‍රාම ගෙවීම් වැඩිකොට ඒ හා සමාන ප්‍රමාණයකින්ම බදු වැඩිකරනු ලැබුවහොත් මුළු ආදායම හෝ සමාහාර ඉල්ලුම හෝ මත ඇතිකරන ශුද්ධ බලපෑම ශූන්‍ය වේ. මෙය රාජ්‍ය මූල්‍ය සේදීමක් (Fiscal wash) නැතහොත් රාජ්‍ය මූල්‍ය මධ්‍යස්ථතාවක් (Fiscal neutrality) ලෙස හැඳින්වේ. (ලකුණු 01යි)

- රජය බදු වෙනස් කළ විට හෝ සංක්‍රාම ගෙවීම් වෙනස් කළ විට හෝ සමස්ත වියදම මත සෘජු බලපෑමක් ඇති නොවේ. සමස්ත වියදම වෙනස් වනුයේ වැය කළ හැකි ආදායම වෙනස් වීම

ඔස්සේ සමස්ත ඉල්ලුම වෙනස් වීමෙනි. ඒ අනුව රජය සංක්‍රාම ගෙවීම් බිලියන 100කින් වැඩි කළ විට වැය කළ හැකි ආදායම බිලියන 100කින් ඉහළ නගී. අනික් අතට එම ප්‍රමාණයෙන් ම බදු වැඩි කළ විට වැය කළ හැකි ආදායම බිලියන 100කින් පහළ වැටේ. මේ නිසා වැය කළ හැකි ආදායමේ කිසිදු වෙනසක් හට නොගන්නා අතර ආර්ථිකය මත ඇති වන ශුද්ධ බලපෑම ශුන්‍ය වේ.

(ලකුණු 01යි)

(මුළු ලකුණු 02යි)

(iv) (අ) සමතුලිත ජාතික ආදායම :

- $Y = C+I+G+NX$ (ලකුණු 01යි)
- $Y = 420+0.8Y_D+160+100+(-40)$
- $Y = 420+0.8(Y+Tr-T)+260-40$ (ලකුණු 01යි)
- $Y = 420+0.8(Y+200-250)+260-40$
- $Y = 420+0.8Y+160-200+220$

$Y = 420+0.8Y+180$

$Y = 600+0.8Y$ (ලකුණු 01යි)

$0.2Y = 600; \quad Y = 3000$

- සමතුලිත ජාතික ආදායම = රු.බි. 3000 (ලකුණු 01යි)

(මුළු ලකුණු 04යි)

(ආ) - වැය කළ හැකි ජාතික ආදායම සහ සමාහාර ඉතුරුම් :

- වැය කළ හැකි ජාතික ආදායම = දළ ජාතික ආදායම + ශුද්ධ විදේශ සංක්‍රාම ලැබීම් - ශුද්ධ විදේශ සාධ්‍ය බදු ගෙවීම්
- ශුද්ධ විදේශ සංක්‍රාම ලැබීම් = 0
- ශුද්ධ විදේශ සාධ්‍ය බදු ගෙවීම් = 0
- වැය කළ හැකි ජාතික ආදායම $(Y_D)$ = 3000+0-0

= රු.බිලියන 3000 (ලකුණු 01යි)

- සමාහාර ඉතුරුම් = පෞද්ගලික ඉතුරුම් $(S_P)$ + රජයේ ඉතුරුම් $(S_G)$
- පෞද්ගලික ඉතුරුම් $(S_P)$ = වැය කළ හැකි පෞද්ගලික ආදායම - පෞද්ගලික පරිභෝජනය
- වැය කළ හැකි පෞද්ගලික ආදායම = දළ ජාතික ආදායම (Y) + සංක්‍රාම ලැබීම් - සාධ්‍ය බදු

$= 3000+200-250$

$= 2950$

- පෞද්ගලික පරිභෝජනය (C) $= 420+0.8(2950)$

$= 420+2360 = 2780$

- පෞද්ගලික ඉතුරුම් $(S_P)$ = $2950-2780 = 170$
- රජයේ ඉතුරුම් $(S_G)$ = ශුද්ධ බදු (NT) - ආණ්ඩුවේ මිල දී ගැනීම් (G)

= $(250-200)-100$

= $50-100 = -50$

- සමාහාර ඉතුරුම් = $170+(-50) = 120$

රු. බිලියන 120

(ලකුණු 01යි)

විකල්ප පිළිතුර (1) :

- සමාහාර ඉතුරුම් (S) = වැය කළ හැකි ජාතික ආදායම ($Y_D$) - අවසාන පරිභෝජන වියදම

අවසාන පරිභෝජන වියදම = පෞද්ගලික පරිභෝජනය + රජයේ පරිභෝජනය

$= 2780 + 100 = 2880$

සමාහාර ඉතුරුම් $= 3000 - 2880 = 120$ (ලකුණු 01යි)

රු.බිලියන 120

විකල්ප පිළිතුර (2) :

- සමාහාර ඉතුරුම් (S) = දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (I) + ශුද්ධ අපනයන

$= 160 + (-40) = 120$ (ලකුණු 01යි)

සමාහාර ඉතුරුම් = රු.බිලියන 120 (මුළු ලකුණු 02යි)

(ඉ)- රු. බිලියන 4000ක සමතුලිත ආදායම් මට්ටම කරා යාමට ආයෝජනය වෙනස් විය යුතු ප්‍රමාණය.

- මේ සඳහා ආයෝජන ගුණක ආදර්ශය යොදා ගත හැකි ය. දැනට පවතින සමතුලිත ආදායම් මට්ටම රු.බිලියන 3000කි. රු.බිලියන 4000 මට්ටම කරා ළඟා වීම සඳහා ආදායම කොතරම් ප්‍රමාණයකින් වෙනස් විය යුතුදැයි දත යුතු ය.

- ආදායම වෙනස් විය යුතු ප්‍රමාණය : ΔY = අපේක්ෂිත ආදායම් මට්ටම - දැනට පවතින ආදායම් මට්ටම (ලකුණු 01යි)

- $4000 - 3000 = 1000$

- ආයෝජන ගුණකය (k) $= \dfrac{1}{MPS} = \dfrac{1}{1 - MPC} = \dfrac{1}{1 - 0.8}$

$= \dfrac{1}{0.2} = 5$ (ලකුණු 01යි)

- රු.බිලියන 1000කින් ආදායම වැඩි කිරීම සඳහා ආයෝජනය වැඩි කළ යුතු ප්‍රමාණය :

$\Delta I = \dfrac{1000}{5} = 200$ රු.බිලියන 200 (ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

**'ආ' උප කොටස**

**(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)**

**06 වන ප්‍රශ්නය**

6. (i) දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය සහ පාරිභෝගික මිල දර්ශකය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(ii) උද්ධමනයේ පිරිවැය කවරේ ද? (ලකුණු 04යි)

(iii) (අ) 'අධිබල මුදල්' යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(ආ) ආර්ථිකයක අධිබල මුදල් තොගය තීරණය කරන සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iv) වාණිජ බැංකුවක සරල ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| වගකීම් | | වත්කම් | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 2 000 | සංචිත | 500 |
| ප්‍රාග්ධනය | 1 300 | ණය | 1 600 |
| | | ශොඩනැගිලි | 1 200 |
| **එකතුව** | **3 300** | **එකතුව** | **3 300** |

*(සියලුම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි)*

අවශ්‍ය කරන සංචිත අනුපාතය 10%ක් වේ නම්, මෙම බැංකුවේ අධි සංචිත කොපමණ ද? (ලකුණු 02යි)

(v) සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුවට යොදා ගත හැකි ප්‍රධාන උපකරණ තුනක් විස්තර කරන්න. (ලකුණු 06යි)

06.(i) - ආර්ථිකයක් තුළ නිෂ්පාදනය කෙරෙන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල පොදු මිල මට්ටම දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය මගින් මනිනු ලැබේ. එය කුටුම්බ, ව්‍යාපාර, රජය යන සියලු ම අංශ පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා මෙන්ම ආයෝජනය සහ අපනයනය සඳහා භාවිතා කරන භාණ්ඩවල මිල වෙනස් වීමද පිළිබිඹු කරයි.

- පාරිභෝගික මිල දර්ශකයකින් සුවිශේෂී ලෙස මනිනු ලබන්නේ සාමාන්‍යයෙන් කුටුම්බ විසින් මිල දී ගන්නා භාණ්ඩ හා සේවා ස්ථාවර ප්‍රමාණයක් අඩංගු කුඩයක මිලෙහි වනස් වීම් ය. එය කුටුම්බවල නියෝජිත නියදියක් විසින් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවා කෙරෙහි අවධානය යොමු කරන අතර පාරිභෝගිකයන්ගේ ජීවන වියදමෙහි වෙනස්වීම් තක්සේරු කිරීමට මූලික වශයෙන් යොදා ගැනේ.

- දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ආවරණය කරනුයේ ආර්ථිකය තුළ දේශීයව නිපදවන සියලු භාණ්ඩ හා සේවා පමණි. එහෙත් පාරිභෝගික මිල දර්ශකය සඳහා තෝරා ගනු ලබන භාණ්ඩ හා සේවා කුඩය තුළ පරිභෝජනය සඳහා යොදාගන්නා දේශීය භාණ්ඩ මෙන්ම ආනයනය කරනු ලබන භාණ්ඩ ද ඇතුළත් වේ.

- පාරිභෝගික මිල දර්ශකය තුළ විවිධ පරිභෝජන භාණ්ඩ හා සේවා සඳහා බර තැබීම් කරනු ලබන අතර ඒවා ස්ථාවර ස්වරූපයක් ගනු ලැබේ. කාලයක් තිස්සේම ඒවා නොවෙනස්ව පවතී. එහෙත් දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය තුළ ඇතුළත් බරතැබීම් ව්‍යුහය ස්ථාවරත්වයක් නොගනී. දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය නිරන්තරවම වෙනස් වන බැවින් බර තැබීම් ද වෙනස්වීම්වලට පාත්‍ර වේ.

- පාරිභෝගික මිල දර්ශකය සැකසීම සඳහා ස්ථාවර භාණ්ඩ කුඩයක් පදනම් කරගන්නා බැවින් එම කුඩයට ඇතුළත් නොවන වෙනත් පාරිභෝගික භාණ්ඩ මිල ගණන් පිළිබිඹු නොවේ. එහෙත් දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය ස්ථාවර භාණ්ඩ කුඩයක් පදනම් කර

නොගන්නා බැවින් සෑම භාණ්ඩයක්ම ආවරණය කරන අතර පාරිභෝගික හැසිරීම්වල වෙනස්කම් පෙන්නුම් කරමින් අළුතින් හඳුන්වා දෙනු ලබන පාරිභෝගික භාණ්ඩ හා සේවාවන් සියල්ලක්ම අවධමනකය තුළ නියෝජනය වේ.

**(ඕනෑම ප්‍රධාන වෙනස්කමකට ලකුණු 02 බැගින් වෙනස්කම් දෙකකට ලකුණු 04යි)**

**(ii) උද්ධමනයේ පිරිවැය :**

- උද්ධමනය මුදලේ ක්‍රය ශක්තිය ඛාදනය කරයි. මිල වැඩිවෙත්ම දෙන ලද මුදල් ප්‍රමාණයකට මිලට ගත හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණය කුඩා වේ. මින් අදහස් වන්නේ පාරිභෝගිකයනට ඔවුන්ගේ ජීවන තත්ත්වය පවත්වා ගැනීම සඳහා වැඩිපුර වියදම් කිරීමට සිදු විය හැකි බව ය. ස්ථාවර ආදායම් මත ජීවත් වන මිනිසුනට එය බෙහෙවින් හානිකර ය.

- ඉහළ උද්ධමනය ආර්ථිකයේ අවිනිශ්චිතතා ඇති කරයි. මුදලේ අනාගත අගයන්, පිරිවැය සහ මිල ගණන්වල අනාගත අගයන් සියල්ලම අවිනිශ්චිත බැවින් අනාගතය පිළිබඳ ව සැලසුම් කරන ව්‍යාපාරිකයනට එය විශාල ගැටලුවකි. මෙය ආයෝජනය අඩුවීමට සහ ආර්ථික අස්ථාවරත්වයට හේතු විය හැකි ය.

- ඉහළ උද්ධමනය මැඩ පැවැත්වීම සඳහා මහ බැංකුව පොලී අනුපාතික ඉහළ නැංවිය හැකි ය. ඉහළ පොලී අනුපාතික සහ ණය ගැනීම් වඩා මිල අධික තත්ත්වයකට පත්වන අතර පරිභෝජන වියදම් සහ ව්‍යාපාරික ආයෝජන අඩු විය හැකි ය. විශේෂයෙන්ම මෙය නිවාස සහ ඉදිකිරීම් වැනි පොලී අනුපාතිකවලට වඩා සංවේදී කර්මාන්තවලට අහිතකර අයුරින් බලපෑ හැකි ය.

- උද්ධමනයට ආර්ථිකයේ මිල සංඥා විකෘති කළ හැකි ය. මිල ඉහළ යන විට, එය උද්ධමනය විසින් මෙහෙයවනු ලබන මිල ඉහළ යාමක් ද නැතහොත් සැපයුමේ සහ ඉල්ලුමේ වෙනස්වීම් මගින් මෙහෙයවනු ලබන මිල වෙනස්වීමක් ද අතර වෙනස හඳුනා ගැනීම අභියෝගාත්මක වේ. මේ නිසා ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලිය ප්‍රශස්ත තත්ත්වයෙන් ඈත්වනු ඇත.

- උද්ධමනය සමඟ පවත්වා ගැනීම සඳහා ඔවුන්ගේ මිල ගණන් සකස් කිරීමේ දී සමාගම්වලට පිරිවැයක් දැරීමට සිදුවිය හැකි ය. නිතර නිතර මිල ලැයිස්තු සංශෝධනය කිරීම, මෘදුකාංග යාවත්කාලීන කිරීම, අලෙවිකරණ ක්‍රමෝපායන් වෙනස් කිරීම යනාදිය වියදම් අධික කටයුතු වේ.

- උද්ධමනය සමාජය තුළ ආදායම හා ධනය පුණර්ව්‍යාප්ත කරයි. ණයගැතියන්ට ණය ආපසු ගෙවීම වාසි දායක වේ. ණය ආපසු ගෙවීමේ දී මුදලේ ක්‍රය ශක්තිය පහළ වැටී ඇති බැවිනි. අනික් අතට ණයහිමියන්ට තමන් දුන් ණය වල මූර්ත වටිනාකම අඩු වීම නිසා අවාසිදායක වේ.

- ඉහළ උද්ධමනය රටක ජාත්‍යන්තර තරගකාරීත්වය විනාශ කර දමයි. උද්ධමනය නිසා රට ව්‍යවහාර මුදලේ විදේශ අගය ක්ෂයවීමෙන් විදේශ ගැනුම්කරුවන්ට ලාභ දායක විය හැකි වුවද එම රටේ වැසියන්ට ආනයන මිල අධික වනු ඇත. මෙය වෙළෙඳ පරතරයට අහිතකර බලපෑමක් ඇති කළ හැකි ය. ආනයන මත රඳා පවත්නා කර්මාන්තවලට ද අහිතකර ලෙස බලපායි.

- උද්ධමනය ඉතිරිකිරීම් සහ දිගුකාලීන ආයෝජන අධෛර්යමත් කරයි. ඉතුරුම් සඳහා ලැබෙන මූර්ත පොලිය අඩු හෝ සෘණාත්මක වන විට පුද්ගලයන් සහ ආයතන ඵලදායි වත්කම් අත්කර ගැනීමට හෝ ආයෝජනය කිරීමට පසුබට වනු ඇත.

- අතිශය ඉහළ උද්ධමනය හෝ අධි උද්ධමනය සමාජ සහ දේශපාලන නොසන්සුන්තාවන්ට හේතු විය හැක. එය මුදල් හා මූල්‍ය ආයතන කෙරෙහි ඇති විශ්වාසය බිඳ දමයි. මුදල් ගනුදෙනු අත්හැර දමා බඩු හුවමාරුවට පෙළඹිය හැකි ය. භාණ්ඩ රාශිකරණයට යොමු විය හැකි ය. ආර්ථික ක්‍රියාවලිය බිඳ වැටීමට තුඩුදිය හැකි ය.

**(එක් පිරිවැයකට ලකුණු 01 බැගින් පිරිවැය හතරකට ලකුණු 04යි)**

(iii)(අ) සංචිත හෝ පදනම් මුදල් හෝ වශයෙන් හඳුන්වනු ලබන අධි බලැති මුදල් රටක මුදල් තොගයේ පදනම වන අතර වඩා විශාල මූල්‍ය සමාහාර ගොඩනගා ඇත්තේ ඒ මත ය. අධිබලැති මුදල් ජාතියේ මුදල් සැපයුමේ ප්‍රධාන නිර්ණායකයකි. **(ලකුණු 01යි)**

- අධිබලැති මුදල් සමන්විත වනුයේ (අ) මහජනතාව සහ වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් (ආ) වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තබා ඇති තැන්පතු යන දෙවර්ගයෙනි. අධිබලැති මුදල් සඳහා සූත්‍රය පහත පරිදි වේ.

  අධිබල මුදල් $(H) = C + R$

  මෙහි C යනු ව්‍යවහාර මුදල් වන අතර R යනු බැංකු පද්ධතිය සතු සංචිත වේ.

**(ලකුණු 01යි)**

(ආ) අධිබල මුදල් තොගය තීරණය කෙරෙන සාධක :

- මහ බැංකුවෙන් ආර්ථිකයකට අධිබල මුදල් මුදා හැරෙන යාන්ත්‍රණයන් දෙකක් ඇත. එක් යාන්ත්‍රණයක් වනුයේ රජයට සහ වාණිජ බැංකුවලට ණය ලබා දී දේශීය වත්කම් අත්පත් කර ගැනීම ය. දෙවැනි යාන්ත්‍රණය වනුයේ රජයෙන් සහ වාණිජ බැංකුවලින් විදේශ විනිමය මිල දී ගැනීම ය.

- මහ බැංකුවේ ප්‍රතිපත්තිය : මූල්‍ය පදනම පිළිබඳ ව මහ බැංකුවට සෘජු පාලනයක් ඇත. විවෘත වෙළෙඳපොළ මෙහෙයුම්, සංචිත අවශ්‍යතා සඳහා ගැළපුම් කිරීම සහ වට්ටම් අනුපාතිකයේ වෙනස් කිරීම් මගින් අධිබල මුදල් තොගයට බලපෑම් කොට මුදල් සැපයුම පාලනය කළ හැකි ය. උදාහණයක් ලෙස මහ බැංකුවට විවෘත වෙළෙඳපොළේ රජයේ සුරැකුම්පත් මිල දී ගැනීමට හෝ විකිණීමට හෝ පිළිවන. ඒ මගින් වාණිජ බැංකුවල සංචිතයට බලපෑම් කොට පදනම් මුදල් තොගය පාලනය කළ හැකි ය.

- ව්‍යවහාර මුදල් සඳහා ඉල්ලුම : සංසරණය වන ව්‍යවහාර මුදල් ප්‍රමාණය කෙරෙහි ගනුදෙනු මාධ්‍යයක් ලෙස ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීමට මහජනතාවගේ ඇති අභිරුචිය බලපායි. ආර්ථික තත්ත්වයේ පවතින වෙනස්කම්, පාරිභෝගික හැඟීම් සහ ගෙවීම් පුරුදු වැනි කරුණු ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුමට බලපායි.

**(එක් තීරකයකට ලකුණු 01 බැගින් තීරක දෙකකට ලකුණු 02යි)**

**(මුළු ලකුණු 04යි)**

(iv) - අධි සංචිතය ගණනය කිරීම සඳහා අවශ්‍ය කරන සංචිත ප්‍රමාණය සහ දැනට තිබෙන සංචිත ප්‍රමාණය දත යුතු ය.

- ඉල්ලුම් තැන්පතු　= රු.බිලියන 2000

  සංචිත අනුපාතය　= 10%

  අවශ්‍යකරන සංචිතය　$= 2000 \times 10\% =$ රු.බිලියන 200

- සැබෑ සංචිතවල ප්‍රමාණය = රු.බිලියන 500
- අධි සංචිත ප්‍රමාණය = සැබෑ සංචිත - අවශ්‍ය සංචිත
  = 500 - 200 = 300
- අධි සංචිත ප්‍රමාණය = රු.බිලියන 300 (ලකුණු 02යි)

(v)- උද්ධමනය පාලනය කිරීම සහ සිසිල් කිරීම උදෙසා මුදල් සැපයුම අඩු කිරීම, අරමුණු කරගත් සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට මහ බැංකුවට මෙවලම් කිපයක් භාවිතා කළ හැකි ය.

- **විවට වෙළෙඳපොළ මෙහෙයුම් :** මහ බැංකුවට විවෘත වෙළෙඳපොළෙහි රජයේ සුරැකුම්පත් විකිණීමෙන් විවට වෙළෙඳපොළ මෙහෙයුම් කළ හැකි ය. මහ බැංකුව රජයේ සුරැකුම්පත් බැංකුවලට හෝ වෙනත් මූල්‍ය ආයතනවලට විකුණන විට එය බැංකු පද්ධතියෙන් මුදල් අවශෝෂණය කරයි. එහි ප්‍රතිඵල වශයෙන් ණය දීමට බැංකුවලට ඇති මුදල් ප්‍රමාණය අඩු වන අතර එමගින් සමස්ත මුදල් සැපයුම අඩු වේ. (ලකුණු 02යි)

- **ප්‍රතිපත්ති පොලී අනුපාතික වැඩි කිරීම :** මෙම ප්‍රධාන පොලී අනුපාතික ඉහළ නැංවීමෙන් මහ බැංකුව, බැංකු යන පාරිභෝගිකයන් සඳහා ණය ගැනීම වඩා මිල අධික කරයි. මෙය පාරිභෝගික වියදම් සහ ව්‍යාපාරික ආයෝජන අඩු කරන අතර මිනිසුන් අඩුවෙන් ණය ගන්නා බැවින් මුදල් සැපයුම අඩු වේ. (ලකුණු 02යි)

- **ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීම :** සංචිත අවශ්‍යතා වැඩි වූ විට වාණිජ බැංකුවලට වැඩි අරමුදල් ප්‍රමාණයක් සංචිත වශයෙන් තබා ගැනීමට සිදුවන අතර පාරිභෝගිකයනට සහ ව්‍යාපාරවලට ණය දීම සඳහා ඉතිරිවන අරමුදල් ප්‍රමාණය අඩු වේ. බැංකුවල ණය දීමේ ධාරිතාව අඩු වන බැවින් එය මුදල් සැපයුම අඩුවීමට දායක වේ.

(ලකුණු 02යි)

(මුළු ලකුණු 06යි)

**07 වන ප්‍රශ්නය**

7. (i) සම්පත් බෙදා වෙන්කිරීම කෙරෙහි බාහිර ප්‍රතිලාභ සහ බාහිර පිරිවැය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) (අ) සුභ සාධන භාණ්ඩ සඳහා උදාහරණ දෙකක් දක්වන්න. (ලකුණු 02යි)

(ආ) ආණ්ඩුවේ මැදිහත්වීමක් නොමැති තැන්හි දී සුභ සාධන භාණ්ඩ බොහෝ විට ඌන පරිභෝජනයකට පාත්‍ර වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iii) 'අයි බදු බර' යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 02යි)

(iv) ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයභාරය පහළ වැටීමේ ප්‍රවණතාව ආපස්සට හැරවීම සඳහා රජය විසින් මෑතක දී ගනු ලැබූ ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) රටක රාජ්‍ය ණය තිරසාරභාවය තීරණය කිරීමෙහි ලා ප්‍රාථමික ගිණුමේ ශේෂය වඩාත් වැදගත් වන්නේ ඇයි? (ලකුණු 06යි)

07. (i) - බාහිර ප්‍රතිලාභ (ධන බාහිරතා) : භාණ්ඩයක හෝ සේවාවක නිෂ්පාදනය හෝ පරිභෝජනය එම ක්‍රියාවට සෘජුව සහභාගී නොවන තෙවන පාර්ශ්වයන් මත ප්‍රතිලාභ ජනනය කරන විට බාහිර ප්‍රතිලාභ හටගනී.

- ඌන නිෂ්පාදනය : බාහිර ප්‍රතිලාභ ලබා දෙන භාණ්ඩ හෝ සේවා සමාජයීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩුවෙන් නිෂ්පාදනය කිරීමට වෙළෙඳපොළ නැඹුරු වේ. මක්නිසාද යත් නිෂ්පාදකයන් මිල තීරණය කිරීමේ දී සියලුම සමාජ ප්‍රතිලාභ ග්‍රහණය කර නොගන්නා බැවින් මෙම ක්‍රියාකාරකම් සඳහා සම්පත් අඩුවෙන් වෙන් කිරීමට හේතුවේ.

(ලකුණු 02යි)

- බාහිර පිරිවැය (සෘණ බාහිරතා) : භාණ්ඩයක හෝ සේවාවක නිෂ්පාදනය හෝ පරිභෝජනය තෙවන පාර්ශ්වයන් මත වන්දි ගෙවීමකින් තොරව පතිත කරනු ලබන පිරිවැය බාහිර පිරිවැය හෙවත් සෘණ බාහිරතා ලෙස සැලකේ.

- අධි නිෂ්පාදනය : බාහිර පිරිවැය හෙවත් සෘණ බාහිරතා පවතින විට, වෙළෙඳපොළ සමාජයීය වශයෙන් කැමැති (ප්‍රශස්ත) ප්‍රමාණයට වඩා අන් අයට හානිකරන භාණ්ඩ හෝ සේවා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට නැඹුරු වේ. මෙයට හේතුව නිෂ්පාදකයන් තම මිල තීරණය කිරීමේ දී බාහිර පිරිවැය සැලකිල්ලට නොගැනීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදා වෙන් කෙරෙන අතර හානිකර ක්‍රියාකාරකම් සඳහා සම්පත් අධික ලෙස උපයෝජනය කෙරේ.

(ලකුණු 02යි)

(මුළු ලකුණු 04යි)

(ii) (අ) සුභ සාධන භාණ්ඩ සඳහා නිදසුන් :

- අධ්‍යාපනය
- එන්නත් කිරීම
- සෞඛ්‍ය සේවා
- සෞඛ්‍ය සම්පන්න ආහාර ගැනීම (Healthy eating)
- කලාව සහ සංස්කෘතිය
- පුස්තකාල
- පරිසර සංරක්ෂණය
- කෞතුකාගාර
- පොදු ප්‍රවාහනය
- පුනර්ජනනීය බලශක්තිය
- නිවාස

- ආරක්ෂක උපකරණ
- ක්‍රීඩා සහ විනෝදාස්වාදය
- තොරතුරු

(එක් නිදසුනකට ලකුණු 01 බැගින් නිදසුන් දෙකකට ලකුණු 02යි)

(ආ) සුභ සාධන භාණ්ඩ යනු ධන බාහිරතා ජනනය කරන භාණ්ඩ වේ. ඒවායේ පරිභෝජනය අදාළ පුද්ගලයාට ප්‍රතිලාභ ලබා දෙනවා පමණක් නොව සමස්ත සමාජයටම අතිරේක ප්‍රතිලාභ ගෙන දේ. රජයේ මැදිහත්වීමක් නොමැති තැන්හිදී ඒවා බොහෝ විට අඩුවෙන් පරිභෝජනය කෙරේ. මක්නිසාද යත් අදාළ පුද්ගලයන් සමාජයීය ප්‍රතිලාභ කෙරෙහි සැලකිල්ලක් නොදක්වන බැවිනි. පෞද්ගලික වෙළෙඳපොළ තුළ මෙම භාණ්ඩ ප්‍රශස්ත ලෙස නිෂ්පාදනය කොට පරිභෝජනය නොකෙරේ.

- අසම්පූර්ණ තොරතුරු : සුභ සාධන භාණ්ඩ හා සම්බන්ධ ධනාත්මක බාහිරතා පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි අවබෝධයක් පාරිභෝගිකයන්ට නොතිබීම තවත් හේතුවකි. මේ නිසා ඔවුන් සැබෑ ප්‍රතිලාභ අවතක්සේරු කොට ඌන පරිභෝජනයක නියැලේ.

- දිගුකාලීන ප්‍රතිලාභ : අධ්‍යාපනය, පාරිසරික තිරසාර භාවය, වැඩිදියුණු කළ සෞඛ්‍ය සේවා වැනි සුභ සාධන භාණ්ඩ බොහෝ විට දිගු කාලීන ප්‍රතිලාභ ලබා දෙයි. පුද්ගලයන් කෙටි කාලීන ප්‍රතිලාභ සඳහා වැඩි ප්‍රමුඛත්වය දීමට නැඹුරුවන අතර දිගු කාලීනව ලැබෙන ප්‍රතිලාභ කෙරෙහි අඩු ප්‍රමුඛත්වයක් දීමට පෙළැඹේ. මේ හේතුව නිසා සුභ සාධන භාණ්ඩ වල ඌන පරිභෝජනයක් හටගනී.

(එක් හේතුවකට ලකුණු 01 බැගින් ඕනෑම හේතු දෙකකට ලකුණු 02යි)
(මුළු ලකුණු 04යි)

(iii) - අධි බදු බර : අධි බදු බර යන සංකල්පයෙන් අදහස් වනුයේ බද්දක් පැනවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සම්පත් භාවිතය අකාර්යක්ෂම වීම හෙවත් සුභ සාධනය අහිමි වී යාම ය. (dead - weight loss) එම අකාර්යක්ෂමතාව බද්දක මූල්‍යමය බදු බරට අමතර ව හටගන්නා අතිරේක පිරිවැයක් වන බැවින් එය අධි බදුබරක් ලෙස නම් කෙරේ.

(ලකුණු 01)

- බද්දක ප්‍රතිඵල වශයෙන් වෙළෙඳපොළ තුළ සානුබල විකෘතිවීම මස්සේ නිෂ්පාදකයන්ගේ සහ පාරිභෝගිකයන්ගේ හැසිරීම් වෙනස් වීම නිසා සම්පත් භාවිතය අකාර්යක්ෂම වන අතර ආර්ථික සුභ සාධනය පහළ වැටීමට එය හේතු වේ.

(ලකුණු 01යි)
(මුළු ලකුණු 02යි)

(iv) - 2022 වසර සඳහා වන අයවැය ප්‍රකාශයට අනුව 2020/2021 බදු තක්සේරු වසර සඳහා බදු අය කළ හැකි ආදායම රුපියල් බිලියන 2.0ක් ඉක්මවන පුද්ගලයන්, සමාගම් සහ හවුල් ව්‍යාපාර මත එක්වරක් පමණක් ගෙවිය යුතු 25%ක අධිභාර බද්දක් පනවනු ලැබී ය.

- 2022 වසරේ ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය සේවා සඳහා අදාළ එකතු කළ අගය මත බද්ද 15% සිට 18%ක් දක්වා ඉහළ නංවන ලදී.

- 2022 වසරේ ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය

ම විශ්‍ය ... ... 



8% සිට 12% දක්වා වැඩි කරන ලදී. සැප්තැම්බර් මාසයේ දී 12% සිට 15% දක්වා ඉහළ නංවන ලදී.

- 2022 ඔක්තෝබර් 01 සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ පිරිවැටුම් සීමාව වසරකට මිලියන 300 සිට රු.මිලියන 80 දක්වා පහළ දමන ලදී.

- 2022 ඔක්තෝබර් 01 සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික පිරිවැටුම රු.මිලියන 120 ඉක්මවන ආනයනකරුවන්, නිෂ්පාදකයන්, තොග වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන් සඳහා පිරිවැටුම මත 2.5%ක සමාජ ආරක්ෂණ බද්දක් පනවන ලදී.

- 2023 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වන පරිදි පුද්ගලයන් සහ සමාගම්වලට අදාළ ආදායම් බදු ව්‍යුහයන් සංශෝධනය කරන ලදී. ඒ අනුව පෞද්ගලික ආදායම් බදු ගෙවන්නන් සඳහා බදු නිදහස් ආදායම් සීමාව වර්ෂයකට රු.මිලියන 3.0 සිට මිලියන 1.2 දක්වා අඩු කරන ලදී.

- පෞද්ගලික ආදායම් බදු අනුපාතික මීට ඉහත පැවති 6%, 12% සහ 18% ප්‍රතිශත වෙනුවට 6%, 12%, 18%, 24%, 30% සහ 36% දක්වා ඉහළ දමන ලදී.

- 2023 ජනවාරි මාසයේ සිට රඳවා ගැනීමේ බද්ද නැවත හඳුන්වා දෙන ලදී.

- සමාගම් ආදායම් බදු අනුපාතික 30% දක්වා ඉහළ නංවන ලද අතර සමාගම්වලට ලබාදුන් බදු සහන ඉවත් කරනු ලැබිය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)

(v) රාජ්‍ය ණයෙහි තිරසාරභාවය තීරණය කිරීමෙහිලා ප්‍රාථමික ගිණුම් ශේෂයේ වැදගත්කම :

- ප්‍රාථමික ගිණුමේ ශේෂය රටක රාජ්‍ය ණය තිරසාරභාවය තක්සේරු කිරීම සඳහා ප්‍රයෝජනවත් තීරණාත්මක දර්ශකයකි. ආණ්ඩුවේ රාජ්‍ය මූල්‍ය සෞඛ්‍යය සහ තව තවත් ණය රැස් නොකොට ණය සේවා පවත්වා ගැනීමේ හැකියාව එමගින් මැනේ.

- ප්‍රාථමික ගිණුම් ශේෂය රජයකට වත්මන් ආදායමෙන් වත්මන් වියදම (පොලී ගෙවීම් හැර) ආවරණය කිරීමට ඇති හැකියාව පිළිබිඹු කරයි. ප්‍රාථමික ශේෂය ධනාත්මක වන විට එයින් පෙන්නුම් කරනුයේ රජයට වැඩි මුදලක් ණයට නොගෙන තම පොලී නොවන වියදම් පියවා ගත හැකි බව ය. මෙයින් අදහස් වන්නේ අතිරේක ණය මත රඳා නොසිට රාජ්‍ය සේවා, යටිතල පහසුකම් හෝ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් වෙන් කිරීමට රජයට වැඩි මූල්‍ය අවකාශයක් ඇති බව ය.

- ණය බර අඩු කිරීම : පවතින ණය බර අඩු කර ගැනීම සඳහා ධනාත්මක ප්‍රාථමික ගිණුම් ශේෂයක් භාවිත කළ හැකි ය. රජය ප්‍රාථමික ශේෂය ධනාත්මක කළ හොත් පවතින ණය ගෙවා දැමීම සඳහා මෙම අරමුදල් වෙන් කළ හැකි වේ. එවිට කාලයත් සමඟ රාජ්‍ය ණය සහ දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය අඩු කර ගත හැකි ය. මෙම අනුපාතය අඩු අගයක් ගැනීම ණය තිරසාරභාවය ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකයක් වේ.

- **ණය මත රඳා පැවැත්ම අඩු වීම :** ධනාත්මක ප්‍රාථමික ශේෂයක් වර්තන වියදම් පියවා ගැනීම සඳහා ණය මත රඳා පැවැත්ම අඩු කරයි. රජය අඛණ්ඩව ප්‍රාථමික ශේෂය හිඟයක් ලෙස පවත්වා ගත හොත් රජයේ වගකීම් ඉටුකරලීම සඳහා වැඩිපුර ණය ගැනීමට සිදුවන අතර එය ණය සමුච්චනය වීමට හේතු වේ. කාලයාගේ ඇවෑමෙන් ණය මට්ටම ඉහළ ගොස් තිරසාර නොවන තත්ත්වයට පත්විය හැකි ය.

- **ණය ලැබීමට සුදුසු වීම (Credit worthiness) :** කිසියම් රටක් ණය ලබා ගැනීමට සුදුසු වීම සඳහා සෞඛ්‍ය සම්පන්න ප්‍රාථමික ගිණුම් ශේෂයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. රජයට ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ජනනය කිරීමට හැකියාවක් ඇත්දැයි ණය දෙන්නන් සහ ණය ශ්‍රේණිගත කරන ආයතන සමීපව නිරීක්ෂණය කරයි. මක්නිසාද යත් කලින් ලබාගත් ණය සඳහා පොලී ගෙවීම් කළ රජයේ මූල්‍ය වගකීම් පහසුවෙන් සපුරා ලිය හැකි ද යන්න ප්‍රාථමික ශේෂයේ තත්ත්වය මත රඳා පවතී. ශක්තිමත් ප්‍රාථමික ශේෂයක් ඇති විට වඩා හොඳ ශ්‍රේණිගත කිරීමක් සහ ණය ලබා ගැනීමේ දී අඩු පොලියක් යටතේ ලබා ගැනීමට ද හැකි වේ.

**(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 06යි)**

**08 වන ප්‍රශ්නය**

8. (i) විදේශ වෙළඳාම් ක්ෂේත්‍රය තුළ 'නිරපේක්ෂ වාසිය' සහ 'සාපේක්ෂ වාසිය' යන සංකල්ප අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)
(ii) ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ආරක්ෂණවාදයට පක්ෂව සහ විපක්ෂව ඉදිරිපත් කෙරෙන තර්ක දෙක බැගින් දක්වන්න. (ලකුණු 04යි)
(iii) විනිමය අනුපාතිකයේ වෙනස්වීම් රටක වෙළෙඳ ශේෂය කෙරෙහි බලපාන්නේ කෙසේ ද? (ලකුණු 04යි)
(iv) රටක භාණ්ඩ වෙළෙඳ අනුපාතිකයේ වැඩි දියුණුවීමෙහි වැදගත්කම කවරේ ද? (ලකුණු 03යි)
(v) මෑත වර්ෂවල දී ඇමෙරිකානු ඩොලරයට එරෙහි ව ශ්‍රී ලංකා රුපියල ප්‍රබල ලෙස ක්ෂය වීමට තුඩුදුන් සාධක පහක් සඳහන් කරන්න. (ලකුණු 05යි)

08. (i) - **නිරපේක්ෂ වාසිය :** නිරපේක්ෂ වාසිය යනු එක් රටකට වෙනත් රටකට වඩා කාර්යක්ෂම (අඩු සම්පත් හෝ අඩු කාලයක් භාවිත කරමින්) යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කළ හැකි තත්ත්වයකි. වෙනත් වචනවලින් කිවහොත්, එය කිසියම් නිශ්චිත නිෂ්පාදිතයක් නිෂ්පාදනය කිරීමේ හොඳම තත්ත්වයයි.

- උදාහරණයක් වශයෙන් A සහ B රටවල් දෙක සලකා බලමු. B රට සමඟ සසඳන විට A රටට අඩු ශ්‍රම පැය ගණනක් සහ අඩු අමුද්‍රව්‍ය ප්‍රමාණයක් භාවිත කොට මෝටෝ රථ නිෂ්පාදනය කළ හැකි නම්, A රටට මෝටෝ රථ නිෂ්පාදනයේ නිරපේක්ෂ වාසියක් පවතී.

(ලකුණු 02යි)

- **සාපේක්ෂ වාසිය :** සාපේක්ෂ වාසිය යනු තවත් භාණ්ඩයකට සාපේක්ෂව එක් භාණ්ඩයක් හෝ සේවාවක් හෝ නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය අවධාරණය කරන සංකල්පයකි. එහිදී යම් රටකට තම වෙළෙඳ සහකරු සමඟ සසඳන විට අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවිය හැකි භාණ්ඩය කවරක් දැයි තක්සේරු කෙරේ.

(ලකුණු 02යි)

(ii) - **ආරක්ෂණවාදයට පක්ෂ තර්ක :**

- **දේශීය කර්මාන්ත රැක ගැනීම :** තීරුබදු සහ කෝටා වැනි ආරක්ෂණවාදී පියවර මගින් දේශීය කර්මාන්ත විදේශීය තරගකාරිත්වයෙන් ආරක්ෂා කළ හැක. මෙය රැකියා ආරක්ෂා කර

ගැනීමට ද උපකාරී වන අතර විශේෂයෙන්ම එවැනි ක්‍රියාමාර්ග ජාතික ආරක්ෂාව හෝ ආර්ථික ස්ථාවරත්වය සඳහා අත්‍යාවශ්‍යයයි සැලකෙන ක්ෂේත්‍රයන්හි විදේශීය තරගකාරීත්වය හේතුවෙන් දේශීය කර්මාන්ත බිඳ වැටීම වළක්වයි.

- උපාය මාර්ගික වෙළෙඳ ප්‍රතිපත්ති : ගෝලීය වශයෙන් තරගකාරී වීමේ විභවතාවක් ඇති නැගී එන කර්මාන්ත සඳහා උපක්‍රමශීලීව ආරක්ෂණවාදය භාවිත කළ හැකි ය. මෙම කර්මාන්ත ඔවුන්ගේ ළදරු අවධියේ දී ආරක්ෂා කොට අවසානයේ දී ගෝලීය වෙළෙඳපොළ වල තරගකාරීත්ව වාසියක් අත්කර ගැනීමට සමත් වේ.

- ජාතික ආරක්ෂාව : ආරක්ෂණ කර්මාන්ත (defense industries) හෝ තීරණාත්මක යටිතල පහසුකම් වැනි ඇතැම් කර්මාන්ත ජාතික ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය වේ. ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා මෙම කර්මාන්ත දේශීය පාලනය යටතේ පවතින බව ආරක්ෂණ වාදයට සහතික කළ හැක.

- ළදරු කර්මාන්ත තර්කය : නව කර්මාන්ත කාර්යක්ෂම හා තරගකාරී වන තෙක් ඒවා ආරක්ෂා කිරීම මගින් ආර්ථික වෘද්ධිය සහ විවිධාංගීකරණය ප්‍රවර්ධනය කළ හැක. මෙම තර්කයෙන් ඇඟැවෙන්නේ දේශීය කර්මාන්ත දියුණු වීමට තාවකාලික ආරක්ෂාවක් අවශ්‍ය බව ය.

- වෙළෙඳ හිඟය අඩු කිරීම : ආනයන සීමා කිරීම මගින් වෙළෙඳ හිඟය අඩු කිරීම සඳහා ආරක්ෂණවාදී පියවර භාවිත කළ හැකි අතර එමගින් රටක ගෙවුම් ශේෂය ස්ථාවර කර ගැනීමට හැකි වේ.

(එක් තර්කයකට ලකුණු 01 බැගින් ඕනෑම තර්ක දෙකකට ලකුණු 02යි)

ආරක්ෂණයට විපක්ෂ තර්ක :

- සම්පත් වැරදි ලෙස බෙදා වෙන් කිරීම (Misallocation) ආරක්ෂණවාදය සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදා වෙන් කිරීමට හේතු විය හැකි ය. කර්මාන්ත ආරක්ෂණ ප්‍රාකාර වලින් වට කොට ඇති විට තරගකාරීත්වය යටතේ ඒවාට වඩා කාර්යක්ෂම හා නවීකරණය වීමට දිරි ගැනීමක් නොලැබේ. මෙය සම්පත් නාස්තියට සහ සමස්ත ආර්ථික වෘද්ධිය පහළ හෙළීමට දායක වනු ඇත.

- ඉහළ පරිභෝගික මිල ගණන් : තීරු බදු සහ කෝටා සාමාන්‍යයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහළ මිලකට මඟ පාදයි. එමගින් පාරිභෝගිකයනට තම ක්‍රය ශක්තිය අඩු කිරීමෙන් සහ වෙළෙඳපොළ තුළ තේරීම් සීමා කිරීමෙන් හානියක් විය හැකි ය.

- ප්‍රතිප්‍රහාර (Retaliation) : අනිකුත් රටවල් ද තමන්ගේම වෙළෙඳ බාධක හඳුන්වා දෙමින් ප්‍රතිචාර දැක්විය හැකි බැවින් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වෙළෙඳ යුද්ධවලට මඟ පාදයි. මෙම පළිගැනීමේ චක්‍රය සමස්ත ගෝලීය වෙළෙඳාම අඩු කළ හැකි අතර ඊට සම්බන්ධ සියලුම ජාතීන්ගේ ආර්ථිකයකට හානි පමුණුවා ගනු ඇත.

- ආර්ථික සුභ සාධනය අඩු කිරීම : වෙළෙඳාමට බාධා පැමිණීම නිසා සාපේක්ෂ වාසි පදනම් කරගත් භාණ්ඩ නිෂ්පාදනය සීමා විය හැකි අතර කාර්යක්ෂමතාව අඩු නිෂ්පාදන බිහි කිරීම නිසා සමස්ත සුභ සාධනයට හානි ඇති විය හැක.

- නවෝත්පාදනය සහ තරගකාරීත්වය : විදේශීය සමාගම්වල තරගකාරීත්වය බොහෝ විට දේශීය සමාගම් තරගකාරීත්වයට සහ නව්‍යකරණයට තල්ලු කරයි. ආරක්ෂණවාදය නිසා මෙම තරගකාරීත්වය මැඩ පැවැත්වෙන අතර අඩු නවීකරණයක් සහ අඩු ගතිකත්වයක් ඇති දේශීය කර්මාන්ත බිහි වේ.

- සංකීර්ණතාව සහ නිලධාරිවාදය : ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සංකීර්ණ සහ නිලධාරිවාදී විය හැකි ය. පරිපාලන වියදම් ඉහළ යාමටත් දූෂණය හිස එසවීමටත් තුඩු දිය හැකි ය.

- අකාර්යක්ෂම කුලී සෙවීම (Inefficient rent seeking) : ආරක්ෂණවාදයට කුලී සෙවීමේ හැසිරීම දිරිමත් කළ හැකි ය. විශේෂ උනන්දුවක් දක්වන කණ්ඩායම් (interest groups) ආරක්ෂණවාදී ප්‍රතිපත්ති උදෙසා දේශපාලනඥයන් පොළඹවයි. එමගින් ඔවුනට වාසි ලැබුනද සමස්ත ආර්ථිකයට විශාල හානියක් සිදුවේ.

**(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02යි)**
**(මුළු ලකුණු 04යි)**

(iii) කෙටි කාලීන ප්‍රතිවිපාක :

- මිල ගණන් මත බලපෑම : අනික් මුදල්වලට සාපේක්ෂව රටක ව්‍යවහාර මුදලේ අගය ක්ෂයවන විට විදේශීය ගැනුම්කරුවනට අපනයන ලාභදායී වන අතර දේශීය පාරිභෝගිකයනට ආනයන වඩාත් මිල අධික වේ. විදේශීය පාරිභෝගිකයනට මෙම රටේ භාණ්ඩ වඩාත් ආකර්ශණීය වීම නිසාත් දේශීය පාරිභෝගිකයන් ලාභදායී දේශීය විකල්ප කරා මාරු වීම නිසාත් ආරම්භයේ දී අපනයන වැඩිවීමකටත් ආනයන අඩුවීමකටත් හේතු විය හැකිය.

- මිල වෙනස් වූ පසු අදාළ ගැලපුම් ඇතිකර ගැනීමට කාලයක් ගත වන බව සැලකිල්ලට ගත යුතු ය. විනිමය අනුපාතිකය වෙනස්වීමට පෙර ඇතිකර ගෙන තිබූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් තවදුරටත් වලංගු විය හැකි නිසා වෙළෙඳ පරිමාව ඒවා මත තීරණය වන බැවින් කෙටි කාලීනව වෙළෙඳ ශේෂය මත ඇති වන බලපෑම ඉතා සීමිත ය.

දිගුකාලීන ප්‍රතිවිපාක :

- ඉල්ලුම් මිල නම්‍යතාව : කාලයත් සමග රටක භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. රටක අපනයන සාපේක්ෂ වශයෙන් මිල නම්‍යතාවක් පෙන්වන්නේ නම් මුදල් ඒකකයේ ක්ෂයවීම අපනයන පරිමාව සැලකිය යුතු වැඩිවීමක් ඇති කරයි. අනික් අතට ආනයන සාපේක්ෂව මිල නම්‍යතාවයක් පෙන්නුම් කරන්නේ නම් ආනයන පරිමාවේ සැලකිය යුතු අඩු වීමක් අපේක්ෂා කළ හැකි ය.

- දේශීය නිෂ්පාදනයට බලපෑම : ව්‍යවහාර මුදල ක්ෂයවීම දේශීය නිෂ්පාදන ක්‍රියාවලියට බලපායි. අපනයන වඩා තරගකාරී වන විට අපනයන ක්ෂේත්‍රය ප්‍රසාරණය වනු ඇත. ආනයන මිල ඉහළ යාම නිසා ආනයන - ආදේශන කර්මාන්ත ද ධෛර්යමත් විය හැකි ය.

- වෙළෙඳ ශේෂය : මුදල් ඒකකය ක්ෂයවීම නිසා ආනයන මිල අඩුවීමත් කෙටි කාලීනව ආනයන පරිමාව අඩු කර ගත නොහැකි බැවින් ආර්ථිකය වෙළෙඳ හිඟයකට මුහුණ දිය හැකි ය. කාලයගේ ඇවෑමෙන් අපනයන අඩු මිලට ධනාත්මක ප්‍රතිචාර දක්වයි නම් සහ දේශීය

කර්මාන්ත නිෂ්පාදනය පුළුල් කරන්නේ නම් වෙළෙඳ ශේෂය වැඩි දියුණු කරගත හැකි වේ. මින් අදහස් කරනුයේ ආර්ථිකය ක්‍රමයෙන් අපනයන ආනයනවලට වඩා වේගයෙන් වැඩි කොට වෙළෙඳ ශේෂයේ අතිරික්තයක් ඇති කර ගත හැකි බව ය.

- ආනයන පිරිවැය සහ උද්ධමනය : මුදල් ඒකකය ක්ෂයවීම නිසා අපනයන ඉහළ නංවා ආනයන අඩු කරගත හැකි වුවත් ආනයනික අමුද්‍රව්‍ය සහ භාණ්ඩවල පිරිවැය ඉහළ නැංවිය හැකි බැවින් රට තුළ උද්ධමන පීඩන ඇති විය හැකි ය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)
(මුළු ලකුණු 04යි)

(iv) භාණ්ඩ වෙළෙඳ අනුපාතය උසස් වීම :

- අපනයන අයභාරය ඉහළ යාම : රටක වෙළෙඳ අනුපාතයේ දියුණුවීමක් යනුවෙන් අදහස් වන්නේ ආනයන සඳහා ගෙවන මිලට සාපේක්ෂව අපනයන සඳහා වඩාත් හිතකර මිලක් ලබා ගත හැකි වීම ය. එහි ප්‍රතිඵල වශයෙන් රටේ සමස්ත ආර්ථික සංවර්ධනය ඉහළ නංවා ගත හැකි ලෙස අපනයන ආදායම් වර්ධනය වේ.

- ආර්ථික වර්ධනය : වෙළෙඳ අනුපාතය උසස් වීම නිසා ලැබෙන අතිරේක ආදායම මගින් රටේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවා ගැනීම ආර්ථික වෘද්ධියට දායක වනු ඇත. එම අතිරේක ආදායම යොදා ගනිමින් යටිතල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ අනෙකුත් අත්‍යවශ්‍ය අංශවල ආයෝජනය ඉහළ නැංවිය හැකි ය.

- වෙළෙඳ ශේෂය යහපත් වීම : වෙළෙඳ අනුපාතයේ ධනාත්මක වේගයක් බොහෝ අවස්ථාවල වෙළෙඳ ශේෂය යහපත් කර ගැනීමට දායක වන්නේ ය. වෙළෙඳ හිඟය අඩු කොට වඩා යහපත් ගෙවුම් ශේෂ තත්ත්වයක් ඇතිකර ගැනීමට එය ඉවහල් වේ.

- බාහිර අවදානම් තත්ත්වය අඩු වීම : වාසිදායක වෙළෙඳ අනුපාතය සහිත රටකට බාහිර ආර්ථික කම්පනවලට ගොදුරු වීම් අවදානම අඩු ය. අපනයනවල වටිනාකම සාපේක්ෂ වශයෙන් ස්ථාවර හෝ ඉහළ යන බැවින් ගෝලීය භාණ්ඩ මිල ඉහළ යන අභියෝගයකට පහසුවෙන් මුහුණ දීමට පිළිවන.

- රජයේ අයවැය මත ධනාත්මක බලපෑම : වෙළෙඳ අනුපාතය යහපත් වූ විට අපනයන බදු සහ භාණ්ඩ මත තීරු බදු පනවා වැඩි ආදායමක් එකතු කර ගැනීම ආණ්ඩුවට හැකියාව ලැබේ. මෙම අතිරේක ආදායම අයවැය හිඟය අඩු කර ගැනීමට හෝ පොදු ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට හෝ යොදාගත හැකි ය.

- ආයෝජනය සහ සංවර්ධනය : වෙළෙඳ අනුපාතය යහපත් වූ විට විදේශ ආයෝජන ආකර්ශණීය වන අතර එය ආර්ථික සංවර්ධනයට දායක කර ගත හැකි ය. ආයෝජන සඳහා වඩාත් ආකර්ශණීය ගමනාන්තයක් ලෙස රට පිළිබඳ යහපත් අපේක්ෂාවන් විදේශ ආයෝජකයන් විසින් ඇති කර ගත හැකි ය.

- විවිධාංගීකරණයට අවස්ථාව උදා වීම : යහපත් වෙළෙඳ අනුපාතයක් හිමි කර ගත් විට ආර්ථිකය විවිධාංගීකරණය කිරීමට සහ පටු පරාසයක භාණ්ඩ අතලොස්සක් මත යැපීම අඩු කිරීමට අවස්ථාව තිබිය හැකි ය. මෙම විවිධාංගීකරණය කිරීම තුළ භාණ්ඩ මිල උච්චාවචනය

වන අවස්ථාවන්හි දී ආර්ථිකයට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි වේ.

- උද්ධමන පීඩන අඩු වීම : වෙළෙඳ අනුපාතය යහපත් වූ විට අපනයන ආදායම්වලට සාපේක්ෂව ආනයන භාණ්ඩ වල පිරිවැය අඩු වේ. ආනයන මිල අඩු වීම උද්ධමන පීඩන අඩු කර ගැනීමට බෙහෙවින් ඉවහල් වේ.

- ආර්ථික ස්ථායිතාව ශක්තිමත් වීම : යහපත් වෙළෙඳ අනුපාතයක් බාහිර අසමතුලිතතාව අඩු කිරීම, ව්‍යවහාර මුදලේ අගය ස්ථාවර කර ගැනීම සහ රටේ ආර්ථික අපේක්ෂා පිළිබඳ විශ්වාසය ගොඩනගා ගැනීම යන සාධක මස්සේ ආර්ථික ස්ථායිතාව ශක්තිමත් කරයි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)
(මුළු ලකුණු 03යි)

(v) රුපියල ක්ෂය වීමට බලපෑ හේතු :

- ගෙවුම් ශේෂ හිඟය : අඛණ්ඩ වෙළෙඳ හිඟය සහ ජංගම ගිණුමේ හිඟය නිසා වෙළෙඳ හිඟය පියවා ගැනීමට විදේශ මුදල් (විශේෂයෙන්ම එක්සත් ජනපද ඩොලරය) සඳහා සැලකිය යුතු ඉල්ලුමක් ඇති වීම. විදේශ විනිමය සඳහා ඉල්ලුම වැඩි වූ විට රුපියල ක්ෂය වීමට පාත්‍ර වේ.

- විදේශ ණය බර : යටිතල පහසුකම් ව්‍යාපෘති සහ රජයේ වියදම් සඳහා අරමුදල් සපයා ගැනීමට විදේශ ණය මත ශ්‍රී ලංකාව සැලකිය යුතු ලෙස රඳා සිටීම විදේශ ණය ඉහළ මට්ටමකට ගෙන ඒමට හේතු විය. මෙම ණය සේවා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් ඩොලර්වලට පරිවර්තනය කර ගැනීම සඳහා නිරන්තරව රුපියල් විශාල වශයෙන් පිටතට ගලායාමෙන් විදේශ විනිමය සඳහා ඉල්ලුම වැඩි වීම රුපියලේ ක්ෂයවීමට දැඩි දායකත්වයක් සැපයී ය.

- දේශපාලන හා ආර්ථික අවිනිශ්චිතතාව : දේශපාලන අස්ථාවරත්වය සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව ආයෝජකයින්ගේ විශ්වාසය කඩවීමට සහ ප්‍රාග්ධනය රටින් පිටතට ගලා යාමට බලපෑවේ ය. විදේශ ආයෝජකයන් තම ආයෝජන ඉවත් කොට පිටතට ගෙනයාමේ දී රුපියල් ඩොලර්වලට පරිවර්තනය කිරීම නිසා රුපියල මත දැඩි පීඩනයක් එල්ල විය.

- ගෝලීය ආර්ථික සාධක : භාණ්ඩ මිල වෙනස් වීම (උදා : ඛනිජ තෙල්, කිරිඟු පිටි), ජාත්‍යන්තර ප්‍රාග්ධන සංචලන, පොලී අනුපාත ඉහළ යාම, කෝවිඩ් 19 වසංගතය වැනි බාහිර කම්පන සහ ගෝලීය ආර්ථිකයේ කම්පනයන් විනිමය අනුපාතිකයේ ක්ෂයවීම කෙරෙහි විශාල බලපෑමක් කළේ ය. ගෝලීය සැපයුම් දාමයක් බිඳ වැටීම, වසංගත සමය තුළ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළෙඳාම පහත වැටීම වෙළෙඳ ශේෂයට සහ මුදලේ අගය පවත්වා ගැනීම කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේ ය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05යි)
(මුළු ලකුණු 05යි)

* [illegible]
* [illegible]
* කෝවිඩ් 19 වසංගතය
*

**09 වන ප්‍රශ්නය**

9. (i) බහුමාන-දරිද්‍රතා දර්ශකය දරිද්‍රතාවයේ පැතිකඩ තුනක් මත පදනම් වේ. මෙම පැතිකඩ තුන කවරේ ද? (ලකුණු 03යි)

(ii) ලෝක බැංකුව එක්සත් ජනපද ඩොලරයෙන් මැනෙන ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම පදනම් කර ගනිමින් රටවල් කාණ්ඩ හතරකට වර්ගීකරණය කරයි. එම කාණ්ඩ හතර කවරේ ද? (ලකුණු 04යි)

(iii) ආර්ථික වර්ධන ක්‍රියාවලියේ දී තාක්ෂණික ප්‍රගතියේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 04යි)

(iv) ව්‍යුහාත්මක සේවා වියුක්තිය සහ චක්‍රීය සේවා වියුක්තිය අතර වෙනස දක්වන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන ප්‍රධාන සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් පහක් සඳහන් කරන්න. (ලකුණු 05යි)

09. (i) බහුමාන දරිද්‍රතා දර්ශකයේ පැතිකඩ :

සෞඛ්‍ය මානය : මෙම සංරචකය ළමා මරණ (වයස අවුරුදු 5ට පෙර මිය යන දරුවන්ගේ ප්‍රතිශතය) සහ පෝෂණය (අඩු බර දරුවන්ගේ ප්‍රතිශතය) වැනි සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධ දර්ශක තක්සේරු කරයි.

අධ්‍යාපන මානය : අධ්‍යාපන මානයට අධ්‍යාපනයට ප්‍රවේශය සහ අත්කර ගැනීම සම්බන්ධ දර්ශක ඇතුළත් වේ. මෙම මානයේ ඇති පොදු දර්ශක අතරට පාසල් නොයන ළමුන්ගේ ප්‍රතිශතය, ප්‍රාථමික පාසල වැනි යම් අධ්‍යාපන මට්ටමක් සම්පූර්ණ කර නොමැති ළමුන්ගේ ප්‍රතිශතය ඇතුළත් වේ.

ජීවන මට්ටම පිළිබඳ මානය : මෙම මානය ජීවන තත්ත්වයන් සහ මූලික පහසුකම් සහ වත්කම් සඳහා ප්‍රවේශය තක්සේරු කරයි. එම දර්ශකවලට පිරිසිදු පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම්, ඉවුම් පිහුම්, ඉන්ධන, විදුලිය සහ නිවාසවල ගුණාත්මකභාවය සඳහා ප්‍රවේශය ඇතුළත් විය හැකි ය.

(එක් මානයකට ලකුණු 01 බැගින් ලකුණු 03යි)

(මුළු ලකුණු 03යි)

(ii) රටවල් වර්ගීකරණය

- අඩු ආදායම් රටවල්
- පහළ මැදි ආදායම් රටවල්
- ඉහළ මැදි ආදායම් රටවල්
- ඉහළ ආදායම් රටවල්

(එක් කාණ්ඩයකට 01 ලකුණු බැගින් කාණ්ඩ හතරට ලකුණු 04යි)

(මුළු ලකුණු 04යි)

(iii) තාක්ෂණික දියුණුව ආර්ථික වෘද්ධියට බලපාන ආකාරය :

- ඵලදායිතාව වැඩි වීම : තාක්ෂණික ප්‍රගතිය බොහෝ විට ආර්ථිකයේ විවිධ අංශවල ඵලදායිතාව වැඩි කිරීමට හේතුවේ. වැඩිදියුණු කළ යන්ත්‍ර සූත්‍ර හෝ වඩා කාර්යක්ෂම නිෂ්පාදන ශිල්ප ක්‍රම සමාන හෝ අඩු සම්පත් ප්‍රමාණයකින් වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමට ඉඩ ලබාදේ. මෙය අනිත් අතට ආර්ථික වර්ධනයට හේතුවනු ඇත.

- සම්පත් කාර්යක්ෂමතාව : තාක්ෂණික දියුණුව ආර්ථිකයකට නව සම්පත් වඩා කාර්යක්ෂමව භාවිත කිරීමට උපකාර කළ හැක. සීමාසහිත සම්පත් ප්‍රමාණයක් ඇති දියුණු වෙමින් පවත්නා

රටවලට මෙය විශේෂයෙන් වැදගත් වේ. උදාහරණයක් වශයෙන් කෘෂි කාර්මික ක්ෂේත්‍රයේ නව්‍යතා මගින් අතිරේක භූමිය හෝ ශ්‍රමය හෝ භාවිත නොකොට වැඩි අස්වැන්නක් ලබා ගත හැකි ය.

- තරගකාරිත්වය : නව තාක්ෂණය සඳහා ආයෝජනය කරන සහ භාවිත කරන රටවල් ගෝලීය වෙළෙඳපොළ තුළ වඩාත් තරගකාරී වීමට නැඹුරු වේ. තාක්ෂණික දියුණුව මගින් සමාගම්වලට අඩු මිලට උසස් තත්ත්වයේ නිෂ්පාදන බිහි කිරීමට හැකි වන අතර එමගින් දේශීය හා විදේශීය වශයෙන් වඩාත් තරගකාරී විය හැකි ය.

- ව්‍යුහාත්මක පරිවර්තනය : තාක්ෂණික ප්‍රගතිය මගින් ආර්ථිකයක් තුළ ව්‍යුහාත්මක පරිවර්තනයක් ඇති කළ හැකි ය. නව තාක්ෂණය මතු වන විට ආර්ථිකයක නිමැවුම් සංයුතියේ වෙනස්කම් සිදු වනු ඇත. උදාහරණයක් වශයෙන් රටක් වඩාත් දියුණු තාක්ෂණයන් අනුගමනය කරන විට එය කෘෂි කර්මාන්තයේ ආධිපත්‍යයේ සිට නිෂ්පාදන කර්මාන්ත හා සේවා අංශ වෙත සංක්‍රමණය විය හැකි අතර එය වේගවත් ආර්ථික වර්ධනයකට ද මඟ පාදයි.

- නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය : බොහෝ ආර්ථික සංවර්ධන න්‍යායන් ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නවෝත්පාදන සහ ව්‍යවසායකත්වයේ වැදගත්කම අවධාරණය කරයි. ව්‍යවසායකයන් සහ නවෝත්පාදකයින් නව නිෂ්පාදන, සේවා සහ ක්‍රියාවලීන් නිර්මාණය කිරීම සහ වාණිජකරණය කිරීම නිසා තාක්ෂණික ප්‍රගතිය බොහෝ විට මෙම ක්‍රියාකාරකම්වල හදවත ලෙස සැලකිය හැකි ය.

- මානව ප්‍රාග්ධන සංවර්ධනය : තාක්ෂණික ප්‍රගතිය සඳහා බොහෝ විට නිපුණ ශ්‍රම බලකායක් අවශ්‍ය වේ. මේ අනුව එය අධ්‍යාපනය සහ මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා ආයෝජනය දිරිමත් කරයි. අධ්‍යාපනයට සහ පුහුණුවට ප්‍රමුඛත්වය දෙන රටවල් දිගු කාලීන ආර්ථික සංවර්ධනයට මඟ විවර කෙරෙන නව තාක්ෂණයන් අනුගමනය කිරීමට සහ ඒවාට අනුගත වීමට වඩා හොඳින් ස්ථානගත වී ඇත.

- දැනුම ව්‍යාප්තිය (Diffusion of knowledge) : තාක්ෂණික ප්‍රගතිය මගින් ගෝලීය වශයෙන් දැනුම සහ අදහස් ව්‍යාප්ත කළ හැක. වෙළෙඳාම, විදේශ ආයෝජන සහ ජාත්‍යන්තර සහයෝගීතාව හරහා වෙනත් රටවල සිදුවන තාක්ෂණික දියුණුවෙන් අන් රටවලට ප්‍රතිලාභ ලබා ගත හැකි අතර එමගින් ඔවුන්ගේ ආර්ථික වර්ධනය වේගවත් කර ගත හැකි වේ.

- පාරිසරික තිරසාරත්වය : නූතන ආර්ථික සංවර්ධන න්‍යායන් පාරිසරික වශයෙන් තිරසාර තාක්ෂණයන්හි වැදගත්කම අවධාරණය කරයි. පුනර්ජනනීය බල ශක්තිය, පිසිදු ප්‍රවාහනය සහ තිරසාර කෘෂි කර්මාන්තය වැනි ක්ෂේත්‍රයන්හි තාක්ෂණික ප්‍රගතිය ඔස්සේ පාරිසරික හායනය අවම කරමින් ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කළ හැකි ය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04යි)

(මුළු ලකුණු 04යි)

(iv) - ව්‍යුහාත්මක විරැකියාව : ව්‍යුහාත්මක විරැකියාව පැන නගිනුයේ තාක්ෂණයේ වෙනස්කම්, පාරිභෝගික වරණයන්හි වෙනස්වීම්, කර්මාන්තවල ව්‍යුහයේ වෙනස්කම් වැනි ආර්ථිකයේ දිගු කාලීන විතැන්වීම් සහ අසමතුලිතතාවන් මගිනි. එය බොහෝ විට ශ්‍රම බලකායේ කුසලතා සහ සුදුසුකම් සහ සුදුසු රැකියාව අතර නොගැලපීම හා සම්බන්ධය. ව්‍යුහාත්මක

විරැකියාව දිගු කාලයක් පුරා පැවැතීමට නැඹුරු වන අතර ආර්ථික තත්ත්වයන්හි කෙටි කාලීන වෙනස්වීම් සාමාන්‍යයෙන් බලපාන්නේ නැත. ව්‍යුහාත්මක විරැකියාව නිදන්ගත ගැටලුවක් වන අතර සමස්ත ආර්ථිකය සෞඛ්‍ය සම්පන්න වූ විට පවා ඒවා පැවැතිය හැක.
(ලකුණු 02යි)

- චක්‍රීය සේවා වියුක්තිය : චක්‍රීය විරැකියාව ව්‍යාපාර චක්‍රයේ උච්චාවචන සමග සෘජුවම සම්බන්ධ වේ. එය සිදුවන්නේ ආර්ථිකයේ භාණ්ඩ හා සේවා සඳහා වූ සමස්ත ඉල්ලුම අඩු වන විට නිෂ්පාදනය අඩු කිරීමට සහ රැකියා දොට්ට දැමීම් (layoffs) වලට තුඩුදෙන ආර්ථික පසුබෑම්වලදී ය. එය සාමාන්‍යයෙන් තාවකාලික වන අතර ව්‍යාපාර චක්‍රය සමග සෘජුව බැඳී ඇත. ආර්ථිකය අවපාතයකට හෝ පසුබෑමකට යන විට එය වැඩි වන අතර ආර්ථික ප්‍රසාරණයේ දී එය අඩු වේ.
(ලකුණු 02යි)
(මුළු ලකුණු 04යි)

(v) සමාජ ආරක්ෂණ ජාල වැඩ සටහන් පහක් :

- රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා සමාජ ආරක්ෂණය :
  - රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප් ක්‍රමය
  - වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය
  - රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල
  - සේවක භාර අරමුදල
  - අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය

- විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා සමාජ ආරක්ෂණය :
  - සේවක අර්ථසාධක අරමුදල
  - සේවක භාර අරමුදල

- සමාජ ආධාර :
  - සමෘද්ධි/ අස්වැසුම වැඩසටහන
  - වැඩිහිටියන් සඳහා ආධාර
  - ආබාධිත පුද්ගලයන් සඳහා ආධාර
  - අඩු ආදායම්ලාභී වකුගඩු රෝගීන් සඳහා දීමනාව
  - අනාගත මව්වරුන් සඳහා පෝෂණ දීමනාව

- ළමුන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන්
  - නොමිලේ පාසැල් පෙළ පොත් ලබා දීම.
  - පාසැල් නිල ඇඳුම් රෙදි ලබා දීමේ වැඩ සටහන
  - පාසල් සඳහා උසස් අධ්‍යාපන වාර ප්‍රවේශ පත්‍ර
  - අඩු ආදායම්ලාභී පවුල් සඳහා ශිෂ්‍යත්ව වැඩ සටහන
  - 1 - 5 ශ්‍රේණිවල සිසුන් ආවරණය වන පරිදි තෝරාගත් පාසල් ළමුන් සඳහා දිවා ආහාරය ලබා දීම.
  - ත්‍රිපෝෂ ජාතික අතිරේක ආහාර වැඩ සටහන

- හදිසි සහන වැඩසටහන් (ගංවතුර / නායයෑම්)

(ඕනෑම එක් වැඩසටහනකට ලකුණු 01 බැගින් වැඩසටහන් පහකට ලකුණු 05යි)
(මුළු ලකුණු 05යි)

**10 වන ප්‍රශ්නය**

10. (i) (අ) 'ආහාර සුරක්ෂිතතාව' යන සංකල්පයෙන් අදහස් වනුයේ කුමක් ද? (ලකුණු 02යි)

(ආ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආහාර අනාරක්ෂිතභාවයට බලපා ඇති සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) මෑත කාලයේ ශ්‍රී ලංකාවෙන් තරුණ තරුණියන් සහ මධ්‍යම පාන්තික වෘත්තිකයන් විදේශ වෙත සංක්‍රමණය වීමේ ආර්ථික බලපෑම කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) 'චක්‍රීය ආර්ථිකය' පිළිබඳ සංකල්පය තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට සහ පාරිසරික බලපෑම් අඩු කිරීමට දායකවන්නේ කෙසේ ද? (ලකුණු 05යි)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වර්තමානයේ ඇතිකර ගෙන ඇති එකඟතාවන් යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් රාජ්‍ය ණයෙහි තිරසාරබව සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට පවරා ඇති ප්‍රධාන ප්‍රමාණාත්මක ඉලක්ක මොනවා ද? (ලකුණු 06යි)

10. (i)(අ)- ආහාර සුරක්ෂිතතාව යනු ක්‍රියාශීලි සහ නීරෝගී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ආහාර අවශ්‍යතා සහ ආහාර රුචිකත්ව සපුරා ලිය හැකි පරිදි, ප්‍රමාණවත්, සුරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර සඳහා සියලුම පුද්ගලයන්ට සෑම කල්හිම භෞතික, සමාජයීය සහ ආර්ථික වශයෙන් ප්‍රවේශවීමේ හැකියාවක් පැවැතීමයි.

- මෙම නිර්වචනය මගින් ආහාර සුරක්ෂිතතාවට අදාළ ප්‍රධාන පැතිකඩ හතරක් අවධාරණය කෙරේ.
  - ආහාරවල සුලබතාවය (Availability) : ජනගහනයේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා දේශීය නිෂ්පාදන සහ ආනයන ඔස්සේ ස්ථාවර සහ ප්‍රමාණවත් ආහාර සැපයුමක් තිබිය යුතු ය.
  - ආහාර සඳහා වූ ප්‍රවේශය (Access) : තමන්ට අවශ්‍ය ආහාර ලබා ගැනීම සඳහා මිනිසුනට ආර්ථික හා භෞතික හැකියාව තිබිය යුතු ය.
  - ආහාර උපයෝජනය (Utilization) : පරිභෝජනය කරනු ලබන ආහාර ආරක්ෂිත ඒවා විය යුතු ය. එසේම පෝෂණීය වශයෙන් ප්‍රමාණවත් විය යුතු ය.
  - ස්ථායිතාව (Stability) : ආහාර සඳහා ප්‍රවේශවීමේ හැකියාව කාලයත් සමඟ ස්ථාවර වීම අවශ්‍ය වේ. ඍතු විපර්යාස, චක්‍රීය හෝ අනපේක්ෂිත සිදුවීම් වැනි කම්පන අවස්ථාවල දී පවා අඛණ්ඩව ප්‍රමාණවත් පරිදි ආහාර සුලබතාවන් පවත්වා ගත යුතු ය.

(ලකුණු 02යි)

(ආ) ආහාර අනාරක්ෂිතතාවට බලපා ඇති කරුණු:

- ආර්ථික සාධක :
  - දරිද්‍රතාව : ශ්‍රී ලංකාවේ පවත්නා ඉහළ මට්ටමේ දරිද්‍රතාව නිසා මිනිසුන්ට පෝෂ්‍යදායී ආහාර සඳහා ඇති ප්‍රවේශය සීමා වී තිබේ. 2019 වසරේ සිට දරිද්‍රතාව 11.3% සිට 2020 දී 12.7%ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එම කාලය තුළ නව දුප්පතුන් 300,000කට අධික සංඛ්‍යාවක් එකතු විය. එය 2021 දී අඛණ්ඩව වැඩි වූ අතර පසුව 2021 සහ 2022 අතර 13.1% සිට 25% දක්වා දෙගුණයක් විය. මෙම වැඩි වීම නිසා 2022 දී මිලියන 12.5ක ජනතාවක් දරිද්‍රතාවයට එක්කර ඇත.
  - විරැකියාව : රැකියා අවස්ථා නොමැතිකමත් ඌන සේවා නියුක්තියත් නිසා ආදායම් අස්ථාවරත්වයක් ඇතිකොට ඇති අතර පවුල් ඒකක සඳහා ප්‍රමාණවත් ආහාර වේලක්වත් සපයා ගැනීම අපහසු වී තිබේ.

- ආහාර උද්ධමනය : 2021 වසරේ සිට ශ්‍රී ලංකාව බරපතල ආහාර අර්බුදයකට මුහුණ දී සිටී. පොහොර, සහල් සහ අනෙකුත් යෙදවුම්වල මිල ඉහළ යාම ඊට හේතුවයි. ආහාර මිල උද්ධමනය ආහාර අනාරක්ෂිතතාව බලපා ඇති ප්‍රධාන හේතුවයි. ඉහළම ආහාර මිල ඇති රටවල් 10 අතර ශ්‍රී ලංකාව 5 වැනි ස්ථානයේ සිටී. 2022 ඔක්තෝබර් මාසය වන විට කොළඹ ආහාර උද්ධමනය 90.9%ක් විය. සහල් වැනි ප්‍රධාන ආහාර ද්‍රව්‍ය පවා මිලියන සංඛ්‍යාත පවුල්වලට දැරිය නොහැකි තත්ත්වයට පත් විය.

- ආනයන සීමා කිරීම : දැඩි විදේශ විනිමය අර්බුදයකට මුහුණ දී සිටින ශ්‍රී ලංකාවෙහි රජය විසින් පනවා ඇති ආනයන පාලනයන් නිසා ඇතැම් ආහාර ද්‍රව්‍ය හිඟ වී ඇත. මෙය අත්‍යවශ්‍ය ආහාර මිල ඉහළ යාමට බලපා ඇත.

- දේශපාලන සහ ආයතනික සාධක :
  - ප්‍රතිපත්ති අස්ථාවරත්වය : කෘෂිකර්මාන්තය, වෙළෙඳාම සහ ආහාර බෙදාහැරීම සම්බන්ධ නොගැළපෙන ප්‍රතිපත්ති ආහාර අනාරක්ෂිත භාවයට සෘජුව බලපා ඇත. ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් ක්‍රියාත්මක කරන ලද අදූරදර්ශී ක්‍රියාමාර්ග මෙහිදී විශේෂයෙන් වැදගත් විය. 2021 මැයි මාසයේ දී රසායනික පොහොර සහ පළිබෝධ නාශක ආනයනය තහනම් කිරීමට ශ්‍රී ලංකා රජය ගත් තීරණය කෘෂි නිෂ්පාදනයේ තියුණු බිඳ වැටීමකට හේතු විය.

  - දූෂණය : සම්පත් සහ ආධාර බෙදා හැරීමේ දී දූෂිත ක්‍රියාමාර්ග කරන කොට ආහාර සුරක්ෂිත කිරීමේ වැඩ සටහන්වල කාර්යක්ෂමතාවට හානි කර විය.

  - ආහාර අපතේ යාම : කෘෂි නිෂ්පාදන විශාල වශයෙන් අපතේ යාමක් නිරන්තරවම වාර්තා වේ. ඉන්ධන හිඟයන්, බෙදා හැරීමේ ජාල අක්‍රිය වීම, ගබඩා පහසුකම් නොමැති වීම, දැඩි මිල උච්චාවචන වැනි හේතු නිසා ආහාර භෝග අපතේ යාම සිදු වේ.

- පාරිසරික සාධක :
  - දේශගුණික විපර්යාස : දේශගුණික රටා වෙනස් වීම කෘෂි කාර්මාන්තයට බලපෑම් කරනු ලබන අතර භෝග අස්වැන්න සහ ආහාර නිෂ්පාදනයට ඒවා අහිතකර අන්දමින් බලපායි. දේශගුණික විපර්යාස හේතුවෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු තර්ජනයකට මුහුණ දී සිටී. FAO සහ WFP ට අනුව ශ්‍රී ලංකාවේ අධික වර්ෂාපතනයෙන් පසුව ඇති වූ දැඩි නියඟය නිසා 900,000ක පමණ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවට තර්ජනයක් වෙමින් විශාල භෝග ප්‍රදේශයක් විනාශයට පත් විය.

  - ස්වාභාවික උපද්‍රව : නිතර නිතර සිදුවන ජලගැලීම් සහ නියඟ හේතු කොට කෘෂි අස්වැන්න විනාශ වීම ද ආහාර අනාරක්ෂිතතාවට බලපා ඇති ප්‍රධාන සාධකය වේ.

- ගෝලීය සාධක : 2020 මැද භාගයේ සිට ලොව පුරා ආහාර මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. කෝවිඩ් 19 වසංගතයත් පසුව සිදු වූ රුසියානු - යුක්‍රේන යුද්ධයත් ආහාර උද්ධමනය උග්‍ර කිරීමට බලපෑවේය. ආහාර ආනයනය කිරීමේ පිරිවැය ඉහළ ගියේ ය. එසේම බොරතෙල් මිල ඉහළ යාම ද පොහොර මිල ඉහළ යාමත් කෘෂි කාර්මික පිරිවැය ඉහළ නැංවීම ටත් කෘෂි භෝග මිල වැඩි වීමටත් හේතු විය.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03යි)

(මුළු ලකුණු 05යි)

(ii) - ධනාත්මක ආර්ථික බලපෑම් : (මුළු ලකුණු 05යි)

- ප්‍රේෂණ : විදේශ රටවල සේවය කරන ශ්‍රී ලාංකික වෘත්තිකයන් තම මවුරටට ප්‍රේෂණ එවනු ලැබේ. එම පවුල්වල සාමාජිකයන්ට සැලකිය යුතු ආදායම් මාර්ගයක් මේ මගින් ලැබෙන අතර ඒ නිසා ඔවුන්ගේ පරිභෝජන ශක්තියත් ජීවන තත්ත්වයත් උසස් කර ගත හැකි වේ.
- නිපුණතා හුවමාරුව : ඇතැම් වෘත්තිකයන් නව කුසලතා සහ අළුත් අත්දැකීම් සමුදායක් අත්කර ගත හැකි ය. ආපසු සිය රටට පැමිණි විට ඒවා අප රටේ සංවර්ධනයට යොදා ගැනීමට ඉඩ සැලසේ. මේ මගින් රටේ මානව ප්‍රාග්ධනය ශක්තිමත් වේ.
- විදේශ විනිමය ඉපැයීම : ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රේෂණ හරහා උපයන විදේශ විනිමය මගින් රටේ විදේශ විනිමය සංචිතය ශක්තිමත් කරගත හැකි වේ. එය විනිමය අනුපාතිකය ස්ථාවර කර ගැනීමටත් ආනයන ලබා ගැනීමටත් යොදා ගත හැකි ය.
- විරැකියාව අඩු වීම : ශ්‍රමිකයන් විදේශවලට සංක්‍රමණය වීම නිසා රට තුළ ඇති විරැකියා පීඩනය කිසියම් දුරකට සමනය කළ හැකි ය.
- ආයෝජනය කිරීම : ඇතැම් විදේශගත වෘත්තිකයන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර හෝ දේපළ වෙළෙඳාම් හෝ ක්ෂේත්‍රයන්හි ආයෝජනය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහ රැකියා උත්පාදනයට එමගින් උත්තේජනයක් ලැබේ.

අහිතකර ප්‍රතිවිපාක :

- බුද්ධිගලනය : මධ්‍යම පාංතික වෘත්තිකයන් විශාල වශයෙන් සංක්‍රමණය වීම නිසා රටේ උගත් සහ නිපුණතා පූර්ණ ශ්‍රම බලකාය අහිමිවීම ආර්ථිකයට විශාල හානියකි. මෙය ආර්ථික වර්ධනයට, පර්යේෂණ හා නවෝත්පාදනයන්ට අහිතකර ලෙස බලපෑ හැකි ය.
- ප්‍රේෂණ මත යැපීම : සංක්‍රමණිකයන් එවන ආදායම් මත දැඩි ලෙස රඳා පැවැතීමෙන් ආර්ථික අවදානමක් සිදු විය හැකි ය. ගෝලීය ආර්ථිකයේ සිදුවන උච්චාවචන හෝ ගමනාන්ත රටවල සංක්‍රමණ ප්‍රතිපත්තිවල වෙනස්වීම් මත ප්‍රේෂණ ගලායාම් අවධානමට ලක් විය හැකි ය.
- වියපත් ජනගහනය : බොහෝ විට මධ්‍යම පාන්තික වෘත්තිකයන් සංක්‍රමණය වන්නේ වියපත් ජනගහනය මෙරට ඉතිරි කරමිනි. මෙය සෞඛ්‍ය සේවා සහ සමාජ සේවා සඳහා දැඩි පීඩනයක් ඇති කළ හැකි ය. ඒ සඳහා රජයේ වියදම් වැඩි කිරීමට සිදු වනු ඇත.
- බදු ආදායම් අහිමි වීම : වෘත්තිකයන් රට හැර යන විට රජයට බදු අයභාරය අහිමි විය හැකි ය. මෙය රාජ්‍ය සේවා සහ යටිතල පහසුකම් පවත්වා ගෙන යාමට බාධාකාරී විය හැකි ය.

(එක් ආර්ථික බලපෑමකට ලකුණු 01 බැගින් ඕනෑම බලපෑම් හතරකට ලකුණු 04යි)
(මුළු ලකුණු 04යි)



WWW.PastPapers.WiKi
Download O/L, A/L, and Scholarship Past Papers for all subjects

(iii) 'චක්‍රීය ආර්ථිකය' සංකල්පය සහ තිරසාර සංවර්ධනය :

- සම්පත් නිස්සාරණය (Extraction), නිෂ්පාදනය, පරිභෝජනය සහ බැහැර කිරීම (disposal) ඇතුළත් සාම්ප්‍රදායික රේඛීය ආර්ථික ආකෘතිය නැවත සිතා බැලීමට යොමු කරමින් චක්‍රීය ආර්ථික ආකෘතිය තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීමටත් පාරිසරික බලපෑම් අඩු කිරීමටත් දායක වේ.

- චක්‍රීය ආර්ථික ආකෘතිය අරමුණු කරනුයේ නිෂ්පාදිත, ද්‍රව්‍ය සහ සම්පත් නැවත භාවිත කිරීම (reused), ප්‍රතිචක්‍රීයකරණය කිරීම (recycled) සහ ප්‍රතිනිර්මාණය (repurposed) කිරීමයි. එමගින් අපද්‍රව්‍ය සහ පාරිසරික හානි අවම කර ගත හැකි වේ. චක්‍රීය ආර්ථිකයක් තිරසාරත්වය ප්‍රවර්ධනය කරන සහ පාරිසරික බලපෑම අවම කරන ප්‍රධාන විධි කිපයක් ඇත.
  - සම්පත් කාර්යක්ෂමතාව : පවත්නා සම්පත් උපරිම වශයෙන් භාවිතයට ගැනීම, නව සම්පත් උකහා ගැනීමේ අවශ්‍යතාව අඩු කිරීම සහ සම්පත් ක්ෂයවීම (depletion) අවම කිරීම.
  - අපද්‍රව්‍ය අඩු කිරීම : දිගුකල් පැවැත්ම සහ නැවත භාවිත කිරීමේ හැකියාව සිත්හි තබාගෙන නිෂ්පාදිත සහ පද්ධති සැලසුම් කිරීම මගින් අපද්‍රව්‍ය ජනනය විශාල ලෙස අඩු වේ.
  - දිගු නිෂ්පාදන ආයු කාලය (Extended product life) : කල්පවතින, අළුත් වැඩියා කළ හැකි සහ වැඩි දියුණු කළ හැකි නිෂ්පාදිත නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් භාණ්ඩ වල ආයු කාලය දීර්ඝ කෙරේ.
  - කාබන් පිය සටහන් අඩු කිරීම (Reduced carbon footprint) : නිෂ්පාදනය හා ප්‍රවාහනයට අවශ්‍ය බලශක්ති සහ සම්පත් යෙදවුම් අඩු කිරීමෙන් හරිතාගාර වායු විමෝචනය අවම කරයි. ඛනිජ සහ පොසිල ඉන්ධන වැනි සීමිත සම්පත් ක්ෂය වී යාම මන්දගාමී කරයි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05යි.)
(මුළු ලකුණු 05යි)

(iv) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රමාණාත්මක ඉලක්ක :

- ණය ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය තිරසාරතා විශ්ලේෂණය මගින් පෙන්වා දුන් ඉලක්ක පහත දැක්වේ.
  - ණය තොගය : 2032 වසර වන විට රාජ්‍ය ණය තොගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 95%කට වඩා අඩු විය යුතු ය.
  - දළ මූල්‍යන අවශ්‍යතා (GFN) : 2027 - 2032 කාලය තුළ මධ්‍යම රජයේ වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සාමාන්‍ය දළ දේශීය නිෂ්පාදිතයෙන් 13%කට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.
  - විදේශ විනිමය ණය සේවාව : 2027 - 2032 දක්වා කාලය තුළ සෑම වසරකම මධ්‍යම රජයේ වාර්ෂික විදේශ මුදලින් ණය සේවාකරණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 4.5%කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීම.
  - මූල්‍යන පරතරයන් : විදේශ මූල්‍යන පරතරයන් පියවීම සඳහා ප්‍රමාණවත් වන පරිදි 2023 - 2027 කාල පරිච්ඡේදය තුළ ණය සේවාකරණය අඩු කිරීම, 2022 දී සමුච්චනය වූ හිඟ මුදල් ද ඇතුලුව ඩොලර් බිලියන 17ක ණය සේවාකරණ අඩු කිරීමක් අවශ්‍ය වේ.

(එක් ඉලක්කයකට ලකුණු 02 බැගින් ඉලක්ක තුනකට ලකුණු 06යි)
(මුළු ලකුණු 06යි)



PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Download O/L, A/L, and Scholarship Past Papers for all subjects